# වාර්ෂික වාර්තාව 2011

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස හා
පොදු පහසුකම් අමාත්‍යාංශය

අන්තර්ගතය | පිටුඅංක


අ. පොදු

අපගේ දර්ශනය, අපගේ මෙහෙවර, අපගේ පරමාර්ථ 02
සංස්ථාපිත තොරතුරු 03
අධ්‍යක්ෂ මණ්ඩලය 04
සංස්ථාපිත කළමණාකරණය 05
අපගේ ප්‍රධාන ක්‍රියාකාරකම් 06 - 07

ආ. සංස්ථාපිත පාලනය

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 08
විගණන හා කළමණාකරණ කමිටු 08
අභ්‍යන්තර පාලනය 08
විධායක කළමණාකරණය 08
අවදානම් කළමණාකරණය 09
පාරිසරික ගැටළු 10

ඇ. මෙහෙයුම් ක්‍රියාකාරකම් වාර්තාකරණය

නිවාස සංවර්ධනය 11 - 15
දේපළ කළමණාකරණ හා අලෙවිය 16 - 18
ඉංජිනේරු සේවා 19 - 20
මානව සම්පත් කළමණාකරණය 21 - 28
නීති 28
සංස්ථාපිත සැලසුම් සහ අධීක්ෂණය 29

ඈ මෙහෙයුම් ප්‍රතිඵල සමාලෝචනය

ණය අයකිරීම් ක්‍රියාකාරකම් 2011 - ග්‍රාමීය නිවාස 30 - 31
නාගරික නිවාස සාප්පු/ණය වාරික සහකුලීඅයකිරීම් 2011 ක්‍රියාකාරකම් 32
මුල්‍යමය සමාලෝචනය
තොරතුරු හා ප්‍රචාරණය 33 - 34
තොරතුරු තාක්ෂණය 35 - 36
ඕෂන්වීව් ඩිවලොප්මන්ට් සමාගම 37 - 38

ඉ මුල්‍යමය ප්‍රකාශන

ශේෂ පත්‍රය 39
ආදායම් සහ වියදම් වාර්තාව 40 - 41
ගිණුම් ප්‍රතිපත්ති 42 - 45
මුල්‍යමය ප්‍රකාශනවලට සටහන් 46 - 72

ඊ විගණකාධිපති වාර්තාව 73 - 81

අ

පොදු

## හැඳින්වීම

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය 1979 අංක 17 දරණ ජාතික නිවාස සංවර්ධන අධිකාරි පනත මඟින් ශ්‍රී ලංකාවේ නිවාස සංවර්ධන කටයුතු කරගෙනයාම සඳහා ස්ථාපිත කර ඇත.

මෙම අධිකාරිය එහි කොළඹ පිහිටි ප්‍රධාන කාර්යාලයට අමතරව දිස්ත්‍රික් කාර්යාල 26 ක් සහ නාගරික කාර්යාල 03 ක් මඟින් දිවයින පුරා කටයුතු කරගෙන යනු ලැබේ.

## අපගේ දර්ශනය

ශ්‍රී ලංකාවේ සෑම පවුලකටම මූලික පහසුකම් සහිත සුරක්ෂිත නිවසක් හිමිකර දීම.

## අපගේ මෙහෙවර

නිවාස සංවර්ධනය පිළිබඳ “ජනසෙවණ” මහින්ද චින්තන වැඩ පිළිවෙල අදාළ සියලු පාර්ශවයන්ගේ දායකත්වයෙන් සැලසුම්ගත පරිදි ක්‍රියාවට නැංවීම.

## අපගේ පරමාර්ථ

- අඩු ආදායම්ලාභී පවුල්වලට ණය / ආධාර ලබාදීම තුලින් නව නිවසක් ඉදිකරගැනීමට හා ප්‍රමිතියෙන් තොර වාසස්ථාන වැඩිදියුණු කරගැනීමට උපකාර කිරීම.
- මධ්‍යම ආදායම්ලාභීන් සඳහා දැරිය හැකි මිලකට පෞද්ගලික අංශය සමඟ හවුල්කාරිත්වය තුළින් නිවාස සැපයීම.
- නාගරික නිවාස ක්‍රම නවීකරණ සහ පුනස්ථාපන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- මුළු දිවයිනම ආවරණය වන පරිදි අඩු ආදායම්ලාභීන්හට නිවාස ඉදිකිරීම් සඳහා උපදේශන සේවාලබාදීම.
- නිවාස හා සම්බන්ධිත යටිතල පහසුකම් සංවර්ධන කටයුතුවලදී බාහිර ආයතනවලට අවශ්‍ය උපදේශන සේවා සැපයීම.
- පිරිමැසුම්දායක ඉදිකිරීම් තාක්ෂණය ව්‍යාප්ත කිරීම සහ රැකියා ආශ්‍රිත පුහුණුවීම් මඟින් පුහුණු ශ්‍රමිකයන් බිහිකිරීම.
- පදිංචිකරුවන්ගේ දේපල අයිතිය තහවුරු කිරීම.
- නිවාස සංවර්ධනයට සම්බන්ධ සියළුම අංශවල කටයුතු ක්‍රියාත්මක කිරීම,වැඩි දියුණු කිරීම සහ සම්බන්ධිකරණය කිරීම.
- ඉහත අරමුණු යම් ප්‍රමාණයක් හෝ සියල්ලම සපුරා ගැනීමට අවශ්‍ය අයුරින් හා සුදුසු පරිදි කටයුතු කිරීම.

# සංස්ථාපිත තොරතුරු

| | | |
|---|---|---|
| නම | : | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය |
| නෛතික භාවය | : | 1979 අංක 17 දරණ පණත |
| සංස්ථාපිත වර්ෂය | : | 1979 |
| ලියාපදිංචි කාර්යාලය | : | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය<br>මහ ලේකම් කාර්යාලය<br>නො. 34, සර් චිත්තම්පලම්,<br>ඒ ගාඩිනර් මාවත, කොළඹ 02 |
| දුරකථන අංක | : | 2421606, 2431707, 2430410, 2431722<br>2421748, 2380874 |
| ෆැක්ස් | : | 011-2434892 |
| විද්‍යුත් තැපැල | : | gm@nhda.lk,<br>dgmf@nhda.lk,<br>facc@nhda.lk |
| වෙබ් අඩවිය | : | www.nhda.lk |
| විගණකවරු | : | විගණකාධිපති<br>විගණකාධිපති දෙපාර්තමේන්තුව |
| උපදේශන නීතිඥවරු | : | නීතිපති<br>නීතිපති දෙපාර්තමේන්තුව<br>හල්ස්ඩෝෆ්, කොළඹ 12 |
| බැංකුකරුවෝ | : | ලංකා බැංකුව<br>ආයතනික ශාඛාව,<br>ඇචිලන් චතුරශ්‍රය,<br>කොළඹ 01<br><br>මහජන බැංකුව<br>මුලස්ථාන ශාඛාව,<br>සර් චිත්තම්පලම්,<br>ඒ ගාඩිනර් මාවත,<br>කොළඹ 02 |

# අධ්‍යක්ෂ මණ්ඩලය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය අධ්‍යක්ෂ මණ්ඩලය අමාත්‍යතුමා විසින් පත්කරන ලද සාමාජිකයන් 6 දෙනෙකුගෙන් සහ මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙක් ලෙස තවත් සාමාජිකයෙක්ගෙන් සමන්විත වන අතර පත් කරනු ලැබූ සාමාජිකයන්ගෙන් එක් අයෙක් සභාපති ලෙස අමාත්‍යතුමා විසින් පත්කරනු ලැබේ.

| නම හා ලිපිනය | තනතුර | සේවා ස්ථානය |
|---|---|---|
| 1. එස්. ඒ. ජයන්ත සමරවීර මහතා<br>මාවල දකුණ<br>වාද්දුව | සභාපති | ජාතික නිවාස<br>සංවර්ධන<br>අධිකාරිය |
| 2. ඒ. ඩබ්. දයානන්ද මහතා<br>නො.639/3/ඒ,<br>ගුණවර්ධන මාවත,<br>බංගලාව හන්දිය,<br>පිටකෝට්ටේ,<br>කෝට්ටේ | උප සභාපති | ජාතික නිවාස<br>සංවර්ධන<br>අධිකාරිය |
| 3. පද්ම උදයශාන්ත<br>ගුණසේකර මහතා<br>ධර්මෝදය මාවත<br>පොතුවිල්පාර<br>මොණරාගල | ක්‍රියාකාරි අධ්‍යක්ෂ | ජාතික නිවාස<br>සංවර්ධන<br>අධිකාරිය |
| 4. චාන්දනී විජේවර්ධන<br>මහත්මිය<br>නො.13 ඒ, ජනප්‍රිය මාවත<br>බොරුපන පාර<br>රත්මලාන | සාමාජික | රාජ්‍ය මූල්‍ය<br>ප්‍රතිපත්ති<br>දෙපාර්මේන්තුව<br>මහා භාණ්ඩාගාරය |
| 5. වෛද්‍ය වසන්ත බණ්ඩාර මහතා<br>අංක 2/270, කොළඹ පාර<br>කුරුණෑගල | සාමාජික | ඉදිකිරීම්, ඉංජිනේරු<br>සේවා, නිවාස හා<br>පොදු පහසුකම්<br>අමාත්‍යාංශය |
| 6. නීතිඥ රාජා ගුණරත්න මහතා<br>නො.150/05<br>හයිලෙවල් පාර<br>මහරගම | සාමාජික | නීතිඥ / බාහිර<br>කථිකාචාර්ය<br>විවෘත විශ්වවිද්‍යාලය |
| 7. චන්දන සේසත් ජයකොඩි මහතා<br>නො.33, යටාලතිස්ස මාවත,<br>කැළණිය | සාමාජික | මහජන<br>සම්බන්ධීකරණ<br>ලේකම් ඉදිකිරීම්,<br>ඉංජිනේරු සේවා,<br>නිවාස හා පොදු<br>පහසුකම්<br>අමාත්‍යාංශය |

**එල් එස් පලන්සූරිය මහතා**
සාමාන්‍යාධිකාරී
(2011.07.26 දින දක්වා)

**මේජර් ජනරාල් ඩබ් ආර් වසන්ත කුමාර යූ එස් පී මහතා**
සාමාන්‍යාධිකාරී
(2011.07.27 සිට 2011.11.04 දක්වා)

**බ්‍රිගේඩියර් ඒ එල් එස් කේ පෙරේරා ආර් එස් පී මහතා**
සාමාන්‍යාධිකාරී
(2011.11.14 සිට 2012.05.14 දක්වා)

**ඩී එන් විජේසිංහ මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් කළමණාකරණ)
(2011.10.31 දින දක්වා)

**ආර් එම් එල් පී එදිරිසිංහ මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත් කළමණාකරණ)
(2011.11.01 දින සිට)

**ගාමිණී පන්නිලවිතාන මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (නිවාස සංවර්ධන)

**කේ ඩබ් ඒ ධර්ම ශ්‍රී කාරියවසම් මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (තොරතුරු හා ප්‍රචාරක)

**එම් එස් වීරසිංහ මහත්මිය**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ඉංජිනේරු සේවා හා ඉදිකිරීම්)

**ඊ ඒ ඩී එස් එදිරිසිංහ මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්)

**ඩබ් ඒ ඩී සරත් කුමාර මහතා**
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (දේපල කළමණාකරණ හා අලෙවි)

**ඩබ් ධනචන්ද්‍ර මහතා**
සහකාර සාමාන්‍යාධිකාරී (සංස්ථාපිත සැලසුම්)

**ඒ කේ පුෂ්පා රෝහිණී මහත්මිය**
සහකාර සාමාන්‍යාධිකාරී (නීති)

**පී එම් ආර් මාරසිංහ මහතා**
ප්‍රධාන අභ්‍යන්තර විගණක

**මනුජ කරුණාරත්න මහතා**
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

## සංස්ථාපිත කළමණාකරණය

# අපගේ ප්‍රධාන ක්‍රියාකාරකම්

අපගේ අරමුණු ඉටුකරගැනීම සඳහා මෙම ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කරනු ලැබේ.

1. **නිවාස සහාය සේවා සැපයීම**
   නිවාස යෝග්‍යතා අධ්‍යයනය කිරීම
   ප්‍රජාව දැනුවත් කිරීම සහ සංවිධානය කිරීම
   ප්‍රජා සංවර්ධන සංවිධාන නිර්මාණය කිරීම.
   නිවාස / පදිංචි කිරීමේ සැලසුම් පිළියෙල කිරීම.
   අඩු පිරිවැය ඉදිකිරීම් තාක්ෂණ ක්‍රමයන් ගැන
   තොරතුරු ව්‍යාප්ත කිරීම.
   අවශ්‍යතාවය මත මූල්‍යමය සහාය සැපයීම.
   ඉදිකිරීම්වල තත්වය / අනුකූලතාවය සහතික කිරීම
   සඳහා අධීක්ෂණය කිරීම.
   යටිතල පහසුකම් ඇතිකිරීම / සම්බන්ධතාවය පැවැත්වීම.

2. **ඉඩම් කට්ටි ලබාදීම**
   යෝග්‍ය භූමි හඳුනා ගැනීම.
   යෝග්‍යතා අධ්‍යයනය කිරීම.
   කැබලි සැලසුම් පිලියෙල කිරීම
   අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම.
   ඉඩම්ලාභීන් හඳුනාගැනීම සහ තෝරා ගැනීම.
   අවශ්‍යවේ නම් ණය දෙන ආයතන සමඟ
   සම්බන්ධතාවය ඇතිකරගැනීම.
   තෝරාගත් ඉඩම්ලාභීන්ට ඉඩම් කට්ටි පැවරීම.

3. **නාගරික සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීම**
   යෝග්‍ය ස්ථාන හඳුනා ගැනීම.
   මැනුම් කටයුතු සිදුකිරීම.
   මූල්‍යමය හැකියා මට්ටම් තීරණය කිරීම.
   සැලසුම් පිළියෙල කිරීම සහ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම.
   කළමණාකරණ සංස්ථා ස්ථාපිත කිරීම.
   අයිතිය පැවරීම

4. **රාජ්‍ය අංශයේ හා පෞද්ගලික අංශය හවුල්ව නිවාස ඉදිකිරීම වර්ධනය කිරීම**
   යෝග්‍ය භූමි හඳුනා ගැනීම.
   කැමති පාර්ශවයන් කැඳවීම.
   සුදුසු සංවර්ධකයින් සමඟ සාකච්ඡා කිරීම සහ යෝජනා ලබා ගැනීම.
   යෝජනා ඇගයීම සහ සංවර්ධකයින් තෝරා ගැනීම.
   ව්‍යාපෘති සැලසුම් නිර්මාණය කිරීම.
   අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම.
   ඒකාබද්ධ සමාගම් ඇතිකිරීම.
   ක්‍රියාත්මක කිරීම, පාලනය කිරීම සහ තත්වය සහතික කිරීම.
   වෙළඳපල සහ නිවාස විකුණුම්
   කළමණාකරණ සංස්ථා ස්ථාපිත කිරීම.

5. **නිවාස සම්බන්ධ උපදේශන සේවා**
   දිස්ත්‍රික් නිවාස උපදේශන මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම.
   යෝග්‍යතා වාර්තා සකස්කිරීම.
   අවශ්‍ය අවස්ථාවේ දී සැලසුම් සැපයීම.
   ප්‍රමාණ/ද්‍රව්‍ය ලැයිස්තු/පිරිවැය ඇස්තමේන්තු පිළියෙළ කිරීම.
   සැලසුම් සඳහා අනුමැතියක් ලබාගැනීම.
   ඉදිකිරීම් අධීක්ෂණය සහ තත්ව සහතිකවීම.
   ඉදිකිරීම් දත්ත බැංකුවක් පවත්වාගෙන යාම.

6. **අඩුපිරිවැය ඉදිකිරීම් තාක්ෂණික ක්‍රම ප්‍රචලිත කිරීම**

අදාල පෞද්ගලික හා රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධතාව පැවැත්වීම සහ තොරතුරු ද්‍රව්‍ය සාම්පල ආදිය රැස්කිරීම.
උපදේශක මධ්‍යස්ථාන මගින් නව තාක්ෂණික ක්‍රම හා ද්‍රව්‍ය හඳුන්වාදීම.

7. **නිවාස ක්‍රමවල පොදු ප්‍රදේශ, එහි යටිතල පහසුකම් සහ සේවාවන් සහිතව පලාත් අධිකාරියට පැවරීම.**

පොදු ප්‍රදේශ / විවෘත ස්ථානවල මායිම් සලකුණු කිරීම.
මිනින්දෝරු සැලැස්මවල් පිළියෙල කිරීම.
පලාත් අධිකාරියෙන් එකඟතාවය ලබාගැනීම.
ඔප්පුවක් මගින් දේපල පැවරීම.
නිවාස හිමියන්ට දැනුම්දීම.

8. **කුසලතා වර්ධනය සඳහා පුහුණුව**

වෘත්තීය ආයතන සහ නියෝජායතන සමඟ සාකච්ඡා කර පුහුණු සැසි සංවිධානය කිරීම.
වෘත්තීය පුහුණු අවස්ථා සැකසීම.
මූලික උපකරණ සහාය සැපයීම.
ක්‍රියාකාරීත්වය පරීක්ෂා කිරීම.
වාසිදායි රැකියා සඳහා උපකාරවීමට දත්ත බැංකුවක් තුල පවත්වාගෙන යාම.
කුසලතා ඇති පුද්ගලයන්ගේ තොරතුරු නාමාවලියක් පවත්වාගෙන යාම.

9. **නිවාස තොග සම්බන්ධව දත්ත පවත්වාගෙනයාම**

ග්‍රාම නිලධාරීන් සහ ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ සම්බන්ධිකරණය සහ දත්ත රැස් කිරීම.
ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ උපදේශන මධ්‍යස්ථාන සමඟ සම්බන්ධීකරණය සහ_දත්ත ඒකරාශි කිරීම.
පලාත් අධිකාරි සමඟ සම්බන්ධීකරණය සහ දත්ත රැස්කිරීම.
දිස්ත්‍රික් නිවාස කමිටුව වෙත දත්ත ඉදිරිපත් කිරීම.
කමිටුව බාරගත් දත්ත පෙල ගැස්වීම.
දත්ත, අර්ධ වාර්ෂිකව දත්ත බැංකුව වෙත ඉදිරිපත් කිරීම.
අනාගත සැලසුම් සඳහා දත්ත භාවිතයට ගැනීම.

සංස්ථාපිත පාලනය

ආයතනික පාලනයේ උසස් මට්ටම දක්වා ගමන් කිරීම සඳහා දැඩි නොනවතින කැපවීමක් අප සතුව ඇත. ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරී ආයතනය, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය ආදි ආයතන මගින් යෝජනා කරන ලද සුදුසුම කටයුතු අනුගමනය කිරීමට සැමවිට උත්සාහ කරන අතර අපව වර්ගීකරණයට ලක්කර ඇති අප අමාත්‍යාංශය මගින් ලබාදෙන ලද නිර්ණායකයන් ට අනුකූලව කටයුතු කරයි.

### අධ්‍යක්ෂක මණ්ඩලයේ රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩලය සෑම මාසයකම රැස්වේ. අයවැයට සාපේක්ෂව ප්‍රගතිය සෑම මසකම එමගින් සමාලෝචනය කරයි. විචලනයන් හඳුනාගෙන ප්‍රතිපත්ති වෙනස් කිරීම සඳහා සුදුසු ප්‍රතිකර්ම යොදයි. වසරතුළ රැස්වීම් වාර 25 ක් පවත්වන ලදී.

### විගණන සහ කළමණාකරණ කමිටුව

සාමාන්‍යාධිකාරිවරයා සහ විධායක නොවන අධ්‍යක්ෂවරු 4 දෙනෙකුගෙන් විගණන සහ කළමණාකරණ කමිටුව සමන්විතවේ.

2011 වර්ෂයේ පහත නම් සඳහන් නිලධාරීන් විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයන් ලෙස සේවය කලහ.

1. චාන්දනී විජේවර්ධන මහත්මිය - **සභාපති**
2. ඒ. ඩබ්. දයානන්ද මහතා - **සාමාජික**
3. නීතිඥ රාජා ගුණරත්න මහතා - **සාමාජික**
4. කේ පී ගුණදාස මහතා - **සාමාජික**
5 ඊ කේ කේ එස් එදිරිසිංහ මහතා - **සාමාජික**

විගණන සහ කළමණාකරණ කමිටුව මගින් ගිණුම් හා මූල්‍ය කළමණාකරණ ක්‍රමයේ මනා පැවැත්ම සහතික කෙරෙන අතර ගිණුම් ප්‍රමිතීන්ට අදාල නීති රීති අනුව අභ්‍යන්තර පාලනයේ ක්‍රියාකාරිත්වය සමාලෝචනය කෙරේ.

2011 වසර තුළ විගණන සහ කළමණාකරණ කමිටු රැස්වීම් වාර 9 ක් පවත්වා ඇත.

### අභ්‍යන්තර පාලනය

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය තම ආයතනයේ වත්කම්වල සුරක්ෂිතභාවය සහ උපරිම භාවිතය සහතික කිරීම සඳහා අභ්‍යන්තර පාලන ප්‍රතිපත්ති සහ උපදේශනයන් කිහිපයක් ක්‍රියාත්මක කර ඇත. එමෙන්ම ක්‍රමෝපායන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය සතු වගකීමකි

ඒ හා සමානව අධ්‍යක්ෂක මණ්ඩලය මනාව සැකසුණු මාසික වාර්තා කරන ක්‍රමයක් තුලින් අභ්‍යන්තර පාලනය සහතික කරන අතර වත්කම් හා බැරකම් අතර සමබරතාවය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය තීරණ ගනු ලැබේ. මිල කමිටු හා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු පත් කිරීම සඳහා ද පියවර ගෙන ඇත.

### විධායක කළමණාකරණය

ප්‍රධාන කාර්යාලයේ සෑම අංශයකම ප්‍රධානත්වය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයකු දරණ අතර, නගර කාර්යාල 03 ක් සමඟ ඇති දිස්ත්‍රික් කාර්යාල 26 ක වගකීම ජ්‍යෙෂ්ඨ දිස්ත්‍රික් කළමනාකරු/දිස්ත්‍රික් කළමනාකරු සතුවේ. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරීන් සහ ජ්‍යෙෂ්ඨ දිස්ත්‍රික් කළමනාකරුවන්/දිස්ත්‍රික් කළමනාකරුවන් සාමාන්‍යාධිකාරී වෙත වාර්තා කළ යුතු අතර, ප්‍රධාන විධායක නිලධාරිවන සාමාන්‍යාධිකාරී විසින් සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළ යුතුය.

## අවදානම් කළමණාකරණය

විශාල සේවාදායකයන් සමූහයකට සියලුම පහසුකම් සහිත නිවාස පහසුකම් සපයන සහ දිවයින පුරා ව්‍යාප්ත වූ ප්‍රාදේශීය කාර්යාල 26 කින් සමන්විත ශ්‍රී ලංකාවේ එකම රාජ්‍ය ආයතනය වන ජාතික නිවාස සංවර්ධන අධිකාරිය එහි විවිධ හවුල්කාරයින්ගේ අවශ්‍යතා රැක ගැනීම සඳහා මුල්‍යමය සහ මුල්‍යමය නොවන අවදානම් රාශියකට මුහුණ දීමට සිදුවන අතර, එය පූර්ව කළමනාකරණය කරනු ලැබේ.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය තුළ අවදානම් කළමනාකරණය ආරම්භ වනුයේ අධ්‍යක්ෂ මණ්ඩලය තුලිනි. එය විවිධාකාර ක්‍රියාදාමයක් වන අතර හවුල්කාරයින්ගේ අවශ්‍යතාවයන් හා පවතින ආර්ථික සහ ව්‍යාපාර තත්වයන් මත එය ක්‍රමවත්ව සමාලෝචනය කරනු ලැබේ. ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙහි සියළුම ව්‍යාපාරික අරමුණු ලඟාකර ගැනීමට, එහි සංස්ථාපිත කළමණාකාරිත්වය උපදෙස් මත ප්‍රතිපත්තීන්, ක්‍රියාමාර්ග සහ අවදානම් කළමනාකරණය තහවුරු කිරීම සඳහා අවශ්‍ය ව්‍යුවහයන් ගොඩනැගීම අධ්‍යක්ෂ මණ්ඩලය මගින් සිදු කරයි. එමගින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියෙහි සියළුම ව්‍යාපාරික අරමුණු ලඟාකර ගැනීම සිදුකරනු ලැබේ.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ආපදාවට ලක්වීම කෙරෙහි බලපාන ක්‍රියාදාමයන් සහ පාලනය කළහැකි පද්ධතීන්වල දුර්වලතා හඳුනාගැනීම සඳහා අවදානම් කළමණාකරණය ක්‍රියාදාමය අධිකාරියේ විගණන අංශය සමඟ සම්බන්ධ වී කටයුතු කරයි. කාර්යක්ෂමතාවය සහ පාලනමය තත්ත්වයේ ප්‍රමාණාත්මතාවය පිළිබඳව ස්වාධීන අදහස් කාලානුරූපීව කළමනාකරණය වෙත පළකිරීම විගණන අංශය මගින් සිදුකරනු ලැබේ.

## ද්‍රවශීලී අවදානම

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ගිවිසුම් සඳහා වූ බැඳීම් නියමිත කාලය තුළ දී ඉටුකිරීමට නොහැකිවූවිට මෙම අවදානමට ගොදුරුවේ. ඒවාහි කාලය ඉකුත් අවස්ථාවලදී මුල්‍යමය වගකීම් ඉෂ්ට කිරීම සඳහා අරමුදල් තිබීම සහ අවශ්‍යතා පැනනැගුණ අවස්ථාවල දී ඒවායෙහි ප්‍රයෝජන ලබාගැනීම සඳහා අවශ්‍ය මුල්‍යමය ප්‍රතිපාදන තිබෙන බව තහවුරු කිරීම මෙහි ඇතුලත් වේ.

සැලසුම්කරණය සඳහා මගපෙන්වීම, ක්‍රමවත් අවශ්‍යතාවන්ට අනුව කටයුතු කිරීම් ගිවිසුම් බැඳීම් සහ වර්ධන අපේක්ෂාවන් සඳහා මුහුණදීමට අවශ්‍ය ප්‍රමාණවත් ද්‍රවශීලී බවක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතුවන බව තහවුරු කිරීම ආදී ප්‍රධාන කරුණු අධ්‍යක්ෂක මණ්ඩලයට සහ සංස්ථාපිත කළමනාකරණයේ සාමාජිකයන් වෙත කළමනාකරණය සඳහා පවරා දී ඇත.

ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය එය සතු ප්‍රධාන අරමුණු ලඟාකර ගැනීම සඳහා,

- මුදල් ඉපයීම සම්බන්ධ විකල්ප මාර්ග ප්‍රමාණවත් ලෙස තහවුරු කිරීම.
- පවත්නා ණය ආයෝජන සහ මුදල් ඉපයීමේ ක්‍රියාමාර්ග කාලානුරූපී ව නැවත සලකා බැලීම.
- පවතින මිළ ගණන් සමාලෝචනයට ලක් කරන අතරම, තරඟකරුවන්ගේ මිළ ගණන් විශ්ලේෂණයක් සිදු කිරීම.
- සංස්ථාපිත නිර්ණායකයන්ට අනුකූලව ද්‍රවශීලි අනුපාත සඳහා මඟ පෙන්වීම.

ප්‍රධානයන්, අභ්‍යන්තර උපයන අරමුදල් හා මුදල් බවට පත්කළ හැකි කෙටිකාලීන ආයෝජන පාලනය කිරීම තුළින් ද්‍රවශීලිතාවය පවත්වාගෙන යාම දෛනිකව කරනු ලැබේ.

## වෙළෙඳපොළ අවදානම

මිළ සංවේදී වත්කම් හා බැරකම් පවත්වාගෙන යෑමේ දී පැනනගින පාඩුවන් හා සම්බන්ධව මෙම අවදානම ප්‍රධාන වශයෙන් පොලී අනුපාතයන්ගේ වෙනස්වීම සහ කාලයත් සමඟ ගොඩනැගිලි ද්‍රව්‍යවල මිළ දෝලනය වීම හේතුවෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත මෙය බලපානු ලැබේ.

නිවසක් අවශ්‍ය සෑම පුද්ගලයෙකුටම නිවසක් සතු කිරීමට රජය මගින් ලබා දෙන මුදල ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වෙළෙඳ පොල අවදානමට මුහුණදීමට ජාතික නිවාස සංවර්ධන අධිකාරියට සිදුවේ.

සංස්ථාපිත කළමණාකරණ අරමුණු ලඟාකර ගැනීමට දායකව කටයුතු කරන අනෙකුත් ප්‍රධාන හවුල්කාර ආයතනයන්ගේ අවශ්‍යතාවයන් සහ සේවාදායකයන්ගේ මුදලට සරිලන සේවාවක් සඳහා වටිනාකමක් සපයා දෙමින් නිවාස වෙළෙඳ පොළට එල්ල වී ඇති තර්ජනයන් උපරිමයෙන් පාලනය කරගැනීම සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් විසින් සිදු කරනු ලැබේ.

## මෙහෙයුම් අවදානම

බාහිර තරඟකාරී බලවේගයන්ට මුහුණදීමට අපහසු හෝ ක්‍රියාකාරකම්වලට බාධාවන් පමුණුවන අභ්‍යන්තර දුර්වලතා නිසා ප්‍රමාණවත් නොවන හෝ අභ්‍යන්තර ක්‍රියාදාමයන්ගේ ප්‍රතිඵලයක් ලෙස මෙම අවදානම් ඇතිවේ.

සංවිධානය තුළ යහපත් සහ මනා ලෙස පාලනය කරන ලද ක්‍රියාකාරි පරිසරයක් ලබාදීම සඳහා සැකසුණු ව්‍යුහයන් සහ පුළුල් ප්‍රතිපත්තීන් සහිත පද්ධතියක් අවදානම් පාලනය සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පවත්වාගෙන යනු ලැබේ.

ඵලදායී ක්‍රියාකාරි අවදානම් කලමනාකරණය සඳහා විශේෂ පියවර කීපයක් ගෙන ඇත.

- තොරතුරුවල සුරක්ෂිතභාවය ආරක්ෂාකරමින් සියළුම දිස්ත්‍රික් කාර්යාලවලින් ලබාගත් කාලානුරූප දත්ත එකතුවන් වාර්තාකරණය සහ පිළියෙල කිරීම.
- තොරතුරු ආරක්ෂාකිරීමේ ප්‍රතිපත්තීන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන්
- නිවාස වැඩසටහන් නිරතුරුවම සමාලෝචනය සහ වැඩිදියුණු කිරීම.
- ණය නැවත අයකිරීමේ වැඩ සටහන්වල ක්‍රියාකාරිත්වය

මෙහෙයුම් අවදානම පාලනය කිරීම මධ්‍යම කලමණාකරණයේ ප්‍රධානම වගකීම වේ. පාලිත පරිසරයන්හි  අන්‍යභාවය පවත්වාගැනීම සඳහා මුදල්, විගණන හා අනිකුත් සහායක සේවා අංශ මගින් මහඟු කාර්යයක් ඉටුකරයි.

වටිනා දේපල ප්‍රමාණයක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතුව ඇති හෙයින් යෝග්‍ය උපක්‍රම භාවිතා කිරීම සහ නිරන්තර සමාලෝචනය සහ කාර්යය මණ්ඩලයේ කැපවීම මගින් තරඟකාරී පරිසරයතුල දී සාර්ථකත්වය ලඟාකර ගැනීම අපේක්ෂා කළ හැකිය.

## පාරිසරික ගැටලු

ගොඩනැගිලි ඉදිකිරීම පරිසර පද්ධතිය කෙරෙහි කිහිප ආකාරයකින් බලපානු ලැබේ. මෙම බලපෑම සහාධිපත්‍ය ගොඩනැගිලි සහ නිවාස ක්‍රමවල වඩාත් පැහැදිලිව දක්නට ලැබේ. පරිසර සංරක්ෂණ සංවර්ධන ක්‍රියාදාමයේ වැදගත් අංගයක් ලෙස විදහා දැක්විය හැක.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ජනතාවට සුරක්ෂිත සහ යහපත් පරිසරයක් සපයා දෙනු ලැබේ. ඒ අතරම පානීය ජලය, ප්‍රමාණවත් පිවිසුම් මාර්ග, අඛණ්ඩ විදුලි සැපයුම, වැසි ජලය සහ අපවිත්‍ර ජලය බැහැර කිරීමේ පද්ධති, ඝන අපද්‍රව්‍ය බැහැරකිරීම වැනි යටිතල පහසුකම් ද සපයනු ලැබේ

සහාධිපත්‍ය කළමණාකරණ අධිකාරියේ නීතිරීති මගින් සහාධිපත්‍ය දේපලවල පදිංචිකරුවන්ට  වඩා යහපත් පරිසරයක් සහතික කෙරේ.

## නිවාස සංවර්ධනය

මහින්ද චින්තන ඉදිරි දැක්මට අනුකූලව ජනසෙවන නිවාස දස ලක්ෂයේ නිවාස හා ජනාවාස සංවර්ධන මෙහෙයුම යටතේ දිවයිනේ විවිධ ප්‍රදේශ වල ජීවත් වන නිවාස ගැටළුවට මුහුණපා සිටින දරු පවුල් වෙනුවෙන් නිවාස පහසුකම් සපයාදීමේ අරමුණ ඇතිව 2011 වසර තුලදී ක්‍රියාවට නංවන ලද වැඩසටහන්.

## විරු ගම්මාන ජාතික නිවාස වැඩසටහන

2011 ජනසෙවන නිවාස දස ලක්ෂයේ නිවාස හා ජනාවාස සංවර්ධන මෙහෙයුම යටතේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් නිවාස අපේක්ෂිත විවිධ ජනකොටස් සඳහා මූලික යටිතල පහසුකම් සහිත නිවාස ව්‍යාපෘති මෙම වැඩසටහන තුලින් ඉදිකිරීමට යෝජිත වේ.  මෙමගින්ද මහින්ද චින්තන ඉදිරි දැක්මට අනුකූලව ගරු ඉදිකිරීම් ඉංජිනේරු සේවා නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමාගේ මගපෙන්වීම මත දිස්ත්‍රික් මට්ටමින් ප්‍රදේශයේ දිවි පිදූ රණවිරුවකු ස්මරණය කිරීම පෙරදැරි කොට එම නමින් අදාල ව්‍යාපෘතිය නම්කර මෙම වැඩසටහන ක්‍රියාවට නැංවේ.

මෙම වැඩසටහන දිවයිනේ සියළුම දිස්ත්‍රික්කයන්හි ක්‍රියාත්මක අතර, වඩාත් සුදුසු ජනාවාස තෝරා එය නිශ්චිත කාල සීමාවක් තුලදී නිම කිරීමට කටයුතු කරනු ලැබේ. ව්‍යාපෘති තෝරා ගැනීමේදී මාර්ග, ජලය වැනි මූලික යටිතල පහසුකම් වලින් සමන්විත ප්‍රදේශයක් තෝරා ගැනීමට කටයුතු කෙරේ.

මෙම වර්ෂය තුලදී දිස්ත්‍රික්ක 19 ක ව්‍යාපෘති 60 ක් ඉදිකිරීමට කටයුතු කර ඇති අතර, ඒ තුලින් ප්‍රතිලාභී පවුල් 1771 ක් වෙත නිවාස ඉදිකර ගැනීමට සහාය ලබාදී ඇත.  මෙම වැඩසටහන වෙනුවෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් රු.මි. 195.972  ක මුදලක් වැයකර ඇත.

## විසිරි නිවාස ජාතික වැඩසටහන

මහින්ද චින්තන ජාතික වැඩසටහන යටතේ දිවයින පුරා විසිරී සිටින නිවාස අහිමි සෑම පවුලක් සඳහාම නිවසක් ඉදිකර ගැනීමට අවස්ථාව සලසාදීම අරමුණ ඇතිව ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිර්ණායකයන්ට අනුකූලව සමස්ථ ග්‍රාම නිලධාරී කොට්ඨාශ මට්ටමින් ප්‍රජාවගේ දායකත්වයද ඇතිව අවශ්‍ය මූල්‍ය හා තාක්ෂණික සහාය ලබාදීම මෙම වැඩසටහන  තුලින් සිදු කරනු ලැබේ.

නිවාස අවශ්‍යතාවය පවතින නිවාසලාභීන්ට නව නිවාස ඉදිකිරීම හා පවත්නා නිවාස වැඩිදියුණු කර ගැනීම වෙනුවෙන් නිවාස ණය නිකුත් කිරීම මෙම වැඩසටහන යටතේ සිදු කෙරේ.  දැඩි නිවාස අවශ්‍යතාවයකින් යුත් නිවසක් ඉදිකර ගැනීමට ද්‍රව්‍යක හෝ මුදල් රැස්කර ගෙන ඇති පුද්ගලයන් මෙම වැඩසටහන යටතේ ප්‍රමුඛත්වය ලබාදේ.  මෙම වැඩසටහන තුලින් 2011 වර්ෂය අවසන් වන විට නිවාස ඒකක 8153 ක් ඉදිකිරීමට දායකත්වය ලබාදී ඇති අතර,  ඒ වෙනුවෙන් පහත සඳහන් මූලාශ්‍රකයන් තුලින් රු.මි. 873.287 ක් වැයකර ඇත.

| | | |
|---|---|---|
| භාණ්ඩාගාර අරමුදල් | - | රු.මි. 494.044 |
| අභ්‍යන්තර උත්පාදන | - | රු.මි. 379.243 |

## ජනසෙවණ උපහාර ජාතික නිවාස වැඩසටහන

රාජ්‍ය සංස්ථා ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවකයින් ඇතුළු මධ්‍ය ආදායම්ලාභීන්ගේ නිවාස අවශ්‍යතාවයන් ඉටු කිරීමෙහිලා ප්‍රවේශයක් ලෙස වාණිජ බැංකු සහාය කරගෙන නිවාස ණය නිකුත් කිරීම මෙම වැඩසටහනේ මූලික අරමුණයි.

මෙහිදී රජයේ සේවකයින් වෙත අවම ලියකියවිලි ඉදිරිපත් කිරීම තුලින් පුද්ගල ඇප මත රු. 500,000/- ක් දක්වා වූ ණය මුදලක් ලබාදේ.  මේ යටතේ නව නිවසක් ඉදිකිරීමට හා පවත්නා නිවාස අළුත්වැඩියා කිරීම වෙනුවෙන් නිවාස ණය නිකුත් කරනු ලබන අතර, මහල් නිවාස අළුත්වැඩියා සඳහාද ණය නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ.  ජනසෙවන උපහාර වැඩසටහන යටතේ 2011 වර්ෂය තුලදී පවුල් 5831 ක් වෙත නිවාස ඉදිකර ගැනීම සඳහා ණය ලබාදීමට කටයුතු කර ඇති අතර, ඒ වෙනුවෙන් වැය කළ මුදල රු.මි. 1411.562 වේ.

**"ජනසෙවණ නිවාස දස ලක්ෂයේ නිවාස සහ ජනාවාස සංවර්ධන මෙහෙයුමේ"** උප වැඩසටහනක් ලෙස **" ජනසෙවණ උපහාර ණය වැඩසටහන"** 2011 වර්ෂයේ ආරම්භ කරන ලදී.  මෙම වැඩසටහනට කිසිදු බැංකුවකින් ණය මුදලක් ලබා ගැනීම සඳහා හැකියාවක් නොමැති රාජ්‍ය හා පෞද්ගලික අංශයේ රැකියාවල නියුතු ජන සංඛ්‍යාවක් ඇතුලත් වේ. 2011 වසරේ ආරම්භ කළ ජනසෙවණ උපහාර වැඩසටහන අදියර දෙකකින් සමන්විත වේ.

## ජනසෙවණ උපහාර අදියර 01

මෙම වැඩසටහනට රාජ්‍ය බැංකු තුනකින් රුපියල් මිලියන 710.0 ක මූල්‍ය ප්‍රතිපාදන ලබා දී ඇත. එනම්,

| | | |
|---|---|---|
| ▪ මහජන බැංකුව | රු. මි. | 300 |
| ▪ ලංකා බැංකුව | රු. මි. | 250 |
| ▪ ජාතික ඉතිරිකිරීමේ බැංකුව | රු. මි. | 260 |

මෙම වැඩසටහන තුලින් ප්‍රතිලාභී පවුල් 2389 ක් සඳහා ණය ලබාදීමට කටයුතු කර ඇත.

## ජනසෙවණ උපහාර අදියර 02

මෙම වැඩසටහනට රාජ්‍ය බැංකු 06 කින් රුපියල් මිලියන 1500 ක මූල්‍ය ප්‍රතිපාදන ලබා දී ඇත. එනම්,

| | | |
|---|---|---|
| ▪ මහජන බැංකුව | රු. මි. | 300 |
| ▪ ලංකා බැංකුව | රු. මි. | 300 |
| ▪ ජාතික ඉතිරිකිරීමේ බැංකුව | රු. මි. | 260 |
| ▪ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | රු. මි. | 250 |
| ▪ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | රු. මි. | 100 |
| ▪ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව | රු. මි. | 250 |

මෙම වැඩසටහන තුලින් ප්‍රතිලාභී පවුල් 4736 ක් සඳහා ණය ලබාදීමට කටයුතු කර ඇත.

2012 වර්ෂය සඳහා ද ජනසෙවණ උපහාර වැඩසටහන ක්‍රියාත්මකකරනු ලබන අතර ඒ සඳහා රාජ්‍ය බැංකු 06 කින් රුපියල් මිලියන 3800.0 ක මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමට එකඟ වී එය ක්‍රියාත්මක වෙමින් පවතී.

| | | |
|---|---|---|
| ▪ මහජන බැංකුව | රු. මි. | 1000 |
| ▪ ලංකා බැංකුව | රු. මි. | 1000 |
| ▪ ජාතික ඉතිරිකිරීමේ බැංකුව | රු. මි. | 1000 |
| ▪ රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | රු. මි. | 250 |
| ▪ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | රු. මි. | 250 |
| ▪ නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව | රු. මි. | 300 |

මෙම වැඩසටහන තුලින් ප්‍රතිලාභී පවුල් 12666 ක් සඳහා ණය මුදල් ලබාදීමට සැළසුම් කර ඇත. එමෙන්ම වර්ෂ 2013 සඳහා ද උක්ත රාජ්‍ය බැංකු දායක කර ගෙන රුපියල් මිලියන 4000 ක ජනසෙවණ උපහාර වැඩසටහනින් ක්‍රියාත්මක කිරීම සඳහා සැළසුම් කර ඇත.

මීට අමතරව 2012 වර්ෂයේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පැවති දැයට කිරුළ වැඩසටහනට සමගාමීව මහජන බැංකුව සමග ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ඒකාබද්ධ වී රුපියල් මිලියන 120 ක ණය වැඩසටහනේ ක්‍රියාත්මක කර ඇත.

එමෙන්ම උතුරු පළාතේ නැවත පදිංචිකිරීමේ වැඩසටහන සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකු මූල්‍ය ප්‍රතිපාදන මඟින් නිවාස ඒකක 540 ක් සඳහා රුපියල් මිලියන 345 ක් වැඩසටහනින් ක්‍රියාත්මක කර ඇත.

## ශ්‍රම සවිය ජාතික නිවාස වැඩසටහන.

ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් ක්ෂේත්‍රයට විවිධ වෘත්තීන් යටතේ දායකත්වයක් සපයනු ලබන පුහුණු ශ්‍රමිකයින්ගේ වෘත්තීය හැකියාවන් වර්ධනය කිරීම හා ජීවන තත්ත්වය උසස් මට්ටමට ගෙන ඒම මෙම වැඩසටහන මගින් බලාපොරොත්තු වේ.

මෙහිදී නිසි පුහුණුවකින් තොරව තම වෘත්තීයේ නියැලෙන වෘත්තිකයින් හට (මූලිකව වඩු පෙදරේරු ශිල්පීන්ගේ) දිවයිනේ ප්‍රමුඛ පෙළේ සම්පත් දායක ආයතන හරහා

- වෘත්තියට අදාල න්‍යායාත්මක හා ප්‍රායෝගික පුහුණුව ලබාදීම.
- ජාතික වෘත්තිය සුදුසුකම් (NVQ) සහතිකය ලබා ගැනීම සඳහා වෘත්තිකයින් පෙළඹවීම හා එමගින් සමාජය පිළිගත් පුහුණු වෘත්තිකයෙකු බවට පත් කිරීම.
- පරිසර හිතකාමී නිවාස ඉදිකිරීම් ක්‍රමවේදයන් පිළිබඳ ඔවුන් දැනුවත් කර එම ක්‍රමවේදයන් ප්‍රචලිත කිරීම සඳහා ඔවුන් යොදවා ගැනීම.

- පරිසර හිතකාමී ඉදිකිරීම් ක්‍රමවේදයන් ප්‍රයෝජනයට ගනිමින් අවශ්‍යතාවය පරිදි තම තමන්ගේ නිවාස ඉදිකර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් ලබාදීම තුලින් ඔවුනොවුන්ගේ ජීවන තත්ත්වය උසස් කර ගැනීමට අවශ්‍ය මගපෙන්වීම මෙම වැඩසටහනේ මූලික පරමාර්ථ වේ.

ඒ අනුව 2011 වර්ෂය තුලදී මෙම වැඩසටහන තුලින් පවුල් 905 ක් වෙත නිවාස ඉදිකර ගැනීමට සහාය වීමට කටයුතු කළ අතර, ඒ සඳහා වැයකළ මුදල රු.මි. 82.125 කි.

### සසුනෙන් සෙවණ ජාතික නිවාස වැඩසටහන.

ගමෙන් පන්සලට පන්සලෙන් ගමට යන තේමාව සාක්ෂාත් කර ගැනීම අරමුණු කොට 2600 සම්බුද්ධ ජයන්ති සංවත්සරය නිමිති කොට හා එය සමරනු වස් ශ්‍රී ලංකාව තුල ඇති 10210 ක් පමණ වූ පන්සල් හා පුදබිම් ආශ්‍රිතව ජීවත් වන ඉතා දිළිඳු පවුල් ඉලක්ක කොට එක් පන්සලක් වෙනුවෙන් එක් දිළිඳු පවුලකට නිවසක් තනාදීම මෙම වැඩසටහනේ අරමුණ වේ.

මෙම වැඩසටහන යටතේ දිවයින පුරා ඇති පන්සල් 10210 ක් ආවරණය වන සේ නිවාස 10,000 ක් ඉදිකිරීමට යෝජිත අතර, පළමු අදියර වශයෙන් 2011 වර්ෂය තුලදී පවුල් 528 කට නිවාස ඉදිකර ගැනීම සඳහා සහාය ලබාදීමට කටයුතු කර ඇත. මේ වෙනුවෙන් වැයකළ මුදල රු.මි. 34.885 ක් වේ.

නිවාස ණය මුදලක් ලබාගෙන ආපසු ගෙවීමට හැකියාවක් නැති එහෙත් නිවසක අවශ්‍යතාවය ඇති එසේම නිවසක් තනා ගැනීමේ උනන්දුව ඇති ඉතා දිළිඳු පවුල් මේ සඳහා තෝරා ගනු ලැබේ. එය දායක සභාවේ පූර්ණ අධීක්ෂණය යටතේ අදාල ග්‍රාම නිලධාරී හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ මැදිහත්වීම මත සිදු කරනු ලැබේ. නිවසක් තනා ගැනීමට අවශ්‍යතාවය ඇති ඉඩමක් හිමි පවුලක්වීම අනිවාර්යය වේ. පවුල තෝරා ගැනීමේ අවසන් නිර්දේශය අදාල පවුල අයත් වන පන්සලේ නායක ස්වාමීන් වහන්සේ ඇතුළු දායක සභාව විසින් ලබාදිය යුතුය. මෙහිදී නිවසක් ඉදිකර ගැනීම සඳහා මූලික සූදානමක් ඇති පවුල් කෙරෙහි ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් රු- 100,000/- ක ආධාර මුදලක් ලබාදේ. ඉතිරි ඉදිකිරීම් පිරිවැය දායක සභාවේ මැදිහත්වීමෙන් ප්‍රදේශයේ දානපතියන්ගේ හා ස්වේච්ඡා සංවිධාන මගින් ලබා ගැනීමට කටයුතු කළයුතු වේ.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් නිවාස සැලසුමක් ලබාදෙන අතර, ඉදිකිරීම් තාක්ෂණික සහාය ලබාදේ.

- නිවාස ඉදිකරන ප්‍රදේශය ආශ්‍රිතව ඉදිකිරීම් කිරීමට යෝග්‍ය තාක්ෂණික ක්‍රමවේද නිවාස අධිකාරිය විසින් ලබාදෙන අතර, ඉදිකිරීම් අධීක්ෂණ කටයුතු ක්‍රමවත්ව සිදු කරනු ලැබේ.

- දායක කමිටුව ගම්වාසීන් හා ප්‍රතිලාභී පවුල විසින් පුහුණු හා නුපුහුණු තාක්ෂණික සහාය ලබාගත යුතුය.

### ජනසෙවණ සරණ ජාතික නිවාස වැඩසටහන

නිවාස ණය මුදලක් ලබාගෙන ආපසු ගෙවීමේ හැකියාවක් නොමැති නමුත් නිවසක් ඉදිකර ගැනීමේ අවශ්‍යතාවය ඇති දිළිඳු දරු පවුල් වෙනුවෙන් ස්ථිරසාර නිවසක් ඉදිකරදීමේ අරමුණින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. මේ යටතේ එක් පවුලක් වෙනුවෙන් උපරිමය රුපියල් ලක්ෂයක ආධාර මුදලක් ප්‍රදානය කිරීම සිදු කර ඇත. මෙම වැඩසටහන තුලින් 2011 වර්ෂයේ පවුල් 33 ක් වෙත නිවාස ඉදිකරදීම වෙනුවෙන් රු.මි. 2.524 ක් වැය කොට ඇත.

### ආදිවාසී නිවාස වැඩසටහන.

මෙරට විවිධ ප්‍රදේශ වල ජීවත් වන ආදිවාසී ප්‍රජාව වෙත ස්ථිරසාර වාසස්ථාන ඉදිකරදී ඔවුන්ගේ පැවැත්ම සුරක්ෂිත කිරීමේ අරමුණ ඇතිව සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය දායකත්වය තුලින් මෙම වැඩසටහන ක්‍රියාවට නැංවේ. මෙම වැඩසටහනේ පළමු අදියර වශයෙන් මඩකලපුව, අම්පාර හා මොණරාගල දිස්ත්‍රික්කයන්හි පහත දැක්වෙන ගම්මාන 4 හි ආදිවාසී පවුල් 100 ක් සඳහා නිවාස ඉදිකිරීමට කටයුතු කරනු ලැබේ.

| දිස්ත්‍රික්කය | ව්‍යාපෘතිය | නිවාස සංඛ්‍යාව |
|---|---|---|
| මඩකලපුව | කුංචන්කුලම් | 30 |
| මොණරාගල | රතුගල | 20 |
| අම්පාර | පොල්ලෙබැද්ද | 30 |
| අම්පාර | හෙන්නානිගල | 20 |

මෙම වැඩසටහන යටතේ එක් නිවසක් සඳහා රු. 124,000/- ක මූල්‍ය ආධාරයක් ලබාදෙන අතර, ආදිවාසී ප්‍රජාවගේ ජීවන රටාව හා අදහස් උදහස් වලට ගැලපෙන අයුරින් නිර්මාණය කරන ලද ව්‍යාපෘති වල සැලැස්මක් අනුව ව්‍යාපෘති වල සියළු නිවාස ඉදිකිරීමට යෝජිතව ඇත. මෙම වැඩසටහන යටතේ ව්‍යාපෘති 04 වෙනුවෙන් මේ වන විට රු.මි.3.400 ක් වැය කොට ඇත.

## බාහිර අරමුදල් දායකත්ව නිවාස වැඩසටහන.

ජාතික මට්ටමින් ලබාදෙන අරමුදල් වලින් බැහැරව දිස්ත්‍රික් මට්ටමින් ලබාගන්නා පළාත් සභා විමධ්‍යගත අරමුදල් ස්වේච්ඡා ආයතන හා වෙනත් සංවිධානයන්හි මූල්‍ය දායකත්වය තුලින් මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ. මෙම වැඩසටහන යටතේ 2011 වර්ෂය තුලදී ගංවතුර ආධාර වැඩසටහන, නැවත පදිංචිකිරීමේ වැඩසටහන, ආදි වැඩසටහන් තුලින් පවුල් 7115 ක් වෙත නිවාස ඉදිකරදීම සිදු කර ඇත. මේ සඳහා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, නැවත පදිංචිකිරීමේ අමාත්‍යාංශය, විමධ්‍යගත අරමුදල් ආදී මූලාශ්‍රයන් තුලින් රු.මි. 309.190 ක් වැයකොට ඇත.

## දැයට කිරුළ වැඩසටහන - අනුරාධපුර දිස්ත්‍රික්කය

දැයට කිරුළ 2012 ප්‍රදර්ශනයට හා සංවර්ධන වැඩසටහනට සමගාමීව අනුරාධපුර දිස්ත්‍රික්කයේ අඩු ආදායම්ලාභී දරු පවුල් සඳහා නිවාස සංවර්ධන වැඩසටහනක් හා ජීවනෝපාය සංවර්ධන වැඩසටහනක් ක්‍රියාවට නැංවීම මෙම වැඩසටහනේ මූලික අරමුණයි. මේ යටතේ නිවාස වැඩිදියුණු කර ගැනීමට හෝ අළුතින් නිවසක් ඉදිකර ගැනීමේ අවශ්‍යතාවය ඇති පවුල් වෙනුවෙන් නිවාස ණය හා ආධාර වැඩ සටහනක් ක්‍රියාවට නංවන ලදී.

මේ යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ පවුල් 558 ක් සඳහා නිවාස ණය ප්‍රදානය කළ අතර, ඒ සඳහා භාණ්ඩාගාර ප්‍රතිපාදන රු.මි. 59.125 ක් හා මහජන බැංකු ප්‍රතිපාදන රු.මි. 82.918 ක් ආයෝජනය කර ඇත.

මීට අමතරව දැයට කිරුළ වැඩසටහනට සමගාමීව පසුගිය දශක තුනකට අධික කාල පරිච්ඡේදය තුල මෙරට පැවති යුධමය වාතාවරණය තුල ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් සිය ගේ දොර විනාශ වූ දරු පවුල් වෙත සිය ගම්බිම් හි ස්ථිර සාර නිවාස ඉදිකරදීමේ අරමුණ ඇතිව ප්‍රණාම නිවාස වැඩසටහන ක්‍රියාත්මක කෙරේ. මෙම දරු පවුල් බහුතරය ගොවිතැන ජීවනෝපාය කරගත් සරළ දිවි පෙවෙතක් ගත කළ පිරිසක් විය. මොවුන් ජීවත්වූ ගම්මාන එකල නිරන්තර ත්‍රස්ත ප්‍රහාරයන්ට ලක් වී ගේ දොර වතු පිටි විනාශවී ආදායම් මාර්ග දරුවන්ගේ අධ්‍යාපනය මෙන්ම එදිනෙදා ජන ජීවිතය පවත්වාගෙන යාමේ අපහසුතාවයන්ට ලක් වෙමින් අතිශය දුෂ්කර කටුක දිවි පෙවෙතක් ගත කරමින් මෙම ගම් බිම් වලම රැකෙමින් ඒවා ආරක්ෂා කිරීමට උරදී ඇත. මෙම වැඩසටහන යටතේ මේ වන විට අනුරාධපුර දිස්ත්‍රික්කයේ පදවිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උළුව ඕමාරකඩ, ගම්මානය, කැබිතිගොල්ලෑව වාහල්කඩ ගම්මානය හා කම්බිලිවැව කෝන්වැව ගම්මානයන්හි දරු පවුල් 156 ක් වෙත රු.මි. 25 ක මුදලක් වැය කරමින් නිවාස ඉදිකර දීම සිදු කර ඇත.

තවද දැයට කිරුළ වැඩසටහනට සමගාමීව මහවිලච්චිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දරු පවුල් 31 ක් වෙත නිවාස ආධාර ලෙස රු.මි. 3.040 ක් ලබා දෙමින් නිවාස ඉදිකරදීමට සිදුකර ඇති අතර, තවත් පවුල් 47 ක් වෙත නිවාස ඉදිකිරීම වෙනුවෙන් ගොඩනැගිලි ද්‍රව්‍ය ආධාර ප්‍රදානය කිරීම සිදු කොට ඇත.

## වතු වැඩසටහන.

වතුකරයේ ලයින් කාමර වල අවම පහසුකම් යටතේ ජීවත් වන ප්‍රජාව වෙත මූලික පහසුකම් වලින් සමන්විත නව නිවසක අයිතිය ලබාදීම මෙම වැඩසටහනේ මූලික අරමුණයි. ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය හා වැවිලි මානව සංවර්ධන භාරය මේ වෙනුවෙන් මූල්‍ය දායකත්වය ලබාදෙනු ලැබේ. මෙම වැඩසටහන දිවයිනේ දිස්ත්‍රික්ක 13 ක් ආශ්‍රිතව ක්‍රියාත්මක වේ. පසුගිය වසර කීපය තුල ඉදිකිරීම් ආරම්භ කළ ඉතිරිව ඇති නිවාස ඒකක 390 ක ඉදිකිරීම් කටයුතු 2011 වර්ෂය තුලදී නිම කිරීමට කටයුතු කළ අතර, ඒ සඳහා වැයකළ මුදල රු.මි. 13.635 කි.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
ජනසෙවණ නිවාස වැඩසටහන
**2011.12.31 දිනට ප්‍රගතිය**

| | "ජන සෙවන" නිවාස වැඩ සටහන | වාර්ෂික ඉලක්කය | | | | | | ලගාවීම් (2011.12.31 දිනට) | | | | | | | මහා භාණ්ඩාගාරයෙන් ලැබුණු අරමුදල් |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | භෞතික | මූල්‍යමය (රු.මි.) | | | | | භෞතික | | මූල්‍යමය (රු.මි.) | | | | | |
| | | (ඒකක ගණන) | එකතුව | ඒකාබද්ධ අරමුදල් | ආයතනික එකතුකිරීම් | අනෙකුත් | සෙවණ | වැඩ ආරම්භ කිරීම | නිමකළ ඒකක | ඒකාබද්ධ අරමුදල් | ආයතනික එකතුකිරීම් | අනෙකුත් | සෙවණ | එකතුව | |
| 1 | **ග්‍රාමීය හා අර්ධ නාගරික වැඩ සටහන** | | | | | | | | | | | | | | 715.0 |
| | i. ජනසෙවන "විරු උපහාර" ව්‍යාපෘතිය | 2,000 | 225.0 | 125.0 | 100.0 | | | 1,771 | 565 | 161.42 | 34.56 | - | - | 195.98 | |
| | ii. සෙවණ ශ්‍රම ශක්ති | 1,000 | 100.0 | 75.0 | 25.0 | | | 905 | 512 | 59.89 | 22.24 | - | - | 82.13 | |
| | iii. විසිරි නිවාස | 7,000 | 850.0 | 600.0 | 250.0 | | | 8,153 | 5,572 | 494.04 | 379.24 | - | - | 873.28 | |
| | **ආ. සෙවණ උපහාර වැඩ සටහන** | 6,500 | 2,210.0 | | | 2,210.0 | | 5,722 | 2,736 | - | | 1,396.98 | | 1,396.98 | |
| | එම - නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව | | | | | | | 109 | | | | 14.58 | | | |
| 2 | අවිච්ඡේද නිවාස 2010 | 1,769 | 88.0 | | 88.0 | | | | 1,795 | | 83.49 | | | 83.49 | |
| 3 | දැයට කිරුළ නිවාස වැඩ සටහන - මොණරාගල | 1,331 | 94.0 | | | 94.0 | | 1,331 | 1,036 | | | 94.37 | | 94.37 | |
| | - අනුරාධපුරය | 1,138 | 246.8 | 86.8 | | 135.0 | 25.0 | 461 | 23 | 11.26 | 16.41 | - | 1.67 | 29.34 | |
| 4 | ජනසෙවණ ආධාර නිවාස වැඩ සටහන | | - | | | | | | | | | | | - | 115.0 |
| | අ. සෙවණ සරණ | 300 | 30.0 | | | | 30.0 | 33 | 19 | | | | 2.52 | 2.52 | |
| | ආ. සෙවණ කැපකරු නිවාස | 3 | 1.2 | | | 1.2 | | 2 | 2 | | | 1.10 | | 1.10 | |
| | ඇ. සසුනෙන් සෙවණ | 550 | 55.0 | | | | 55.0 | 528 | 137 | | | | 34.89 | 34.89 | |
| 5 | **සහශ්‍ර ලංකා නිවාස වැඩ සටහන** | | - | | | | | | | | | | | - | |
| | අ. ආයෝජන ව්‍යාපෘති | 770 | 100.0 | | | 100.0 | | 4 | | | | 11.087 | | 11.087 | |
| | ආ. පුනස්ථාපන ව්‍යාපෘති | 48 | 14.6 | 14.6 | | | | | | | | | | | |
| 6 | **සහසවිය වැඩ සටහන** | | - | | | | | | | | | | | - | |
| | අ. ගංවතුර ආපදා | 6,484 | 669.3 | | | 669.3 | | 6,466 | 94 | | | 248.47 | | 248.47 | |
| | අ පුනරුත්ථාපන විමධ්‍යගත හා බාහිර අරමුදල් | 366 | 36.6 | | | 36.6 | | 749 | 354 | | | 64.12 | | 64.12 | |
| 7 | බාහිර අරමුදල් (අවිච්ඡේද) | 442 | 15.0 | | | 15.0 | | | 385 | | | 14.313 | | 14.313 | |
| 8 | වතු නිවාස (අවිච්ඡේද) | 1,378 | 183.0 | - | - | 183.0 | | | 390 | | | 13.64 | | 13.64 | |
| 9 | සෙවණ විසිරි (අවිච්ඡේද) | 250 | 14.0 | | | | 14.0 | 3 | 224 | | | | 10.31 | 10.31 | |
| 10 | ජන කිරුළ (අවිච්ඡේද) | 310 | 26.6 | | | | 26.6 | 39 | 270 | | | | 25.99 | 25.99 | |
| 11 | රණවිරු (අවිච්ඡේද) | 80 | 2.8 | | | | 2.8 | 1 | 71 | | | | 2.87 | 2.87 | |
| 12 | ධීවර නිවාස අවිච්ඡේද | 107 | 20.0 | | | 20.0 | | | 93 | | | 18.00 | | 18.00 | |
| | **උප එකතුව** | 31,826 | 4,981.9 | 901.4 | 463.0 | 3,464.1 | 153.4 | 26,277 | 14,278 | 726.61 | 535.94 | 1,876.66 | 78.25 | 3,202.88 | 830 |
| 11. | සෙවණ බිම්සවිය වැඩ සටහන | 500 | | | | | | | | | | | | | |
| 111. | නගමු පුරවර වැඩ සටහන | 3,000 | 255.0 | 255.0 | - | - | | | | 125.73 | - | - | | 125.73 | 230.0 |
| iv. | හිමිකම් ඔප්පු ලබාදීම | 3,000 | - | - | - | - | | | 2,151 | | - | - | | | |
| v. | සභාධිපත්‍ය නඩත්තු ඒකකය | - | 9.3 | 9.3 | - | - | | | | 9.30 | - | - | | 9.30 | 9.3 |
| vi. | ඉඩම් වන්දි ලබාදීම | - | 50.0 | 50.0 | - | - | | | | 50.38 | - | - | | 50.38 | 50.0 |
| | **උප එකතුව** | 6,500 | 314.3 | 314.3 | - | - | - | - | 2,151 | 185.41 | - | - | - | 185.41 | 289.30 |
| | **එකතුව** | 38,326 | 5,296.2 | 1,215.7 | 463.0 | 3,464.1 | 153.4 | 26,277 | 16,429 | 912.02 | 535.9 | 1,876.66 | 78.25 | 3,388.29 | 1,119.3 |

දේපළ කළමනාකරණ

දේපළ කළමනාකරණ කොට්ඨාශය පහත අංශවලින් සමන්විතව 2011 වර්ෂයේදී ක්‍රියාත්මක විය.

1. දේපළ කළමනාකරණ අංශය
2. නිවාස අලෙවි අංශය
3. ඉඩම් අංශය
4. මැණුම් අංශය
5. තක්සේරු අංශය

### දේපළ කළමනාකරණ අංශය

මෙම අධිකාරිය මගින් ඉදිකර ඇති සියළුම නිවාස ක්‍රමවලට අදාල කළමනාකරණ කටයුතු දිස්ත්‍රික් කාර්යාල සම්බන්ධීකරණය කරගෙන කරනු ලබන අතර පහත සඳහන් කටයුතු 2011 වර්ෂය තුලදී ඉටුකර ඇත.

01. දිවයිනේ සියළුම දිස්ත්‍රික් කාර්යාලවල ඇති විවිධ වකවානුවල සෑදූ සියළුම නිවාස ක්‍රමයන්හි ඇති පොදු ගැටළු සඳහා දිස්ත්‍රික් කාර්යාල සම්බන්ධීකරණය කර අදාල දේපල කළමනාකරණ චක්‍රලේඛනවලට අනුව විසඳුම් ලබාදී ඇත.

02. අධිකාරිය සතු දේපළ බැහැර කරදීමේදී ඒ සඳහා නිවාස අධිකාරියේ පනතේ 8/1 වගන්තියට අනුව විෂයභාර අමාත්‍යතුමාගෙන් අනුමැතිය ලබාගෙන ඒ අනුව අදාල දේපළ බැහැර කිරීමට කටයුතු කිරීම.

03. බදු පදනමින් ලබාදී තිබූ මහල් නිවාස සින්නක්කර පදනමින් ලබාදීමේ වැඩසටහන දිගටම ක්‍රියාත්මක කිරීම.

04. නිවාස මහලේකම් ගොඩනැගිල්ලේ කුලී හා බදු දී ඇති පරිශ්‍රයන්ට අදාල බදු මුදල් අයකරගැනීම

06. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු කොළඹ නගර උතුර හා දකුණ කාර්යාල බල ප්‍රදේශවල ඉඩම් හා නිවාස සම්බන්ධ ගැටළු සඳහා අදාල චක්‍රලේඛණවලට අනුව විසඳුම් ලබාදීම.

07. වැඩි දියුණු කරන ලද නාගරික නිවාස ක්‍රමවල ඉඩම්ලාභීන් සඳහා සින්නක්කර ඔප්පු ලබාදීමේ කටයුතු කඩිනම් කිරීම.

08. උතුරු සහ නැගෙනහිර පළාත් දෙකට අයත් යාපනය, මන්නාරම, වවුනියාව, මුලතිවු, කිලිනොච්චිය, මඩකලපුව, අම්පාර, ත්‍රිකුණාමලය යන දිස්ත්‍රික්කවලට අදාල නිවාස ක්‍රමවල ඇති පොදු ගැටළු සඳහා ප්‍රතිපත්තිමය විසඳුම් ලබාදීම.

10. යාබඳ ඉඩම් කැබලි බැහැර කිරීමට පියවර ගැනීම

11. සියළුම දිස්ත්‍රික්කවලට අයත් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම් පිළිබඳ තොරතුරු ලේඛණ ගත කිරීම, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සමඟ සම්බන්ධීකරණය වී වන්දි ගෙවීම් කටයුතු කඩිනම් කිරීම.

### 02. නිවාස අලෙවි අංශය

පෙර වර්ෂවල ඉදිකිරීම් නිමකර තිබූ නිවාස යෝජනා ක්‍රමවල ඉතිරිව තිබූ නිවාසවලින් එක් නිවසක් හා එක් කඩ සාප්පුවක් බදු පදනමින් ලබාදීමටත් එක් නිවසක් අලෙවි කිරීමට කටයුතු කර ඇති අතර, බදු පදනමින් ලබා දී තිබූ නිවාස විකුණුම් පදනමට පරිවර්තනය කිරීමේ දී අයකරන මුදල් හා පෙර වර්ෂවල අලෙවි කරන ලද නිවාසවලින් ලද මුදල් ඇතුළුව රු. 63,805,743.00 ක මුදලක් ආදායම් ලෙස උපයාගෙන ඇත.

### 03. ඉඩම් පැවරුම් අලෙවි අංශය

1. ඉඩම් පවරා ගැනීම් හා අලෙවි අංශයේ කාර්යය භාරය ඃ

I. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිවාස අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යව ඉඩම් පවරාගැනීම් කටයුතු / නිවාස අරමුණු සඳහා ඉඩම් අලෙවි කිරීම සහ වෙනත් අවශ්‍යතා වෙනුවෙන් ඉඩම් බදු පදනමින් බැහැර කිරීම.

II. අනවසරකරුවන් නියමානුකූල කිරීම, යාබද ඉඩම් බැහැර කිරීම.

2. ඉලක්ක හා වැඩසටහන

පවරා ගැනීම් අවසන් නොවූ ඉඩම් වල පවරා ගැනීම් කටයුතු අවසන් කරගැනීම.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් නිවාස ව්‍යාපෘති ඉදිකරන ලද ඉඩම්වල පවතින හිස් ඉඩම්, යාබද ඉඩම් හා අනවසරයෙන් අල්ලා ගෙන ඇති ඉඩම් හඳුනාගැනීම සඳහා 2010 වර්ෂය තුල උතුරු- නැගෙනහිර හැර සෙසු පළාත්වල ආරම්භ කර ලද සමීක්ෂණය මෙම වර්ෂය තුල අවසන් කර වාර්තාවක් පිළියෙල කිරීම.

**3. ඉලක්ක සපුරාගැනීම**

ඉඩම් 03 ක පැවරුම් කටයුතු අවසන් කර ඇත.

ඉඩම් සමීක්ෂණ කටයුතු අවසන් කර අවසන් වාර්තාවක් පිළියෙල කර ඇත.

**4. ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වූ බාධක :**

I. පුද්ගලික ඉඩම් 55 ක වන්දි හා පොලී වශයෙන් රු: 179,345,257.35 ක් 2011.01.01 දිනට ගෙවීමට තිබූ අතර තවත් රු: 7,577,919.41 ක් වන්දි හා පොලී වශයෙන් වර්ෂය තුලදී ගෙවීමට ප්‍රාදේශීය ලේකම් විසින් දන්වා ඇත. වර්ෂය තුල රු: 27,852,200.52 ක් වන්දි හා පොලී වශයෙන් ගෙවීම් කර ඇත. මෙම මුදල ගෙවා ඇත්තේ මෙතෙක් වන්දි හා පොලී දන්වා ඇති ඉඩම් වල එම ගෙවිය යුතු මුදලින් කොටසක් ගෙවීමට වන අතර සම්පූර්ණ වන්දි හෝ පොලී මුදල් එකවර ගෙවීමට වාර්ෂික ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීය.

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩම් 44 ක් සඳහා රු: 55,075,741.21 ක මුදලක් ගෙවීමට තිබූ අතර, එයින් ඉඩම් 23 ක් සඳහා දන්වා තිබූ සම්පූර්න වටිනාකම් වර්ෂය තුලදී ගෙවීමට රු: 21,474,674.00 ක මුදලක් වැය කල අතර ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මඟින් ගැසට් නිවේදන පල කර එම ඉඩම් 23 ක පැවරීමේ ඉදිරි කටයුතු අවසන් කල යුතුව ඇත.

**5. වර්ෂය තුළ ලබාගත් ජයග්‍රහණ :**

පවරාගත් ඉඩම් ගණන

| රජය | පුද්ගලික | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | වෙනත් ආයතන |
|---|---|---|---|
| 01 | - | - | 02 |

ඉඩම් පවරාගැනීම සඳහා වැය කර ඇති මුදල් ප්‍රමාණය

| රජය | පුද්ගලික | ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව | වෙනත් ආයතන |
|---|---|---|---|
| 01 | 27,392,200.52 | 21,474,674.00 | 460,000.00 |

ඉඩම් ප්‍රතිසංස්කරණ සභාව සතු ඉඩම් 23 ක් සඳහා සම්පූර්ණයෙන් ගෙවා අවසන් කල අතර වැවිලි සංස්ථාව සතු එක් ඉඩමක් සඳහා ගෙවීම් කර අවසන් කර ඇත. එම ඉඩම් නීත්‍යානුකූලව පවරා දීමේ කටයුතු එම ආයතන මඟින් ඉටුකල යුතුව ඇත.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු නිවාස ක්‍රමවල පවතින හිස් ඉඩම් සහ අනවසරයෙන් භුක්ති විඳිනු ලබන ඉඩම් පිළිබඳ සමීක්ෂණයක් සිදුකර හඳුනාගන්නා ලද ඉඩම් බැහැර කිරීම සඳහා මූලික කටයුතු ආරම්භ කර ඇත.

**04 මැනුම් අංශය**

මාවත් පුළුල් කිරීම ආදී නිවාස ක්‍රමවලට සම්බන්ධ සියලුම කාර්යයන් සහ මැනුම් කටයුතු මැනුම් අංශය මඟින් සිදුකරනු ලබයි.

මීට අමතරව 2011 වසරේ දී, සහාධිපත්‍ය පිඹුරු සකස් කිරීම, සාමාන්‍ය පිඹුරු සකස් කිරීම, පිඹුරු පත්වල සහතික කරන ලද ඡායාපිටපත් නිකුත් කිරීම, නිවාස ක්‍රමවල නිවාසලාභීන්ගේ ඉල්ලීම මත මායිම් නිරවුල් කරදීම සඳහා ඔවුන්ගෙන් මුදල් ලබාගැනීම ආදියෙන් රු.183,292.00 ක මුදලක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත ආදායම් ලෙස ලබාදී ඇත.

එමෙන්ම ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ දිස්ත්‍රික් කළමනාකරුවන්ගේ ඉල්ලීම මත ඉල්ලා සිටිනු ලබන පිඹුරුපත් නිකුත් කිරීම හා ඔවුන් විසින් මැනුම් කටයුතු සම්බන්ධව විමසනු ලබන අවස්ථාවලදී ඒවාහට පිළිතුරු සැපයීම හා ප්‍රධාන කාර්යාලයේ අනෙකුත් අංශවලින් විටින් විට ඉල්ලා සිටින අවස්ථාවලදී අවශ්‍ය පිඹුරුපත් නිකුත් කිරීම හා ඔවුන්ගේ ලිපිවලට පිළිතුරු දී එම අවශ්‍යතාවයන් ඉටුකරදීම. ප්‍රධාන කාර්යාලයේ මිනින්දෝරු මහතුන් සේවය නොකරන බැවින් මැනුම් කිරීම සඳහා බලයලත් මිනින්දෝරු මහතුන් දිස්ත්‍රික් කළමනාකරු විසින් මිලකැඳවීම් කිරීමෙන් පසු ඒ අනුමැතිය සඳහා එවූවිට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (දේපල කළමනාකාර හා අලෙවි) වෙතින් හා සාමාන්‍යාධිකාරී වෙතින් අදාල අනුමැතිය ලබාගෙන ඒවා දිස්ත්‍රික් කලමනාකරුවන් වෙත යැවීම හා එදිනෙදා පැනනගින මැනුම් අවශ්‍යතාවයන් සපුරාදීම.

## 05. තක්සේරු අංශය

01. ඉඩම් මෙහෙයුම් රාජකාරි සඳහා ක්ෂේත්‍ර පරික්ෂණ කටයුතු කිරිම හා කළුතර, ගම්පහ, කොළඹ හා හම්බන්තොට දිස්ත්‍රික්කවලට අදාලව ඉඩම් කැබලි 108 සඳහා තොරතුරු වාර්තා ලබාදිම.

02. අළුතින් ඉදිකරන ලද වෙල්ලන්ගොල්ල හා ඇල්විටිගල නිවාස ක්‍රමවල නිවාස 27 ක් සඳහා තක්සේරු වාර්තා ලබාදිම.

03. නාලන්දා පෙදෙස මරදාන හා දියවන්නා ගාර්ඩ්න්හි දේපල 22 ක් සඳහා පුනස්ථාපන තක්සේරු ලබාදිම.

04. විවිධ දේපල 15 සඳහා වර්තමාන තක්සේරු කිරිම.

07. දේපල නියමානුකුල කිරිම හා පදිංචි පාර්ශවයේ තක්සේරු වාර්තා දේපල 54 ක් සඳහා සකස් කර ඇත.

08. දේපල 2 ක් සඳහා පරවශ්‍යතා අයිතිය තක්සේරු කිරිම.

09. කඩසාප්පු 10 ක් හා නිවාස 2 ක් සඳහා යලි තක්සේරු කිරිම.

10. පොදු දේපල දුරකථන කුළුණු හා ගරාජයක් සඳහා තක්සේරු වටිනාකම් ලබාදිම සිදුකර ඇත.

11. ජාතික නිවාස කොමසාරිස්ගේ දේපල 31 ක් සඳහා නිවාස දේපල උපරිම පනත අනුව තක්සේරු වාර්තාවක් ලබාදීම.

## 2011 වර්ෂයතුල දේපළ කළමනාකරණ කොට්ඨාශය ලබා ඇති ප්‍රගතිය

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පැරණි දේපළ කළමනාකරණ චක්‍රලේඛ පහත සඳහන් පරිදි සංශෝධනය කර ඇත.

i. ඉඩම් බැහැර කිරීම - 2011/දේ.කළ/01
ii. තුන්වන පාර්ශවයකට ඉඩම් බැහැර කිරීම - 2011/දේ.කළ/02
iii. ඉඩම් බදුදීම - 2011/දේ.කළ/03
iv. නිවාස සංවර්ධනය හා බැහැර කිරීම - 2011/දේ.කළ/04
v. තුන්වන පාර්ශවයකට ඉඩමක් බැර කිරීම - 2011/දේ.කළ/05
vi. විශේෂිත හේතුන් මත නිවසක් බදුදීම - 2011/දේ.කළ/06
vii. මහල් නිවාස බැහැර කිරීම - 2011/දේ.කළ/07
viii. මහල් නිවාස තුන්වන පාර්ශවයකට බැහැර කිරීම - 2011/දේ.කළ/08
ix. මහල් නිවාස බදුදීම - 2011/දේ.කළ/09
x. සාප්පු හා ව්‍යාපාරික ස්ථාන බදුදීම - 2011/දේ.කළ/10
xi. පොදු දේපළ බැහැර කිරීම - 2011/දේ.කළ/11

ඉංජිනේරු සේවා හා ඉදිකිරීම් කොට්ඨාශය පහත අංශවලින් සමන්විතව 2011 වර්ෂයේදී ජනාවාස සංවර්ධන සඳහා දායකවිය.

1. ඉංජිනේරු අංශය
2. වාස්තු විද්‍යා අංශය
3. ප්‍රමාණ සමීක්ෂණ අංශය
4. සැලසුම් අංශය
5. විදුලි අංශය
6. නඩත්තු අංශය

පහත සඳහන් වැඩ සටහන් මඟින් සියළු ජනකොටස්වල නිවාස අරමුණු හා ඒ සම්බන්ධ ගැටළු නිරාකරණය කිරීමට හැකියාව ලැබුණි.

**මහල්නිවාස ප්‍රතිසංස්කරණය (නගමු පුරවර)**

1979 වර්ෂයේ සිට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ ඊට පෙර වෙනත් රාජ්‍ය ආයතන මඟින් ඉදි කරන ලද මහල් නිවාස, එම නිවාස පදිංචිකරුවන්ගෙන් ලැබෙන කුලිය හා සමඟ සංසන්දනය කිරීමේ දී, නඩත්තු වියදම ඉතා අධික බැවින් අදාල නඩත්තු නොකිරීම නිසා ඉතා පහත් තත්වයක පවතී. මෙයින් නිවාස බොහොමයක් පදිංචිකරුවන් විසින් මිලදී ගෙන නොමැති හෙයින් කළමණාකරණ සංස්ථා පිහිටුවා තම නිවාස නඩත්තුව එම සංස්ථාවලට භාරදීමට අධිකාරිය නොහැකි වී ඇත.

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් මහල් නිවාස නවීකරණ පුනස්ථාපන වැඩ සටහන යටතේ, මෙම ගොඩනැගිලිවල තිබෙන මූලික අළුත්වැඩියාවන් සහ සේවා සම්පූර්ණ කරදෙනු ලබන්නේ නම්, සුළු නඩත්තු කටයුතු නිවාසලාභියා විසින්ම නිසි වේලාවට කරගෙනයාමට එකඟතාවය පලකර ඇත.

මේ කරුණු සලකා බලා ආරම්භ කරන ලද නගමු පුරවර වැඩ සටහනේ ප්‍රධාන අරමුණු වූයේ පැරණි නිවාස ක්‍රම සහ ඒවායේ යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කර කළමනාකරණ සංස්ථා පිහිටුවා ඒ හරහා නිවාසලාභීන්ට තම නිවාසවල නඩත්තුව භාරදීම සහ පොදු යටිතල පහසුකම් නඩත්තුව අදාල පලාත් පාලන ආයතන වෙත භාරදීමයි.

මහල් නිවාස ප්‍රතිසංස්කරණ වැඩ සටහන යටතේ බෙත්තාරාම,මාළිගාවත්ත සහ සොයිසාපුර නිවාස යෝජනා ක්‍රමයන්හි නිවාස අළුත්වැඩියා කටයුතු 2011 වර්ෂයේදී ආරම්භ කරන ලදී. මෙම නිවාසවල පදිංචිකරුවන් නිවාසවල රැඳීසිටියදීම අළුත්වැඩියා කටයුතු කිරීමට සිදුවූ හෙයින් එය තරමක මන්දගාමීව කිරීමට සිදුවිය.

බෙත්තාරාම නිවාසයෝජනා ක්‍රමයෙහි අළුත්වැඩියා කටයුතු 2011 ජනවාරි මස 21 දින ආරම්භ වු අතර, එය රු.මිලියන 10 ක මුල්‍ය ප්‍රතිපාදන යටතේ අරඹන ලද හෙයින්, මෙමඟින් නිවාසලාභීන් 60 කට වැඩි පිරිසකට ප්‍රතිලාභ ලබාගැනීමට හැකිවිය.

මාළිගාවත්ත නිවාස යෝජනා ක්‍රමයෙහි පුනස්ථාපන කටයුතු රු.මිලියන 160 ක මුල්‍ය ප්‍රතිපාදන සහිතව 2011 වර්ෂයේ මැයි 01 දින ආරම්භ කරන ලද අතර එහි පවතින අනවසර ඉදිකිරීම් හා පසුගිය වසර 40 තුල දී නිසි පරිදි නඩත්තු නොකල ගොඩනැගිලි සහ යටිතල පහසුකම් හේතුවෙන් එහි අළුත්වැඩියා කටයුතු සිදුකිරීමේ දී මහත් දුෂ්කරතාවලට මුහුණ දීමට සිදුවිය. මෙම පුනස්ථාපන කටයුතු හේතුවෙන් මෙම නිවාස ක්‍රමයෙහි පදිංචි 1512 පමණ පදිංචිකරුවනට මෙහි ප්‍රතිලාභ ලබාගැනීමට හැකිවනු ඇත. සොයිසාපුර නිවාස යෝජනාක්‍රමයේ අළුත්වැඩියා කටයුතු මේ වර්ෂයේ පෙබරවාරි මස 10 වෙනි දින රු.මි.49 මුල්‍ය ප්‍රතිපාදන සහිතව ආරම්භ වූ අතර මෙම නිවාස යෝජනා ක්‍රම දෙකෙහිම පුනස්ථාපන කටයුතු 2012 වර්ෂය තුලදී ද කරගෙන යාමට නියමිතය.

# ඉංජිනේරු සේවා

**කොළඹ අවට නිවාස ක්‍රමවල හදිසි අළුත්වැඩියාවන් සහ නඩත්තු කටයුතු**

කොළඹ නාගරික සීමාබද ප්‍රදේශවල වසර 10 කට වඩා වැඩි කලකට පෙර ඉදිකිරීම් කරන ලද බොහෝ නිවාස ක්‍රමවලට සේවා සැපයීම ජාතික ජල සම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය සහ කොළඹ මහනගර සභාව මගින් සිදුකරනු ලැබේ. නිවාස විකුණා හෝ එසේ නැතිනම් කුළී පදනම මත පැවතිය ද එම නිවාස පද්ධතිය තුල ජල නල පද්ධති, මලප්‍රවාහන පද්ධති සහ මනුවලවල් පොම්පාගාර නඩත්තු කටයුතුද මේ දක්වා ඉටු කරනු ලබන්නේ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගිනි. ජල සැපයුම් පද්ධතිය සම්බන්ධයෙන් නිතර නිතර පැමිණිලි ලැබෙන හෙයින්, හදිසි අළුත්වැඩියාවන් සහ නඩත්තු කටයුතුවල සෘජුව සම්බන්ධ විය හැකි පරිදි අළුත්වැඩියා හා නඩත්තු ඒකකයක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය තුල පිහිටුවා එය දවසේ පැය 24 පුරා ම ක්‍රියාත්මකව පවතී. මෙම ඒකකය මගින් සාමාන්‍යයෙන් මාසයකට සිදු කෙරෙන හදිසි අළුත්වැඩියාවන් සංඛ්‍යාව 100 ඉක්මවනු ලබන අතර ඒ සඳහා වැයවන මුදල රුපියල් මිලියන 1.30 කි. (ආසන්න වශයෙන්) තවද, මලප්‍රවාහන පද්ධති සහ මල පොම්පාගාර හා කැලිකසල බැහැර කිරීම කොන්ත්‍රාත්කරුවන් යොදා සිදු කරනු ලබයි. ේ සඳහා 2011 වසර තුල රු.මි.4.2 වැය කර ඇත.

## දිස්ත්‍රික් කාර්යාල සඳහා ගොඩනැගිලි ඉදිකිරීම්

යුධමය වාතාවරණයක් පැමිණි ප්‍රදේශවල ඇති දිස්ත්‍රික් කාර්යාල කුලී හෝ බදු පදනම මත පවත්වාගෙන යනු ලැබුවෙන්, දීර්ඝකාලීනව මේවාට කුලීගෙවීමේ දී මහත් ගැටළු සහිත තත්වයන් සහ කාර්යාලයන් තුල අඩු ඉඩ ප්‍රමාණයන් හේතුවෙන් මේවායේ සේවය කල කාර්යය මණ්ඩලයටද  මහත් දුෂ්කරතාවන්ට  මුහුණ දීමට සිදුවිය. එබැවින් පළමුවන අදියර වශයෙන් මුලතිව් දිස්ත්‍රික්කය සඳහා කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීමට රු.මි.10 ක ප්‍රතිපාදන සහිතව 2010 වර්ෂයේ දී ඉදිකිරීම් කටයුතු ආරම්භ කල අතර 2011 පෙබරවාරි 05 වන දින අවසන් කරන ලදී.

## සහස්‍රලංකා වැඩ සටහන යටතේ තිබූ නිවාස සංවර්ධන ව්‍යාපෘති

සහස්‍රලංකා නිවාස වැඩ සටහන වනාහි මධ්‍යම පන්තික ආදායම්ලාභීන් වෙනුවෙන් සිය නිවාස අවශ්‍යතාවයන් සපුරාලීම පිණිස පිහිටවනු ලැබූ ක්‍රමවේදී වැඩ සටහනකි. රාජ්‍ය හා පුද්ගලික අනුබද්ධිත ක්‍රමය සහ පෙර විකුණුම් පදනම මත ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර ඇත.

මෙම වැඩ සටහන යටතේ ඇල්විටිගල නිවාස යෝජනා ක්‍රමයෙහි රු.මි.32 වටිනාකමකින් යුත් නිවාස ඒකක 04 ක් ගොඩනැගීමේ කටයුතු 2011 අගෝස්තු 16 වෙනි දින ආරම්භ කරන ලදී.

කුරුණෑගල වෙලන්ගොල්ල වත්තෙහි නිවාස ඒකක 23 ක් ගොඩනැගීම සඳහා මුල්ගල තැබීමේ කටයුතු 2011 නොවැම්බර් 24 දින සිදුකල අතර එහි ඇස්තමේන්තුගත මුල්‍ය වටිනාකම රු.මි.180 කි.

ලුවිසාවත්ත නිවාස යෝජනා ක්‍රමයෙහි නිවාස ඒකක 05 ක ගොඩනැගීමේ කටයුතු 2011 දෙසැම්බර් 15 දින ආරම්භ කරන ලද අතර එහි ඇස්තමේන්තුගත මුදල රු.මි.4.7 කි.

සුලෝහිතපුර නිවාස ව්‍යාපෘතිය 2011 වර්ෂයේ ආරම්භ කල අතර මෙම වැඩ සටහන යටතේ රු.මි.23 ක වටිනාකමකින් යුත් නිවාස ඒකක 16 ක ප්‍රතිස්ථාපන කටයුතු සිදු කරන ලදී.

## ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ හදිසි අළුත්වැඩියාවන්

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ 01,06,07,08 හා 09 වන මහල්වල ඇති කාර්යාල පරිශ්‍රයන්වල හදිසි අළුත්වැඩියාවන් සිදුකිරීම මේ වර්ෂය තුලදී ආරම්භ කරන ලදී. ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල රු.මි.23 කි. බිම් මහලෙහි අළුත්වැඩියා කටයුතුද තවම සිදුකරමින් පවතී. මීට අමතරව විදුලි අංශය හා නඩත්තු අංශය අත්‍යාවශ්‍ය සේවාවන් ඉටුකරනු ලබයි.

## අනෙකුත් ක්‍රියාකාරකම්

කොළඹ අවට ප්‍රදීපා ශාලා නිවාස සංවර්ධන අධිකාරියට අයත් ප්‍රධාන ආදායම් උපයාදෙන මාර්ගයක්වේ. ඒ අනුව, මාලිගාවත්ත කුඩා ප්‍රදීපාශාලාවේ හදිසි අළුත්වැඩියා රු.මි. 1.5 ප්‍රතිපාදන සහිතව 2011 ඔක්තෝබර් මස 12 දින ආරම්භ කරන ලදී.

2010 දෙසැම්බර් 15 දින ආරම්භකරන ලද කතරගම සංචාරක බංගලාවේ නවීකරණ කටයුතු රු.මි. 3..5 ක වියදමින් 2011 පෙබරවාරි මස 04 දින අවසන් කරන ලදී.

අනුරාධපුර සංචාරක බංගලාවේ හදිසි අළුත්වැඩියා කටයුතු රු.මි.7.5 ක මුදල් ප්‍රතිපාදන සහිතව 2011 ඔක්තෝබර් මස 07 වෙනි දින ආරම්භ කරන ලදී.

තවද, දිස්ත්‍රික් කාර්යාලවලින් සිදුකරන ඉදිකිරීම් නඩත්තු කටයුතු සඳහා වූ ඇස්තමේන්තු පරීක්ෂා කර අනුමත කිරීම ද ඉංජිනේරු සේවා අංශය මඟින් සිදුකරනු ලැබේ.

මානව සම්පත් කළමනාකරණ හා පාලන කොට්ඨාශය පහත සඳහන් අංශවලින් සමන්විතවේ.

1. මානව සම්පත් අංශය
2. පාලන අංශය
3. විනය අංශය
4. ප්‍රවාහන අංශය
5. සැපයුම් අංශය
6. පුහුණු අංශය
7. මාණ්ඩලික නිවාස අංශය
8. ආරක්ෂක අංශය

## ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සැලැස්ම

ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය,සභාපති/උප සභාපති/ සාමාන්‍යාධිකාරි/ ක්‍රියාකාරි අධ්‍යක්ෂ හා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි කොට්ඨාශ 09ක් යටතේ වෙන්කර ඇත. මීට අමතරව දිස්ත්‍රික් කාර්යාල 25ක් හා කොළඹ නගර කාර්යාල 02 ක් හා කල්මුණේ උප කාර්යාලයක් ද පිහිටුවා ඇත.

**02. 2011 වර්ෂයට අනුමත කාර්යාලය**

| | | | |
|---|---|---|---|
| I. | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම | = | 114 |
| II. | තෘතිය කළමනාකරණ මට්ටම | = | 143 |
| III. | ද්විතිය කළමනාකරණ මට්ටම | = | 913 |
| IV. | ප්‍රාථමික මට්ටම | = | 205 |
| | එකතුව | = | 1375 |

**03. 2011/12/31 දිනට සිටි කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර**

| | | | |
|---|---|---|---|
| I. | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම | = | 67 |
| II. | තෘතීය කළමනාකරණ මට්ටම | = | 119 |
| III. | ද්විතිය කළමනාකරණ මට්ටම | = | 1411 |
| IV. | ප්‍රථමික මට්ටම | = | 276 |
| | එකතුව | = | 1873 |

**04. 2011 වර්ෂය තුල දී පහත සඳහන් පරිදි බඳවා ගැනීම් කර ඇත.**

I. සේවයෙන් විශ්‍රාම ගන්වා නැවත කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම

| | | |
|---|---|---|
| විධායක | - | 01 |
| විධායක නොවන | - | 03 |

II. සෘජුව කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම්

| | | |
|---|---|---|
| දෛනික දීමනා පදනම මත | - | 29 |

III. ස්ථිර සේවයට බඳවා ගැනීම් - නැත

**05. උසස්වීම්**

2011 වර්ෂය තුල දී ලබා දෙන ලද උසස්වීම් සම්බන්ධ විස්තර පහත දක්වා ඇත.

| | | | |
|---|---|---|---|
| 1) | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම | = | 58 |
| 2) | තෘතීය කළමනාකරණ මට්ටම | = | 25 |
| 3) | ද්විතීය කළමනාකරණ මට්ටම | = | 368 |
| 4) | ප්‍රාථමික මට්ටම | = | 90 |
| | එකතුව | = | 541 |

**06. විශ්‍රාම ගැන්වීම**

2011 වර්ෂය තුල දී විශ්‍රාම ගන්වන ලද සහ කොන්ත්‍රාත් පදනම මත සේවය අවසන් කරන ලද සංඛ්‍යාව පහත දැක්වේ.

| | | | |
|---|---|---|---|
| 1) | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම | = | 01 |
| 2) | තෘතීය කළමනාකරණ මට්ටම | = | 11 |
| 3) | ද්විතීය කළමනාකරණ මට්ටම | = | 82 |
| 4) | ප්‍රාථමික මට්ටම | = | 18 |
| | එකතුව | = | 112 |

# මානව සම්පත් කළමණාකරණ

07. **2011 වර්ෂයේ දී ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සේවයෙන් ඉල්ලා අස් වී ඇති කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දක්වා ඇත.**

| | | | |
|---|---|---|---|
| 1) | ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මට්ටම | = | - |
| 2) | තෘතීය කළමනාකරණ මට්ටම | = | 08 |
| 3) | ද්විතීය කළමනාකරණ මට්ටම | = | 20 |
| 4) | ප්‍රාථමික මට්ටම | = | - |
| | එකතුව | = | 28 |

08. **කාර්මික විද්‍යාල විශ්ව විද්‍යාලවල ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ප්‍රායෝගික පුහුණුව ලබා දීම. 2011 වර්ෂය තුල පහත පරිදි පුහුණුවීම් ලබා දී ඇත.**

| | 2010 වසර තුළ බඳවා ගෙන 2011 තුළ අවසන් | 2011 වසර තුළ බඳවා ගත් |
|---|---|---|
| 1. ලඝු යතුරු ලේඛක/ලේකම්කරණය | 02 | 02 |
| 2. පරිගණක පුහුණුව | 12 | 11 |
| 3. විදුලි කාර්මික | 03 | - |
| 4. ගණක ශිල්පය / ගිණුම් ලිපිකරු | 02 | 02 |
| 5. ප්‍රමාණ සමීක්ෂක | 02 | 03 |
| 6. සැලසුම් ශිල්පී / ගෘහ නිර්මාණ | - | 06 |
| 7. ඉංජිනේරු සැලසුම් ශිල්පය | - | - |
| 8. තොරතුරු තාක්ෂණය | 02 | 03 |
| 9. ලිපිකරු | - | 01 |
| 10. කළමනාකරණ පුහුණු (උපාධි අභ්‍යාසලාභී) | - | 07 |
| එකතුව | 23 | 35 |

09. **මෙම අධිකාරියේ සේවයේ නියුතුව සිටිය දී 2011 වර්ෂය තුල දී මරණයට පත් වූ අය පහත සඳහන් පරිදි වේ.**

1. එම්. ඉෂඩ්. ඉෂඩ්. නිසාරා මිය - සහකාර කළමනාකරු - VI ශ්‍රේණිය
2. බී. විජේවන්ත මයා - ආරක්ෂක නිලධාරි - VII II “අ” ශ්‍රේණිය
3. ඩබ්ලිව්. ජී. ශාන්ත මයා - මෝටර් කාර්මික - VIII ශ්‍රේණිය
4. එස්. ඒ. සිරිසේන මයා - තාක්ෂණ නිලධාරි - VII “අ” ශ්‍රේණිය

## පාලන අංශය

2011 වර්ෂයේ පාලන කොට්ඨාශයේ ඉටුකල කාර්යයන් පහත පරිදිවේ.

1. 2011 වර්ෂය වෙනුවෙන් සේවකයන් වෙත ප්‍රසාද දීමනා වශයෙන් රු.1000/- ක් හා දිරි දීමනා වශයෙන් රු.2000/- ක මුදලක් ගෙවන ලදී. වෛද්‍ය ප්‍රතිලාභ ද සාමාන්‍ය ආකාරයෙන් ගෙවීම් කර ඇත.
2. ආපදා ණය, යැපීම් දීමනා, නිවාඩු දින දීමනා, සැතපුම් කුලී දීමනා හා නිලනිවාස දීමනා ගෙවීම් කටයුතු හා කුලී දීමනා ගෙවීම් කටයුතු සුපුරුදු පරිදි ගෙවීම් කර ඇත.

## මාණ්ඩලික නිවාස ණය

2011 වර්ෂය සඳහා රු.මි.84.250 ක් මාණ්ඩලික නිවාස ණය සඳහා ප්‍රතිපාදන වශයෙන් ලැබුණි. ප්‍රධාන කාර්යාලය සඳහා රු.මි.27.000 ක් ද දිස්ත්‍රික් කාර්යාල සඳහා රු.මි. 57.250 ක් ද වශයෙනි.

02. එම ප්‍රතිපාදනවලින් පහත සඳහන් ආකාරයට නිවාස ණය මුදල් අනුමත කර ඇත.

| ශ්‍රේණිය | ප්‍රධාන කාර්යාලය රු. | දිස්ත්‍රික් කාර්යාලය රු. | ගෙවා ඇති මුළු මුදල රු. |
|---|---|---|---|
| 1 - VI | 3,797,000 | 900,000 | 4,697,000 |
| VII – VII ඒ | 1,347,330 | 3,769,100 | 5,116,430 |
| VIII –IX | 2,582,600 | 8,110,950 | 10,693,550 |
| X | 1,400,000 | 200,000 | 1,600,000 |
| | 9,126,930 | 12,980,050 | 22,106,980 |

03. අනුමත ප්‍රතිපාදන, වැය වූ මුදල සහ ඉතිරිය පහත දක්වා ඇත.

| කාර්යාලය | අනුමත ප්‍රතිපාදන රු. | වැය වූ මුදල රු. | ඉතිරිය රු. |
|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | 27,000,000 | 9,126,930 | 17,873,070 |
| දිස්ත්‍රික් කාර්යාලය | 57,250,000 | 12,980,050 | 44,269,950 |
| | 84,250,000 | 22,106,980 | 62,143,020 |

2011 වර්ෂය සඳහා ප්‍රධාන කාර්යාලයේ නිවාස ණය ලබාදී ඇති සේවක සංඛ්‍යාව - 23
2011 වර්ෂයේ දිස්ත්‍රික් කාර්යාල සඳහා නිවාස ණය ලබා දී ඇති සේවක සංඛ්‍යාව - 34
මුළු ගණන 57

# විනය කටයුතු

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු අරමුණු හා පරමාර්ථයන් කරා මානව සම්පත මෙහෙයවීමේ දී අපේක්ෂා කරනු ලබන පැවැත්ම ඒ ආකාරයෙන් පවත්වා ගෙනයාමට අපොහොසත් වන අවස්ථාවන්හිදී ඒ සම්බන්ධයෙන් විනයානුකූල ක්‍රියාමාර්ග ගැනීම හා විනයගරුක කාර්ය මණ්ඩලයක් බිහිකිරීම උදෙසා කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම විනය කටයුතු අංශයේ මූලික කාර්යභාරයවේ.

02. මෙහිදී ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ විනය ව්‍යවස්ථා මාලාව, ආයතන සංග්‍රහයේ 11 වන කාණ්ඩය, පාලන කාර්ය සංග්‍රහය, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය මඟින් විනය කටයුතු සම්බන්ධයෙන් වරින්වර නිකුත් කර ඇති චක්‍රලේඛ හා අධිකාරිය තුල වරින්වර නිකුත් කර ඇති චක්‍රලේඛ නිර්ණායකයන් ලෙස භාවිතා කරනු ලබයි.

03. 2011 වර්ෂයේ විනය කටයුතු අංශයේ කාර්යභාරය හා ඉලක්කගත කාර්යභාරය පහත සඳහන් පරිදිවේ.

උසස් අන්දමේ හැසිරීමක් ඇති තම තමන්ගේ රාජකාරි හා වගකීම් හඳුනාගත් විනය ගරුක සේවක පිරිසක් බිහිකිරීමට උපකාරිවීම.

අභ්‍යන්තර විගණන අංශය, විමර්ශන අංශය හෝ ආරක්ෂක අංශය මඟින් කළමණාකාරිත්වය වෙත ඉදිරිපත් කරනු ලබන විගණන වාර්තා හා මූලික විමර්ශන වාර්තාවන්හි ඇතුලත් නිර්දේශ අනුව විනය විරෝධී ක්‍රියාවන්වල (බරපතල හා සුළු විෂමාචාර ක්‍රියා) නිරතවී ඇති බවට වාර්තාවී ඇති නිලධාරීන්ට/සේවකයින්ට එරෙහිව චෝදනාපත්‍ර නිකුත් කිරීම හා නිදහසට කරුණු විමසීම් ලිපි නිකුත් කරමින් විනය කටයුතු ආරම්භ කිරීම.

බරපතල විෂමාචාරයන් සම්බන්ධයෙන් චෝදනා පත්‍ර නිකුත් කල නිලධාරීන්ට/සේවකයින්ට විරුද්ධව විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීම සඳහා පරීක්ෂණ මණ්ඩල පත්කිරීමට නිර්දේශ කිරීම හා විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම.

විධිමත් විනය පරීක්ෂණ අවසානයේදී විනය පරීක්ෂණ නිලධාරියා විසින් ලබාදෙනු ලබන වාර්තා අධ්‍යයනය කර කළමණාකාරිත්වය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම හා කළමණාකාරිත්වය විසින් ගනු ලැබූ අවසන් තීරණ අනුව විනය නියෝග නිකුත් කිරීමට කටයුතු කිරීම.

සුළු විෂමාචාර ක්‍රියා සම්බන්ධයෙන් නිදහසට කරුණු විමසන ලද නිලධාරීන් හා සේවකයින් සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් හා කළමණාකාරිත්වයේ තීරණ මත විනය නියෝග නිකුත් කිරීම.

මෙම අධිකාරියේ නිලධාරීන්/සේවකයින් සම්බන්ධයෙන් ගනු ලබන විනය ක්‍රියා මාර්ග පිළිබඳව සේවක විනය අභියාචනා කමිටුව, කම්කරු විනිශ්චය සභාව, කම්කරු දෙපාර්තමේන්තුව හා කළමණාකාරිත්වය වෙත තොරතුරු ලබාදීම.

මෙම අධිකාරියේ නිලධාරීන් /සේවකයින් සම්බන්ධ විනය වාර්තා පවත්වාගෙනයාම හා ඒ සම්බන්ධ තොරතුරු කළමණාකාරිත්වයේ විමසීම්වලට අනුව ඉදිරිපත් කිරීම.

මානව සම්පත් කළමණාකරණ, පාලන හා මාණ්ඩලික නිවාස ණය යන අංශවලින් කරනු ලබන විමසීම්වලට අනුව මෙම අධිකාරියේ නිලධාරීන් / සේවකයින්ගේ විනය කරුණු සම්බන්ධ තොරතුරු ලබාදීම.

විනය පරීක්ෂණ මණ්ඩල සාමාජිකයන් සඳහා ගමන් වියදම් හා ගාස්තු ගෙවීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම.

විනය කාර්ය කළමණාකරණය සම්බන්ධයෙන් කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා විනය කාර්ය වැඩමුළු පැවැත්වීම.

04. ඒ අනුව 2011 වර්ෂය තුල විනය කටයුතු සම්බන්ධයෙන් සාරාංශගත වාර්තාව පහත සඳහන් පරිදිවේ.

## බරපතල විෂමාචාර ක්‍රියා

| අනු අංකය | විස්තරය | | සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | **මුළු වාර්තාවීම්** | | |
| | 1.1 2011.01.01 දිනට වාර්තාවීම් | 38 | 44 |
| | 1.2 2011 වර්ෂයතුල වාර්තාවීම් | 06 | |
| 02 | **2011.01.01 දිනට අවසන් නොවූ විධිමත් විනය පරීක්ෂණ** | | |
| | 1.1 2011 වර්ෂයතුල අවසන් වූ විධිමත් විනය පරීක්ෂණ | 09 | 17 |
| | 1.2 2011.12.31 දිනට අවසන් නොවූ විධිමත් විනය පරීක්ෂණ | 08 | |
| 03 | 2011.01.01 දිනට වැඩ තහනම්ව සිටි සංඛ්‍යාව | | 17 |
| 04 | 2011 වර්ෂය තුල වැඩ තහනම් කල සංඛ්‍යාව | | 01 |
| 05 | **2011 වර්ෂය තුල ආරම්භකළ විධිමත් විනය පරීක්ෂණ** | | |
| | 1.1 2011 වර්ෂය තුල අවසන් වූ විධිමත් විනය පරීක්ෂණ | 02 | |
| | 1.2 2011.12.31 දිනට අවසන් නොවූ විධිමත් විනය පරීක්ෂණ | 05 | 07 |
| 06 | 2011 වර්ෂය තුල විනය නියෝග නිකුත් කළ සංඛ්‍යාව | | 10 |
| 07 | 2010 වසර තුල සේවයෙන් පහකිරීම් | | නැත |
| 08 | විධිමත් විනය පරීක්ෂණවලින් තොරව දඬුවම් ලබාදුන් සංඛ්‍යාව | | 06 |
| 09 | 2011 වර්ෂය තුල නිදහසට ඉදිරිපත් කරන ලද කරුණු / විනය පරීක්ෂණවලින් නිදහස්වීම මත විනය කටයුතු අවසන් කල සංඛ්‍යාව | | 09 |
| 10 | 2011 වර්ෂය තුල නැවත සේවයේ පිහිටවූ සංඛ්‍යාව | | 05 |
| 11 | 2011.12.31 දිනට අවසන් නොවූ මුළු විනය කරුණු සංඛ්‍යාව | | 19 |

## සුළු විෂමාචාර ක්‍රියා

| අනු අංකය | විස්තරය | | සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | 2011.01.01 දිනට අවසන් නොවූ සංඛ්‍යාව | | |
| | 1.1 2011 වර්ෂය තුල අවසන් වූ සංඛ්‍යාව | 03 | 03 |
| 02 | **2011 වර්ෂයේ ආරම්භ කල සංඛ්‍යාව** | | |
| | 1.1 අවසන් වූ සංඛ්‍යාව | 07 | |
| | 1.2 අවසන් නොවූ සංඛ්‍යාව | 05 | 12 |
| 03 | දඬුවම්වලට යටත්ව විනය කරුණු අවසන් කිරීම් | | 02 |
| 04 | නිදහසට ඉදිරිපත් කර ඇති කරුණු පිළිගෙන විනය කරුණු අවසන් කිරීම් | | 05 |
| 05 | අවවාද / තරයේ අවවාද කිරීම් | | 03 |

# ආරක්ෂක සේවා

## සම්පාදනය කල ඉලක්ක

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ආරක්ෂක අංශය ලෙස අධිකාරිය සතු චංචල / නිශ්චල දේපල හා මානව සම්පත් ආරක්ෂා කිරීම, ආයතනික කීර්තිනාමය සේවක විනය ආරක්ෂා කිරීම සඳහා පූර්ණ ශක්තිය හා ක්‍රමවේදයන් යොදා කටයුතු කරනු ලැබීය.

02. 2010 වසර අවසාන භාගය වනවිට දිවයින තුල පැවති ත්‍රස්තවාදී ක්‍රියාකාරකම් අවසන්ව පැවතියත්, ආයතනික වශයෙන් ආරක්ෂක සේවා මුලින්ම පැවති තත්වයෙන්ම පවත්වා ගෙන යාමට සිදුවිය.

03. 2010 වසරේ ජනවාරි මස වනවිට ආරක්ෂක කාර්ය මණ්ඩලයේ සේවක පිරිස ප්‍රධාන කාර්යාලය/ දිස්ත්‍රික් කාර්යාල ද ඇතුළුව සංඛ්‍යාව 164 ක්වූ අතර, මේවනවිට වයස 57 සම්පූර්ණවීම නිසා විශ්‍රාම ගැන්වීම හේතුවෙන් හා මියයාම හේතුවෙන් 138 දක්වා අඩු වී ඇත. තත්වය එසේ තිබියදී ආරක්ෂක සේවා අඛණ්ඩව පවත්වාගෙන යාමට කටයුතු කර ඇත.

04. ප්‍රධාන කාර්යාලය හා ප්‍රධාන කාර්යාලයෙන් පාලනය වන සේවා ස්ථාන කීපයක් සඳහා ආරක්ෂක නිලධාරීන් විවිධ ආරක්ෂක ක්‍රම උපයෝගී කරගෙන ආරක්ෂාව තහවුරු කරනු ලැබීය. එසේ ආරක්ෂක නිලධාරීන් යෙදවූ සේවා ස්ථාන මෙසේය.

1. ජල්තර රජයේ සේවක නිවාස ව්‍යාපෘතිය
II. මාලිගාවත්ත ලොකු / කුඩා ප්‍රදිපා ශාලා
III. මෝදර/ගුණසිංහපුර ප්‍රදීපා ශාලා
IV. නාරහේන්පිට 117 වත්ත නිවාස යෝජනා ක්‍රමය
V. සොයිසාපුර කලාප කාර්යාලය
VI. රත්මලාන වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් පවරාගත් ඉඩම

## ඉලක්ක සපුරා ගැනීමට ගත් ක්‍රියාමාර්ග හා ප්‍රතිඵල

01. ප්‍රධාන කාර්යාලය ඇතුළුව නිවාස මහලේකම් ගොඩනැගිල්ලේ පිහිටි කාර්යාලය සඳහා පැමිණෙන සියළුම වාහන හා පුද්ගලයින්, ගමන්මළු ආදිය පරීක්ෂාවට ලක්කිරීම.

02. ආරක්ෂක අංශයේ වගකීම් හා කාර්ය භාරය සම්බන්ධ ව ආරක්ෂක පිරිස් දැනුවත් කිරීම සඳහා උපදෙස් පංති පැවැත්වීම හා දිස්ත්‍රික් කාර්යාල ඇතුලු සියළුම සේවා ස්ථාන සඳහා අවශ්‍ය රාජකාරි උපදෙස් ලිඛිතව නිකුත් කිරීම හා එකී උපදෙස් සම්බන්ධව අංශ ප්‍රධානීන් හා දිස්ත්‍රික් කළමණාකරුවන් දැනුවත් කිරීම.

03. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ කීර්තිනාමයට හානිකර කටයුතු වැලැක්වීම හා වංචනික ක්‍රියා හා අලාභකිරීමේ චේතනාවෙන් කෙරෙන ක්‍රියාවන් සොයාබලා වාර්තා කිරීම හා විනය පවත්වාගෙන යාමට සහායවීම.

04. සේවක/සේවිකාවන්ගේ රාජකාරියට පැමිණීම හා පිටවීම සම්බන්ධව සටහන් පවත්වාගෙනයාම හා එකී යන්ත්‍ර ආරක්ෂාව සඳහා පියවර ගැනීම.

05. අධි ආරක්ෂක කලාපයේ පිහිටි ආයතන, කොම්පඤ්ඤවීදිය පොලිස් ස්ථානය මූලිකව පවත්වාගෙන යන ආරක්ෂක කමිටු රැස්වීම්වලට සහභාගිවීම හා එහිදී ගනු ලබන තීරණ හා ලබාදෙන උපදෙස් පරිදි කටයුතු කිරීම, ඒ සම්බන්ධව ආරක්ෂක පිරිස් දැනුවත් කිරීම.

06. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ මුල්‍ය තත්වයන් සැලකිල්ලට ගෙන පාලනාධිකාරියේ තීරණ මත සේවා ස්ථාන සඳහා ආරක්ෂක පිරිස් යෙදවීම අවමකර ගැනීම, අතිකාල අවම කරගැනීමට කටයුතු කිරීම.

07. නිවාස මහලේකම් ගොඩනැගිල්ලේ ආරක්ෂාව සඳහා ගිනිඅවි සන්නද්ධ ආරක්ෂක නිලධාරීන් සේවයේ යෙදවීම.

08. හදිසි ගින්නකට මුහුනදිම සඳහා අවශ්‍ය අධිබල ගිණි නිවාරණ ජලනල පද්ධතියක අවශ්‍යතාවය නැවත, නැවත අවධාරණය කිරීම හා එය ක්‍රියාත්මක කර ගැනිම සඳහා ඉල්ලිම් ඉදිරිපත් කිරීම.

09. උසාවි නියෝග ලබාගත් අනවසර පදිංචිකරුවන් ඉවත්කිරීමේ මෙහෙයුම් සඳහා ආරක්ෂක නිලධාරීන් සහභාගි කරවීම හා හිස් භුක්තිය බාරගන්නා ලද එකී නිවාසවලට නැවත ඇතුළුවීම වැලැක්විම සඳහා අවශ්‍ය ආරක්ෂක කටයුතු සංවිධානය කිරීම හා ක්‍රියාවට නැංවීම (හිඹුටු උයන - සොයිසාපුර නිවාස ක්‍රමවල මෙකී කටයුතු විශේෂ අවස්ථා ලෙස සලකා ඉටු කිරීමට සිදුවිය.)

# ප්‍රවාහන අංශය

**සම්පාදිත ඉලක්ක**

01. ප්‍රවාහන සංචිතයේ බස් රථ/වෑන් රථ සුහසාධක පදනම මත ලබාදීම වෙනුවෙන් (නිලධාරි ප්‍රවාහනය ඇතුළුව ) රු.13,02,480/- ක මුදලක් ඇස්තමේන්තුගත කරන ලදී.

02. ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් සියළුම වාහන අළුත්වැඩියාව සඳහා රු.5,000,000/- ක මුදලක් ඇස්තමේන්තුගත කරන ලදී.

03. වාහන රක්ෂණ ගාස්තු වශයෙන් රු.2,500,000/- ක මුදලක් ඇස්තමේන්තුගත කර ඇත.

04. ප්‍රවාහන සංචිතයේ සියළුම වාහන වෙනුවෙන් ඉන්ධන සඳහා ඇස්තමේන්තු මුදල රු.7,000,000/- කි.

05. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සියළුම වාහන වෙනුවෙන් ආදායම් බලපත්‍ර වෙනුවෙන් රු.500,000/- ක් ඇස්තමේන්තු ගත කරන ලදී.

**ඉලක්ක සපුරා ගැනීමට ගත් ක්‍රියාමාර්ග හා ප්‍රතිඵල**

01. ප්‍රවාහන සංචිතයේ බස් රථ/වෑන් රථ සුහසාධක පදනම මත ලබාදීමෙන් හා නිලධාරි ප්‍රවාහනයෙන් ලැබූ ආදායම රු.836,267/-කි. නිලධාරි ප්‍රවාහන බස්රථවල ගමන් ගන්නා නිලධාරීන් අඩුවීම හේතුවෙන් ලැබූ ආදායම ද අඩුවීමක් සිදුවී ඇත,

02. අධිකාරියට අයත් සියළුම වාහන අළුත්වැඩියා හා නඩත්තු සඳහා රු 4,839,421/- ක මුදලක් වැය වී ඇත, ඇස්තමේන්තු ගත කල මුදලට වඩා අඩු වී ඇත.

03. වාහන රක්ෂණ ගාස්තු වශයෙන් රු.1,715,925/-ක මුදලක් ගෙවීම් කර ඇති බැවින්, ඇස්තමේන්තු ගත කල මුදලට වඩා අඩු අගයක් ගනී.

04. ප්‍රවාහන සංචිතයේ සියළුම වාහන වෙනුවෙන් ඉන්ධන සඳහා රු.7,188,860/- ක මුදලක් වැය වී ඇත. එකී මුදල ඇස්තමේන්තු ගත කල මුදලට වඩා වැඩි වී ඇත.

05. අධිකාරියේ සියළුම වාහන වෙනුවෙන් ආදායම් බලපත්‍ර සඳහා වියදම් වූ මුදලරු.420,000/- කි.

# පුහුණු අංශය

**පුහුණු අංශය**

1. <u>සම්පාදිත ඉලක්ක</u> — <u>සංඛ්‍යාව</u>

| | |
|---|---|
| 1.1 අභ්‍යන්තර පුහුණු වැඩසටහන් (05) | 247 |
| 1.2. බාහිර පුහුණු පාඨමාලා (දේශීය) (14) | 49 |
| 1.3 ස්වාභිමත පුහුණු වැඩ සටහන - පාඨමාලා(11) | 17 |

2. පුහුණු වැඩ සටහන් සැකසීමේ දී, ආයතනයේ අපේක්ෂිත අරමුණු සහ ඉටුකරගන්නා ලද අරමුණු අතර පරතරය පියවීමටසේවක පුහුණුවකින් කල හැකි කාර්යභාරය හඳුනාගෙන ඒ සඳහා පුහුණු වැඩ සටහන් සකස් කිරීම.

තමා කරන ක්ෂෙත්‍රය පිළිබඳ ගන්නා ලද දැනීම තුලින් කාර්යඵලය වැඩිකර වර්තමානයේ මුහුණදීමට ඇති අභියෝග හා ඊට මුහුණ දීමේ ක්‍රමවේදයන් අනුගමනය කොට ඉදිරිදැක්මක් තුල ක්‍රියාකාරි පිරිසක් මෙම පුහුණුවන්නන් තුලින් බිහිකිරීම.

සමස්ථ කාර්ය මණ්ඩලයට ඉංග්‍රීසි/දෙමළ භාෂා පුහුණුව, දිස්ත්‍රික් කාර්යාල ද ඇතුලත්ව ලබා දී ඇත. දිස්ත්‍රික් කාර්යාල ද ඇතුලුව ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් සඳහා විභාග කාල සටහන් මත අධ්‍යයන නිවාඩු දින 10 ක් උපරිමය යටතේ නිලධාරීන් 29 දෙනෙකුට නිවාඩු ලබා දී පාඨමාලාවන්ට යොමු කර ඇත.

# 2011 වර්ෂයේ මානව සම්පත් කළමනාකරණ හා පාලන කොට්ඨාශය ලබාගත් ජයග්‍රහණ

2011 වර්ෂය තුල ඉහත අංශ තුළින් මානව සම්පත් කළමනාකරණ කොට්ඨාශය ලබාගෙන ඇති විශේෂ ජයග්‍රහණ.

## 1. මානව සම්පත් අංශය

### 1.1 අභ්‍යන්තර උසස්වීම්

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ 111, IV සහ V ශ්‍රේණිවල කළමනාකරණ ක්ෂේත්‍රයේ තනතුරු හැර අනිකුත් සියළුම තනතුරු සඳහා 2007 වර්ෂයෙන් පසු අභ්‍යන්තර උසස්වීම් ලබා දී නොතිබූ අතර, විධිමත් සම්මුඛ පරීක්ෂණ තුලින් පහත සඳහන් පරිදි අභන්තර උසස්වීම් 541 ක් ලබාදීම තුලින් සේවක අභිප්‍රේරණ ක්‍රියාවලියේ විශේෂ ජයග්‍රහණයක් ලබා ඇත.

| තනතුරු මට්ටම | | උසස්වීම් සංඛ්‍යාව |
|---|---|---|
| සේවක කළමනාකරණ මට්ටම | - | 58 |
| තෘතීය කළමනාකරණ මට්ටම | - | 25 |
| ද්විතීය කළමනාකරණ මට්ටම | - | 368 |
| ප්‍රාථමික මට්ටම | - | 90 |
| එකතුව | | 541 |

### 1.2 සේවක අභියාචනා කමිටුවක් පත් කිරීම

සේවකයන්ගේ උසස්වීම්, ස්ථාන මාරුවීම් වැනි විවිධ අවශ්‍යතා ඉටුනොවීම සහ විෂමාචාරයන් හේතුවෙන් ලබා දී ඇති විනය නියෝග සාධාරණීය කරගැනීම සඳහා විධිමත් ක්‍රියාවලියක් නොමැතිවීම මත අසහනකාරි තත්වයට පත්ව සිටි සේවකයන්ගේ අභියාචනා සලකා බැලීම සඳහා පහත සහන් නිලධාරීන්ගෙන් සමන්විත සේවක අභියාචනා කමිටුවක් පත්කර ඇත.

| | | |
|---|---|---|
| ජාතික නිවාස කොමසාරිස් සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික | - | කමිටු සාමාජික |
| උප සභාපති | - | කමිටු සාමාජික |
| ක්‍රියාකාරි අධ්‍යක්ෂ | - | කමිටු සාමාජික |
| නීති නිලධාරි (කැඳවුම්කරු) | - | කමිටු ලේකම් |

2011 වර්ෂය තුළ සමාලෝචනය කරන ලද අභියාචනා සංඛ්‍යාව 20 කි.

දිගුකාලීනව විසඳුම් නොලබමින් රැඳී පවතින සේවක අභියාචනා සඳහා මෙම කමිටුව මඟින් සාධාරණ විසඳුම ලබාදීම තුලින් සේවක අභිප්‍රේරණ ක්‍රියාවලියේ නව ප්‍රවණතාවයක් ලබාගැනීම මානව සම්පත් කළමනාකරණ කොට්ඨාශය ලැබූ විශේෂ ජයග්‍රහණයකි.

### 1.3 කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 හි විධි විධාන යටතේ අවුරා තිබූ වැටුප් වර්ධක ගෙවීම

කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 හි විධි විධාන යටතේ බඳවා ගැනීම් පරිපාටිය සකස් කර, අනුමත කරවාගෙන උසස්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කරන තෙක්, ගෙවීම අවුරා තිබූ වැටුප් වර්ධක 2007 වර්ෂයේ සිට වැටුප් තලව පිහිටුවා 2011 වර්ෂයේ සිට හිඟ වැටුප් සහිතව ගෙවීමට කටයුතු කරන ලදී. ප්‍රතිලාභ ලැබී සංඛ්‍යාව 220කි.

## 2. පුහුණු අංශය

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පුහුණු වැඩසටහන් බොහෝදුරට මධ්‍යම කළමනාකරණ මට්ටමෙන් ඉහල තනතුරු සඳහා පමණක් සීමා වී තිබූ අතර, නව ප්‍රවණතාවක් ලබාදෙමින් ලිපිකරු හා සමාන්තර ශ්‍රේණිවල සේවකයන් සහ ප්‍රාථමික ගණයේ සේවකයන් විවිධ ක්ෂේත්‍ර යටතේ පුහුණුව ලබාගැනිම සඳහා යොමුකරන ලදී.

ඒ අනුව 2011 වර්ෂය තුල පහත සඳහන් පරිදි පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කර ඇති.

| අනු අංකය | පුහුණු වැඩ සටහන | ක්‍රියාත්මක කළ වැඩ සටහන් සංඛ්‍යාව | සහභාගිකල සේවක සංඛ්‍යාව | වැය කල මුදල රු. |
|---|---|---|---|---|
| 01 | අභ්‍යන්තර පුහුණු වැඩ සටහන | 05 | 247 | 73,000/- |
| 02 | බාහිර පුහුණු වැඩ සටහන | 14 | 49 | 171,450/- |
| 03 | ස්වාභිමත පුහුණු වැඩ සටහන | 11 | 14 | 351,800/- |
| | එකතුව | 30 | 310 | 596,250/- |

ඒ අනුව ඉතා දිගුකාලීනව එමෙන්ම මුළු සේවා කාලය තුළම කිසිම පුහුණුවකට යොමු නොවූ සේවකයන් පිරිසක් 2011 වර්ෂය තුල දී විවිධ ක්ෂේත්‍ර තුළ පුහුණුවක් ලබාදීමෙන් පුහුණුව ලත් ක්‍රියාශීල මෙන්ම තෘප්තිමත් සේවකයන් පිරිසක් බිහිකිරීම තුලින් කාර්ය සාධනය වේගවත් කිරීමට හැකිවීම මානව සම්පත් කළමනාකරණ කොට්ඨාශය ලත් තවත් ජයග්‍රහණයකි.

3. **ප්‍රවාහන අංශය**

දිස්ත්‍රික් කළමනාකරුවන් සඳහා ප්‍රවාහන අංශය මගින් කැබ් රථ 18 ක් සහ තාක්ෂණ නිලධාරීන් සඳහා යතුරුපැදි 134 ක් ලබාගෙන ඇති අතර, එය 2012 වර්ෂයටලත් ජයග්‍රහණවේ.

## නීති

අනෙකුත් අංශමෙන්ම ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීමේ දී නීති අංශයෙන් ඊට අවශ්‍ය සහයෝගය ලබාදීම සිදු කරනු ලබයි. ප්‍රධාන වශයෙන් ඉඩම් හා නිවාස සඳහා සින්නක්කර ඔප්පු ලබාදීම, එම දේපල පැවරීමේ දී අවශ්‍ය නීති උපදෙස් ලබාදීම, ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අදාල දේපල සම්බන්ධයෙන් පොදුවේ සමාජයට අගතියක් වන පැමිණිලිවලට අදාලව කටයුතු කිරීම, බාහිර පාර්ශවයන් විසින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියට එරෙහිව පවරනු ලබන මානව හිමිකම් පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කිරීම ණය හා කුලී වාරික නොගෙවන හිඟ ණය කුලී වාරික හිමියන්ට නීති මගින් කටයුතු කර අධිකාරියට ආදායම් ලබාගැනීම ආදී විවිධ කාර්යයන් නීති අංශය මගින් ඉටුකරනු ලබයි.

## ඔප්පු නිකුත් කිරීම

සම්පූර්ණ මුදල් ගෙවූ නිවාස ක්‍රමවල නිවාසලාභීන් වෙත සින්නක්කර ඔප්පු පිරිනැමීමේ කාර්යය ප්‍රධාන වශයෙන් සිදුකරනු ලබන කාර්යයකි. එහි දී සහාධිපත්‍ය දේපල හා සහාධිපත්‍ය දේපල නොවන නිවාස ක්‍රමවල නිවාස මෙන්ම ඉඩම් සඳහා ද සින්නක්කර ඔප්පු නිකුත් කරනු ලබයි.

| | | |
|---|---|---|
| 2011 වර්ෂය තුල සකස් කල ඔප්පු සංඛ්‍යාව | - | 2612 |
| 2011 වර්ෂය තුල ඔප්පු නිකුත් කිරීමේ ඉලක්කය | - | 5000 |
| 2011 වර්ෂය තුල ඔප්පු සකස් කිරීමට ලද ලිපිගොනු සංඛ්‍යාව | - | 2779 |

## ප්‍රධාන කාර්යාලය මගින් මෙහෙයවනු ලබන නඩු

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අණ පණත්වලට අනුව හිඟකුලී හිමියන්ට සහ අනවසර ඉදිකිරීම්කරුවන්ට, අනවසර පදිංචිකරුන්ට ජාතික නිවාස සංවර්ධන අධිකාරිය පවරනු ලබන නඩු හා ජාතික නිවාස සංවර්ධන අධිකාරියට විරුද්ධව පවරනු ලබන නඩු කටයුතු මෙහෙයවීම, නීති උපදෙස් ලබාදීම සහාධිපත්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා නීතිමය කටයුතු ඇතුළුව ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු දේපල අයුතු අයුරින් පරිහරණය කරන්නන්ට එරෙහිව නිතිමය කටයුතුවල දී ජාතික නිවාස සංවර්ධන අධිකාරිය නියෝජනය කරමින් නීති අංශය සහාය ලබා දෙයි.

එහිදී ප්‍රධාන කාර්යාලය මගින් මෙහෙය වන ලද නඩු පහත දැක්වේ

| උසාවිය | නඩු සංඛ්‍යාව |
|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 18 |
| අභියාචනාධිකරණය | 21 |
| මහාධිකරණය | 39 |
| දිසා අධිකරණය | 781 |
| මහේස්ත්‍රාත් අධිකරණය | 61 |
| කම්කරු විනිශ්චය සභාව | 12 |

මෙයට අමතරව නොතාරිස් ශාස්තු නීති නිවේදන හා නෙරපීම් නියෝග ක්‍රියාත්මක වීම තුලින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ අයකිරීම් සඳහා දායකත්වය ලබාදෙයි.

# නීති අංශය

## සැළසුම් ප්‍රගති හා අයකිරීම්

මහින්ද චින්තන ඉදිරි දැක්ම ප්‍රකාර ජාතික නිවාස සංවර්ධන අධිකාරිය නිවාස දසලක්ෂයක් සංවර්ධනය කිරීමේ මෙහෙයුම 2011 වසර සිට ආරම්භ කරන ලදී. 2011 ක්‍රියාකාරී සැළැස්ම එම ඉලක්කය පෙරදැරි කර ගෙන සකස් කරන ලදී. මෙම වර්ෂයේ ලද විශේෂ ජයග්‍රහණයක් ලෙස රාජ්‍ය බැංකු ජනසෙවණ වැඩසටහනට දායක කර ගැනීම දැක්විය හැක. 2011 වර්ෂයේ ඉලක්ක හා ප්‍රගතිය පහත දක්වා ඇත.

| | ඉලක්කය | | ප්‍රගතිය | |
|---|---|---|---|---|
| | භෞතික ඒකක | මූල්‍ය රු මි | භෞතික ඒකක | මූල්‍ය රු මි |
| ග්‍රාමීය නිවාස වැඩසටහන | 10000 | 1175 | 10829 | 1151.39 |
| ජනසෙවණ උපහාර වැඩසටහන | 6500 | 2210 | 5831 | 1411.56 |
| දැයට කිරුළ වැඩසටහන | 2469 | 182 | 1792 | 123.70 |
| සෙවණ ආධාර වැඩසටහන | 853 | 86.2 | 563 | 38.51 |
| **සහශ්‍ර ලංකා වැඩසටහන** | | | | |
| ආයෝජන ව්‍යාපෘති | 770 | 100.0 | 4 | 11.9 |
| පුනස්ථාපන ව්‍යාපෘති | 48 | 14.6 | - | |
| - | | | | |
| **සහසවිය** | | | | |
| ගංවතුර ආපදා | 6484 | 669.3 | 6466 | 248.96 |
| වෙනත් | 366 | 36.6 | 749 | 64.72 |
| | 27490 | 4493.7 | 26234 | 3049.23 |

ඉහත වැඩසටහන් වලට අමතරව 2011 අවිච්ඡේද වූ නිවාස 4336 ක වැඩකටයුතු සම්පූර්ණ කිරීම ද සිදු විය. නිවාස සංවර්ධනයට බද්ධ වූ වෙනත් වැඩසටහන් ලෙස නගමු පුරවර වැඩසටහන ,හිමිකම් ඔප්පු ලබාදීම, පවරා ගත් ඉඩම් සඳහා වන්දි ලබාදීම සහ නඩත්තු ඒකකය යන විෂයයන් සඳහා රුපියල් මිලියන 185.41 ක් වැය කරන ලදී.

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන ආදායම් මාර්ගය වන්නේ ණය අයකිරීමයි. වසර තුල ඉලක්ක කළ මුදල රුපියල් මිලියන 1299.201 ක් විය. එයින් වසර තුල රුපියල් මිලියන 1159.882 ක් අයකර ගැනීමට හැකිවිය. එය ප්‍රතිශතයක් ලෙස 92% කි. ග්‍රාමීය නිවාස අයකිරීම් ද රුපියල් මිලියන 34.508 ක් වූ අතර එය ඉලක්ක කළ මුදලේ ප්‍රතිශතයක් ලෙස 96% ක් විය. නාගරික නිවාස වාරික සහ කුළී රුපියල් මිලියන 123.116 ක් ඉලක්ක කළ අතර රුපියල් මිලියන 168.9 ක් අයකර ගැනීමට හැකි විය. එය 137% ක ප්‍රතිශතයකි.

## 2011 වර්ෂයේ ලද ජයග්‍රහණ

2011 වර්ෂය නව රජයේ සංවර්ධන කටයුතුවල ආරම්භක වර්ෂයක් විය. පැවති යුධ තත්ත්වය 2009 මැයි මස 20 දින සම්පූර්ණයෙන් නිමකල පසු සංවර්ධනයේ අරුණළු ශ්‍රී ලංකාවට උදාවිය. මෙහිදී නිවාස ක්ෂේත්‍රයේ වේගවත්ම සංවර්ධනය සනිටුහන් කරමින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ජයග්‍රහණ රැසක් අත්කරගන්නා ලදී.

විශේෂයෙන්ම නිවාස 31826 ක සංවර්ධන කටයුතුවල යෙදෙමින් මෙම වර්ෂයේ රු.මි.3217 ක ආයෝජනයක් කිරීමට හැකිවිය. මෙයින් ප්‍රතිලාභ ලැබූ පුද්ගල සංඛ්‍යාව 125000 ක පමණවිය.

නිවාස සංවර්ධනය සඳහා රු.මි.100-රු.මි.200 ත් අතර ප්‍රමාණයකට සීමාවී තිබූ රාජ්‍ය ආයෝජනය රු.මි.726 දක්වා වර්ධනය විය. වර්ෂයතුල අභ්‍යන්තර ඉපයීම් මඟින් කල ආයෝජනය රු.මි..535 ක් දක්වා ඉහල ගිය අතර අයකිරීම්වල කැපී පෙනෙන වර්ධනයක් ඇතිවිය.

මෙම වසරේ අත්කරගත් සුවිශේෂී ජයග්‍රහණය වූයේ බැංකු අරමුදල් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වැඩ සටහන් හරහා අඩු ආදායම් ලබන පවුල්වලට යොමු කිරීමට හැකිවීමය. මෙහිදී රු.මි. 2260 ක අරමුදල් සැපයීම සඳහා රාජ්‍ය බැංකු 06 ක් ගිවිසුම්ගතවිය. මෙයින් මෙම වසර තුල පවුල් 5722ක් ප්‍රතිලාභ ලැබූ අතර ඔවුන් දීර්ඝ කාලයක සිට පැවති නිවාස ප්‍රශ්නයක් අත්මුදවා ගැනීමට හැකිවිය.

2. නව රජය ප්‍රතිපත්තියක් වශයෙන් මහල් නිවාස නවීකරණය කිරීමේ අවශ්‍යතාවය පිලිගන්නා ලදී. මේ අනුව දශක ගණනාවක් පුරා නිසි නඩත්තුවක් සිදුනොවී ජරාවාස වෙමින් පැවති මහල් නිවාස සංකීර්ණ පුනර්ජීවනයක් ලබන ලදී. වසරතුල රු.මි.230 ක් රජය මෙම වැඩ සටහනට ලබාදීම අධිකාරිය ලබාගත් විශේෂ ජයග්‍රහණයකි.

අධිකාරිය සතු හිස් ඉඩම් ප්‍රමාණය පිළිබඳව තෝම්බු සකස්කර එම ඉඩම් නිසිපරිදි කළමනාකරණය කරමින් සංවර්ධනය සඳහා යොමුකිරීම වර්ෂයේ සාර්ථකව නිමකල තවත් සුවිශේෂී කාර්යයකි.

සැළසුම් ප්‍රගති
හා
අයකිරීම්

මෙහෙයුම් ප්‍රතිඵල සමාලෝචනය

## ග්‍රාමීය නිවාස ණය අයකරගැනීමේ ක්‍රියාකාරිත්වය - 2011

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රමාණය අයවැය | ප්‍රමාණය අයකිරීම් | % | රු.මි 2011.12.31 දිනට හිඟ |
|---|---|---|---|---|---|
| 1 | අනුරාධපුරය | 60.457 | 67.560 | 112 | 110.913 |
| 2 | ත්‍රිකුණාමලය | 19.055 | 23.267 | 122 | 32.238 |
| 3 | යාපනය | 27.107 | 35.713 | 132 | 28.099 |
| 4 | රත්නපුරය | 32.228 | 35.252 | 109 | 47.0937 |
| 5 | කුරුණෑගල | 81.194 | 78.380 | 97 | 60.398 |
| 6 | මාතලේ | 31.133 | 35.346 | 114 | 36.090 |
| 7 | අම්පාර | 53.113 | 52.145 | 98 | 77.697 |
| 8 | වව්නියාව | 21.644 | 22.239 | 103 | 30.595 |
| 9 | කෑගල්ල | 69.606 | 73.441 | 106 | 85.990 |
| 10 | මන්නාරම | 7.798 | 8.050 | 103 | 12.033 |
| 11 | පුත්තලම | 53.847 | 58.193 | 108 | 75.324 |
| 12 | පොලොන්නරුව | 24.002 | 30.917 | 129 | 46.416 |
| 13 | මඩකලපුව | 41.629 | 36.363 | 87 | 77.227 |
| 14 | බදුල්ල | 63.738 | 58.599 | 92 | 146.729 |
| 15 | හම්බන්තොට | 50.281 | 39.555 | 79 | 97.964 |
| 16 | කළුතර | 48.744 | 60.957 | 125 | 117.135 |
| 17 | නුවරඑළිය | 67.212 | 41.896 | 62 | 144.381 |
| 18 | ගාල්ල | 51.584 | 46.435 | 90 | 139.101 |
| 19 | මොණරාගල | 57.277 | 50.274 | 88 | 201.880 |
| 20 | මාතර | 63.245 | 69.360 | 110 | 189.163 |
| 21 | මහනුවර | 133.867 | 91.362 | 68 | 228.435 |
| 22 | කොළඹ නගර (දකුණ) | 5.805 | 3.399 | 59 | 32.014 |
| 23 | ගම්පහ | 88.640 | 55.330 | 62 | 286.735 |
| 24 | කොළඹ දිස්ත්‍රික් කාර්යාලය | 93.076 | 72.243 | 78 | 213.027 |
| 25 | කොළඹ නගර (උතුර) | 5.962 | 2.660 | 45 | 29.454 |
| 26 | මුලතිව් | 2.218 | 3.456 | 156 | 3.441 |
| 27 | කිලිනොච්චි | 4.742 | 7.490 | 158 | 5.023 |
| | මුළු එකතුව | **1,259.201** | **1,159.882** | **92** | **2,554.595** |

# ණය අයකිරීම් ප්‍රගතිය - 2011



## නාගරික නිවාස සාප්පු / වාරික සහ කුලී අයකිරීම් ක්‍රියාකාරිත්වය - 2011

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රමාණය | | % | රු.මි. 2011.12.31 දිනට හිඟ |
|---|---|---|---|---|---|
| | | අයවැය | අයකිරීම් | | |
| 1 | ප්‍රධාන කාර්යාලය | 20.689 | 18.917 | 91 | 3.940 |
| 2 | කොළඹ නගර (උතුර) මාලිගාවත්ත | 34.000 | 27.179 | 80 | 37.671 |
| 3 | කොළඹ නගර (දකුණ) මැනින් ටවුන් | 43.703 | 40.322 | 92 | 5.904 |
| 4 | ගම්පහ | 25.300 | 30.839 | 122 | 27.260 |
| 5 | මහනුවර | 7.000 | 7.422 | 106 | 6.435 |
| 6 | මාතර | 4.000 | 2.165 | 54 | 13.331 |
| 8 | කොළඹ දිස්ත්‍රික්කය | 35.600 | 25.396 | 71 | 28.343 |
| 9 | කල්මුණේ / අම්පාර වාණිජ ගොඩනැගිලි | 2.150 | 0.745 | 34 | 1.204 |
| එකතුව | | **172.442** | **152.985** | | **124.088** |

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිවාස වැඩ සටහන් සඳහා සහභාගිවන නිවාස හිමියන්ගේ සංනිවේදන අවශ්‍යතා සපුරාලීම සඳහා තොරතුරු හා ප්‍රචාරක කොට්ඨාසය 2011 වසරේදී විවිධ මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

තොරතුරු හා ප්‍රචාරක කොට්ඨාසය පහත සඳහන් ඒකකයන් සමඟින් ක්‍රියාත්මක කෙරේ.

- තොරතුරු හා ප්‍රචාරක ඒකකය
- සෙවණ මාධ්‍ය සේවය
- මුද්‍රණ ඒකකය

## තොරතුරු හා ප්‍රචාරක ඒකකය

2011 වසරේදී තොරතුරු හා ප්‍රචාරක ඒකකය පහත සඳහන් වැඩකටයුතු ක්‍රියාත්මක කරන ලදී.

- ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කරනු ලබන ජනසෙවණ නිවාස හා ජනාවාස සංවර්ධන මෙහෙයුමට අදාළ මාධ්‍ය ආවරණ කටයුතු හා මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය තුලින් මහජනතාව දැනුම්වත් කිරීම.

- ජනසෙවණ ජාතික නිවාස හා ජනාවාස සංවර්ධන මෙහෙයුමට අදාළ ව අධිකාරිය විසින් දිස්ත්‍රික්ක 19 ක නිවාස ව්‍යාපෘති 60 ක පමණ ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන ලද අතර, එම සියලු උත්සව වෙනුවෙන් අවශ්‍ය පහත සඳහන් සේවා සහ පහසුකම් ලබා දීම.

(i) ප්‍රචාරක හා උත්සව සැලසුම්
(ii) සියලු පෙර මුද්‍රණ චිත්‍ර සටහන් (Art Works)
(iii) නාම පුවරු, ප්‍රචාරක පුවරු, වේදිකා පසුතල තොරණ, බැනර්, ධජ, පතාක කොඩි කණු
(iv) වේදිකා, මහජන ආවරණ, පුටු, ශබ්ද විකාශන යන්ත්‍ර, මල්ටි මීඩියා ප්‍රක්ෂේපණ යන්ත්‍ර සහ තිර
(v) පුවත්පත් දැන්වීම් සහ පෝස්ටර්
(vi) ආරාධනා පත්‍ර, හිමිකම් ප්‍රදාන පත්‍ර, හිමිකම් සහතික, ඔප්පු කවර
(vii) සමරු තිළිණ සහ සමරු ඵලක

2011 ලෝක ජනාවාස දින උත්සවය බත්තරමුල්ල ජනකලා කේන්ද්‍රයේදී 2011.10.03 දින පැවැත්වීම. ඒ යටතේ පහත සඳහන් කටයුතු ඉටුකරන ලදි.

(i) පාසල් සිසුන් සඳහා දීප ව්‍යාප්ත චිත්‍ර. රචනා සහ පොස්ටර් තරගාවලිය සංවිධානය කිරීම.
(ii) පාසල් සිසුන් 500ක් සඳහා චිත්‍ර වැඩමුළුවක් පැවැත්වීම.
(iii) පාසල් සිසුන්ගේ චිත්‍ර ප්‍රදර්ශනය පැවැත්වීම.
(iv) ලෝක ජනාවාස දින සමරු කලාපය නිර්මාණය සහ මුද්‍රණය
(v) චිත්‍ර, රචනා, පෝස්ටර් තරගාවලියේ ජයග්‍රාහකයන් සඳහා සම්මාන සහ සහතික පත් නිර්මාණය කිරීම.
(vi) ලෝක ජනාවාස දින ප්‍රධාන උත්සවය සංවිධානය කිරීම.
(vii) ප්‍රධාන උත්සවයේ වේදිකාව, වේදිකා පසුතලය, ප්‍රවේශ තොරණ නිර්මාණය සහ අලංකරණ කටයුතු

2011 "දැයට කිරුළ" ඇතුළු ජාතික මට්ටමේ ප්‍රදර්ශන සඳහා සහභාගිවීම.

## සෙවණ මාධ්‍ය ඒකකය

2011 වසරේදී සෙවණ මාධ්‍ය සේවය ඉදිකිරීම්, ඉංජිනේරු සේවා, නිවාස සහ පොදු පහසුකම් අමාත්‍යාංශය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, ජාතික ජලසම්පාදන හා ජල ප්‍රවාහන මණ්ඩලය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව, ඉදිකිරීම් පුහුණු හා සංවර්ධන ආයතනය, ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සහ ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය ඇතුළු ආයතනවල විවිධ පුවත්පත් දැන්වීම් පළකිරීම සිදු කරන ලදී.

2011 වසරේදී සෙවණ මාධ්‍ය සේවයෙහි වාර්ෂික ඇස්තමේන්තුගත ලාභය රු. මිලියන 3.0 කි. 2011 දෙසැම්බර් දක්වා ලැබූ ආදායම රු. මිලියන 27.14 ක් වන අතර ලාභය රු. මිලියන 3.62 කි.

සෙවණ මාධ්‍ය සේවයේ සියලු ඉපැයීම් "සභාපති, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය" නමින් වූ වෙනම ගිණුමකට බැරකරනු ලබන අතර, මෙම අරමුදල් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ නිවාස සංවර්ධන වැඩසටහන් සඳහා යොදාගනු ලැබේ.

# තොරතුරු හා ප්‍රචාරක කොට්ඨාශය

## සෙවණ මාධ්‍ය සේවය

### පුවත්පත් දැන්වීම්

2011 ජනවාරි සිට දෙසැම්බර් දක්වා ආදායම් සහ ලාභ

| මාසය | ආදායම<br>රු. | ලාභය<br>රු. |
|---|---:|---:|
| ජනවාරි | 2,707,496.80 | 366,133.42 |
| පෙබරවාරි | 1,349,474.40 | 181,489.05 |
| මාර්තු | 2,196,593.60 | 294,411.92 |
| අප්‍රේල් | 2,551,791.60 | 344,445.20 |
| මැයි | 2,129,909.40 | 288,237.45 |
| ජූනි | 2, 464,382.32 | 330,115.62 |
| ජූලි | 2,198,312.40 | 294,210.76 |
| අගෝස්තු | 2,010,344.40 | 269,730.00 |
| සැප්තැම්බර් | 2,938,760.56 | 392,043.09 |
| ඔක්තෝබර් | 2,976,530.30 | 387,498.88 |
| නොවැම්බර් | 2,869,263.62 | 381,525.10 |
| දෙසැම්බර් | 749,718.00 | 95,303.18 |
| එකතුව | **27,142,577.40** | **3,625,143.67** |

**2011 වර්ෂය සඳහා ආදායම් ඉලක්කය - රු. මි. 3.0**




## මුද්‍රණ ඒකකය

ජපන් රජයෙන් ලැබුණු ප්‍රධානයක් වන මෙම මුද්‍රණ ඒකකය බලපිටිය, පියගම ආදර්ශ ගම්මානයෙහි 1987 වර්ෂයේ ස්ථාපිත කරනු ලැබූහ. 1994 වසරේදී එය මාළිගාවත්ත නිවාස යෝජනා ක්‍රමයට රැගෙන එන ලදී.

2002 වසරේ ජූනි මාසයේදී මෙම මුද්‍රණ ඒකකය ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලය වෙත මාරුකරනු ලැබූ අතර, තොරතුරු හා ප්‍රචාරක කොට්ඨාසය යටතේ ස්ථාපිත කරනු ලැබූහ.

දැනට ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සියලුම මුද්‍රණ කටයුතු මෙමගින් සිදු කරනු ලබයි. එහෙත් සියලු මුද්‍රණ අවශ්‍යතාවන් ඉටුකිරීමට මෙම මුද්‍රණ ඒකකයේ ධාරිතාව ප්‍රමාණවත් නොවේ.

# තොරතුරු තාක්ෂණ

රාජ්‍ය ආයතනවල ක්‍රියාකාරීත්වයන් තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ කර මහජනතාවට නිවැරදි හා කාර්යක්ෂම සේවාවක් ලබාදීමේ ඊ-රාජ්‍ය සංකල්පයට අනුව යමින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ද එහි බොහෝ කටයුතු තොරතුරු හා සංනිවේදන තාක්ෂණය හා සම්බන්ධ කරමින් පවතියි. මෙම කාර්යය සඳහා පූර්ණ තාක්ෂණික හා න්‍යායාත්මක දැනුම ලබාදෙනු ලබන්නේ අප අධිකාරියේ තොරතුරු තාක්ෂණ අංශයයි.

දැනටමත් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලය හා සෑම දිස්ත්‍රික් කාර්යාලයකටම පරිගණක හා උපාංග ලබාදී අන්තර්ජාල සේවාව සහ විද්‍යුත් තැපැල වැනි සංනිවේදන ක්‍රම හඳුන්වා දීම තුලින් එම කාර්යාලවල කටයුතු වඩාත් කාර්යක්ෂමව පවත්වාගෙන යාමට පහසුකම් සලසා ඇත. කළමණාකාරිත්වයට අවශ්‍ය තොරතුරු සහ දත්ත එසැනින් ලබාගැනීමටත් ඔවුන් වෙත ඉහළ කළමණාකාරිත්වය විසින් ගන්නා තීරණ හා උපදෙස් දන්වා යැවීමට දිස්ත්‍රික් කාර්යාල 26 හා ප්‍රධාන කාර්යාලය අතර මනා සම්බන්ධතාවයක් තොරතුරු තාක්ෂණය මඟින් ගොඩනගා ඇත. මෙමගින් සාර්ථක ප්‍රතිඵල ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් දැනටමත් නෙලාගෙන ඇත.

එයට අතිරේකව තාක්ෂණ අංශය විසින් පහත දක්වා ඇති සේවාවන් පවත්වාගෙන යනු ලබයි.

**01. ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වෙබ් පිටුව සංවර්ධනය කර යාවත්කාලීන කිරීම.**

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වෙබ් අඩවිය යනු එහි දැක්ම හා ක්‍රියාකාරකම් පිළිබඳ සේවකයින්ට, ශ්‍රීලාංකික ජනතාවට මෙන්ම නිවාස සංවර්ධනය ගැන උනන්දුවක් දක්වන ලෝවැසි ජනාතාවට ද මනා අවබෝධයක් ලබාදෙන පරිඝණක අංශය මඟින් ක්‍රියාත්මක වන ප්‍රබල මාධ්‍යයකි.

පසුගිය වසර තුල පරිඝණක අංශය මඟින් ක්‍රියාත්මක වන වෙබ් අඩවිය මඟින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන කාර්යාලය, දිස්ත්‍රික් කාර්යාල සහ උප කාර්යාල පිළිබඳ තොරතුරු ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක නිවාස වැඩ සටහන් හා සේවාවන් පිළිබඳ තොරතුරු, නිවාස ණය වැඩ සටහන් පිළිබඳ තොරතුරු, නිවාස ආධාර ලැබිය යුතු පුරවැසියන් පිළිබඳ තොරතුරු,ඉදිකෙරෙමින් පවතින නිවාස යෝජනා ක්‍රම පිළිබඳ තොරතුරු සහ විකිණීමට සූදානම් කර ඇති නිවාස පිළිබඳ තොරතුරු සහ නිවාස අධිකාරියෙහි පුවත් ඇතුලත් ඉතා වැදගත් තොරතුරු සිංහල හා ඉංග්‍රීසි භාෂා මාධ්‍ය මඟින් ක්‍රමවත් ලෙස නිතිපතා යාවත්කාලීන කර සැපයීමට අවශ්‍ය කටයුතු පරිඝණක අංශය මඟින් සිදුකරමින් පවතී.

ඉදිරි වසර තුල මෙම වෙබ් අඩවිය මඟින් ලබාදෙන මහජන සේවාවන් පුළුල් කිරීමත්. එමෙන්ම දෙමළ භාෂා මාධ්‍යයෙන් එම තොරතුරු එළිදැක්වීමටත් බලාපොරොත්තුවෙන් සිටී.

**02. පරිඝණක හා දෘඩාංග නඩත්තු කිරීම**

අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ හා දිස්ත්‍රික් කාර්යාලයන්හි පරිඝණක ජාලගතකිරීම් 80%ක් පමණ සම්පූර්ණ කර ඇත. නිවාස අධිකාරිය සතුව පරිඝණක 252 ක් පමණත්, මුද්‍රණ යන්ත්‍ර 100 ක් හා UPS 150 ක් පමණ දැනට භාවිතයේ ඇත. වගකීම් කාලය ඉක්මවූ පරිඝණක යන්ත්‍ර, මුද්‍රණ යන්ත්‍ර, UPS සහ අනෙකුත් උපාංග ශා ජාලගත දෝෂ නිවැරදි කිරීම තොරතුරු තාක්ෂණ අංශය මඟින් සිදු කරනු ලබන අතර, වගකීම් කාලය නොඉක්මවූ පරිගණක හා උපකරණ නඩත්තු කිරීම සඳහා අදාල ආයතන සමඟ සම්බන්ධීකරණය කරනු ලබයි.

මීට අමතරව පරිඝණකවල මෙහෙයුම් පද්ධතියේ සහ අනෙකුත් මෘදුකාංග නඩත්තුව හා වෛරස් මඟින් පරිඝණක හා දත්ත ආරක්ෂා කරගැනීම සඳහා පහසුකම් මෙම අංශය මඟින් ලබාදෙන අතර, මෙම සේවාවන් බාහිර ආයතන මගින් ලබාගන්නේ නම් ඒ සඳහා දැරීමට සිදුවන විශාල පිරිවැය අවම කර ගැනීමට තොරතුරු තාන්ෂණ අංශ මඟින් ලබාදෙන සේවාවන් නිසා හැකිවී ඇත

**03. පරිඝණක වැඩ සටහන් නිර්මාණය හා නඩත්තු කිරීම්**

ප්‍රධාන කාර්යාලයේ ආපදා ණය වැඩ සටහන, අතිකාල ගෙවීමේ වැඩ සටහන, සභාපති කාර්යාලයට අදාල මහජන ඉල්ලීම් තොරතුරු පරිගණකගත කිරීමේ වැඩ සටහන, පොලී රහිතව සේවකයන් වෙත නිකුත් කරන කෙටි ණය, අධිකාරිය සතු නිශ්චල දේපළ කළමනාකරණය නිසි අයුරින් පවත්වාගෙනයාම සඳහා ක්‍රියාවට නංවන ලද ඉඩම් මෙහෙයුම් වැඩ සටහන උදෙසා පරිගණක වැඩ සටහනක් නිර්මාණය කර එමගින් සමස්ථ අධිකාරියට අයත් නිවාස හා ඉඩම්වල දත්ත ඇතුලත් කර නිවැරදි තොරතුරු ලබාගත හැකිවන පරදි පරිඝණක වැඩ සටහන් නිර්මාණය කර ඇත.

අලෙවි අංශයට අයත් පෙර විකුණුම් නිවාස ක්‍රමයන් පිළිබඳ විස්තර ලබාගත හැකි පරිදි සියළු දත්ත ඇතුලත් කලහැකි ආකාරයට සම්පාදනය කරන ලද පරිඝණක වැඩ සටහන මඟින් ඉල්ලුම්කරුවන්ගේ සියළු විස්තර පරිඝණකගත කර අවශ්‍ය තෝරාගැනීම් කඩිනමින් සිදුකිරීමට පහසුකම් සලස්වා ඇත.

සෙවන මාධ්‍ය අංශය මඟින් සිදුකරන දැන්වීම් පලකිරීමට අදාලව පරිඝණක වැඩසටහන නිර්මාණය කිරීම සහ එහි මුදල් ලැබීම් ගිණුම් අංශය ද ඒකාබද්ධ කර පවත්වාගෙන යාමට  හැකිවන පරිදි මෙම වැඩ සටහන නිර්මාණය කර ඇත.

දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචන රැස්වීමට අවශ්‍ය සියළු දත්ත දිස්ත්‍රික් කාර්යාලවලින් ලබාගෙන අවශ්‍යතාවය අනුව ඒ ඒ දත්ත උපයෝගී කරගනිමින්  ප්‍රගති වාර්තා සකස් කිරීම හා ඒ සඳහා විවිධ අංශවල සිටින තොරතුරු තාක්ෂණ සේවයෙහි නියුතු නිලධාරීන් මෙහෙයවීම හා අවශය සම්බන්ධීකරණ කටයුතු තොරතුරු තාක්ෂණ අංශ මඟින් සිදු කරනු ලබයි.

## 04. නිවාස ණය පරිඝණක වැඩ සටහන

උතුරු නැගෙනහිර ද ඇතුලත්ව සියළු දිස්ත්‍රික් කාර්යාල මඟින් 1984 සිට ලබා දි ඇති නිවාස ණය හා රජයේ නිලධාරීන්ට ලබාදෙන උපහාර ණය පිළිබඳ තොරතුරු පරිඝණකගත කිරීම හා තොරතුරු යාවත්කාලීන කිරීමේ කටයුතු නිතිපතා සිදුකරනු ලබයි.

ඒ අනුව සියළු ණයකරුවන්ගේ තොරතුරු, ණය ලබාදීම් හා ණය ලැබීම් පීලිබඳ තොරතුරු පරිඝණකගත කර ඇත. ඒවායෙහි දත්ත සංරක්ෂණ කටයුතු කෙරෙන්නේ පරිඝණක අංශය මඟිනි.

ප්‍රධාන කාර්යාලයේ සහ අනිකුත් දිස්ත්‍රික් කාර්යාලවලට අවශ්‍ය පරිඝණක හා පරිඝණක උපාංග මිලදී ගැනීමේ කටයුතු සඳහා අවශ්‍ය පිළිවිතරයන් හා ප්‍රසම්පාදන කටයුතු ද මෙම අංශය මඟින් සිදු කරන බැවින් ජාතික නිවාස සංවර්ධන අධිකාරියට අයත් පරිඝණක හා උපාංග මිළදි ගැනීමේ කටයුතු නිසි තත්ව පාලනයකින් යුතුව සිදුකරනු ලබයි.

## 05. Call Centre මධ්‍යස්ථානය පිහිටුවීම

උපහාර ණය වැඩ සටහන යටතේ සිටින ණයලාභීන්ගෙන් ණය අයකර ගැනීම සඳහා නවීන පහසුකම් සහිත Call Centre මධ්‍යස්ථානයක් හඳුන්වාදි ඇති අතර එමඟින් ණයලාබීන් සමඟ දුරකථනයෙන් සම්බන්ධවී අවශ්‍ය තොරතුරු ලබාදීමට සහ පසුවිපරම් කිරීමට අවශ්‍ය සියළු පහසුකම් මෙම Call Centre මධ්‍යස්ථානය හරහා හඳුන්වා දී තිබෙන අතර ඒ සඳහා අවශ්‍ය තාක්ෂණික දායකත්වය ලබාදීමට කටයුතු කර ඇත.

## 06. නව ණය පරිසනක වැඩසටහනක් හඳුන්වාදිම

ඉතා දිගු කලක සිට  අත්‍යාවශ්‍යව පැවති ණයලබාදිම් හා අයකරගැනීම් සඳහා නව පරිඝණක වැඩ සටහනක් නිර්මාණය කිරීමට අවශ්‍ය මූලික කටයුතු මේ වනවිටත් අවසන් කර ඇති අතර, 2013 වසර තුල එම නව පරිඝණක වැඩසටහන පූර්ණ වශයෙන් දියත් කිරීමට බලාපොරොත්තුවේ.

ඉහත කරුණ අනුව තොරතුරු තාක්ෂණ අංශය සැමවිටම උත්සාහ ගනුයේ රජයේ ඊ-රාජ්‍ය ක්‍රමය අනුගමනය කරමින්  ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සියළුම සේවාවන් තොරතුරු තාක්ෂණය භාවිතා කරමින් මහජනතාවට කාර්යක්ෂම සේවාවක් ලබාදීමේ අරමුණ ඇතිවය. නුදුරු අනාගතයේදී මීටත් වඩා තොරතුරු හා සංනිවේදන තාක්ෂණය භාවිතා කරමින් ඉහල සේවාවක් ලබාදීමේ අරමුණින් වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සඳහා වැඩපිළිවෙලක් මේවනවිටත් සැකසෙමින් පවතී.

# සීමාසහිත ඕෂන්වීව් ඩිවොලොප්මන්ට් පුද්ගලික සමාගම

## හැඳින්වීම

අංක 94/340/006 සහ 1994.02.17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි බම්බලපිටිය ටවර් ගොඩනැගිල්ල කළමනාකරණය කිරීම සඳහා ද, දේපළ සංවර්ධන කටයුතු කිරීම සඳහා ද, නාගරික සංවර්ධන අධිකාරිය, ජාතික නිවාස සංවර්ධන අධිකාරිය හා එක්ව හවුල් ව්‍යාපාර සමාගමක් ලෙස ස්ථාපිත කර ඇත.

ඒ අනුව 1996 ජනවාරි 01 වැනි දින ඕෂන්වීව් සංවර්ධන සමාගම ආරම්භ කරනු ලැබීය.

ජනසෙවණ නිවාස දසලක්ෂයේ ජාතික ප්‍රතිපත්තියට සවිය දෙන රාජ්‍ය සමාගමක් ලෙස විශ්වාසය හා වගකීමත්, පුද්ගලික ආයතනයක් ලෙස කාර්යක්ෂමතාවයත් පෙරදැරි කරගත් මෙම සමාගම අද වන විට නිවාස වෙළඳපලෙහි පැහැදිලි වෙනසක් ඇති කරමින් නිවාස අවශ්‍යතාවය සපුරාලීමට ඉදිරිපත්ව සිටී.

## දැක්ම

ශ්‍රී ලංකාවේ දේපළ සංවර්ධන වෙළඳපොළ තුළ රජයට අනුබද්ධ දේපළ සංවර්ධන සමාගමක් ලෙස දායකත්වය ලබාදීම.

## මෙහෙවර

ගැනුම්කරුවන්ගේ අවශ්‍යතා මත පදනම්ව, තරඟකාරි මිල ගණන් යටතේ, අංගසම්පූර්ණ පහසුකම්වලින් සමන්විත. තනි නිවාස ඒකක මෙන්ම සහාධිපත්‍ය නිවාස දේපළද, සපයා දෙමින් දේශීය දේපළ සංවර්ධන වෙළඳපොළට සහායවීම.

## අරමුණු

- දේපළ සංවර්ධනය
- දේපළ කළමනාකරණය
- ඉදිකිරීම් හා නඩත්තු කටයුතු
- දේපළ බදුදීම
- ඉඩම් හා දේපළ විකුණුම්

### ඕෂන්වීව් ඩිවොලොප්මන්ට් පුද්ගලික සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය

| | |
|---|---|
| ජගත් පෙරේරා මහතා | - සභාපති/කළමණාකාර අධ්‍යක්ෂ |
| ප්‍රශාන්ත ඩයස් මහතා | - අධ්‍යක්ෂ |
| ආචාර්ය අචල උපේන්ද්‍ර ජයතිලක මහතා | - අධ්‍යක්ෂ |
| සිරිනිමල් පෙරේරා මහතා | - අධ්‍යක්ෂ |
| අතුල ද සිල්වා මහතා | - අධ්‍යක්ෂ |

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් - එකවුන්ට් සිස්ටම් පුද්ගලික සමාගම

### සීමාසහිත ඕෂන්වීව් ඩිවොලොප්මන්ට් සමාගමේ කාර්ය මණ්ඩලය

2011 වර්ෂයේ දී සමාගමේ සමස්ථ කාර්ය මණ්ඩලය පහත පරිදිවේ.

| | |
|---|---|
| විධායක කාර්ය මණ්ඩලය | - 08 |
| විධායක නොවන කාර්ය මණ්ඩලය | - 16 |
| නඩත්තු අංශයේ කාර්ය මණ්ඩලය | - 22 |
| | 46 |

## නව කළමණාකාරිත්වය යටතේ ප්‍රගති සමාලෝචනය

❖ **ඩ්‍රීම් හවුස් නිවාස ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය විදේශගත ශ්‍රී ලාංකිකයන්ගේ නිවාස අවශ්‍යතාවය සපුරාලීම පිණිස මූලිකවම ක්‍රියාත්මක වන අතර වසර ගණනාවක් සේවය කොට දුක් මහන්සියෙන් උපයාගත් මුදල් යොදවා, විදේශගතව සිටියදීම විශ්වාසදායී ඉදිකිරීම් සමාගමක් හරහා තමන්ගේ සිහින නිවස ඉදිකරවා ගැනීම සඳහා ඕෂන්වීව් අත්වැලක් සපයනු ඇත.

ව්‍යාපෘතිය සඳහා සේවා සැපයීමට විදේශිත ව්‍යාපෘති කාර්යාලයක් බත්තරමුල්ල, ජනාවාස හා සැලසුම් හා සංවර්ධන ප්‍රමාණ සමීක්ෂණ මධ්‍යස්ථාන පරිශ්‍රයේ විවෘතකර ඇත. ආයතනයේ නිලධාරීන් විවිධ පාරිභෝගිකයන්ගේ අවශ්‍යතාවය හා අතැති මුදලට සරිලන පරිදි නිවාස නිර්මාණය කිරීමට ද, බැංකු ණය ලබාගැනීම සඳහා අවශ්‍ය පහසුකම් සලසාදීම ද කරනු ලැබේ

- **ජනසෙවණ කැපකරු නිවාස ව්‍යාපෘතිය**

ජීවිතයේ කිසිදු දිනක තමන්ටම කියා නිවාසයක් සාදාගත නොහැකි, ඒ සඳහා ආර්ථික ශක්තියක් නොමැති,තෝරාගත් දිළිඳු පවුල් 10 ක් සඳහා ඕෂන්වීව් ආයතනයේ මුල්‍ය අනුග්‍රහයෙන් මෙම නිවාස වැඩ සටහන ක්‍රියාවට නැංවේ.

ප්‍රථම අදියර වශයෙන් කොළඹ දිස්ත්‍රික්කය ආවරණය වන පරිදි නිවාස 10 ක් ඉදිකිරීමට සැලසුම් කෙරිණි. අදාල පවුල් තෝරාගනීම ජනසෙවණ ව්‍යාපෘති කාර්යාලය සහ සීමාසහිත ඕෂන්වීව් සමාගම ඒකාබද්ධව සිදුකරන අතර, ග්‍රාම නිලධාරි හරහා තෝරාගැනීම සිදුකෙරේ. දැනට නිවාස ඒකක 09 ක ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නිවාස 05 ක වැඩ අවසන් කර ඇත.

- **ටවර් ගොඩනැගිල්ල නඩත්තු කිරීම**

නව ගිණි නිවාරණ පද්ධතිය ස්ථාපිත කිරීම, පෝඩියම් කොටසේ තෙත් නිවාරණ කටයුතු හා ගොඩනැගිල්ලේ බේස්මන්ට් කොටසේ අළුත්වැඩියා කටයුතු සඳහා රු.මි.2.4 ක් වැය කර ඇත.

## 2012 ඉදිරි සැලසුම්

- **කහතුඩුව නිවාස ව්‍යාපෘතිය**

මෙම ව්‍යාපෘතිය මගින් අංග සම්පූර්ණ පහසුකම්වලින් සමන්විත තනි නිවාස, දෙමහල් නිවාස හා ද්විත්ව නිවාසවලින් නිවාස ඒකක 40 ක නිවාස ගම්මානයක් ඉතා තරඟකාරි මිල ගණන් යටතේ මධ්‍යම පාන්තිකයන් වෙනුවෙන් සාදා අලෙවි කිරීමටද සමාගම බලාපොරොත්තු වේ. පර්චස් 10 ක ඉඩම් කැබැල්ලක් සමඟ මාදිලි 03 කින් සමන්විත මෙම නිවාස රුපියල් මිලියන 4 සිට රුපියල් මිලියන 8 අතර වූ මුදලකට පහසුගෙවීමේ ක්‍රම සහ බැංකු ණය පහසුකම් යටතේ මිලදී ගැනීමට ද කටයුතු සලසා ඇත. ආයෝජනය කිරීමට බලාපොරොත්තුවන මුදල රුපියල් මිලියන 200 ක් පමණ වේ.

- **ටවර් ගොඩනැගිල්ල නඩත්තු කිරීම**

මේ යටතේ ගොඩනැගිල්ලේ මුළු විදුලි අවශ්‍යතාවයන් ආවරණය වන පරිදි කිලෝවොට් 750 ක (ජෙනරේටර්) විදුලි සැපයුමකි. වොට් 1.250 දක්වා වැඩි දියුණු කිරීමට ද බලාපොරොත්තුවේ. මීට අමතරව, දැනට ආරම්භ කර ඇති ව්‍යුහාත්මක පිළිසකර කිරීම් නිම කිරීමට ද බලාපොරොත්තුවේ. මේ සඳහ රුපියල් මිලියන 15 ක පමණ මුදලක් ආයෝජනය කිරීමට ද සමාගම බලාපොරොත්තුවේ.

- **ජනසෙවණ කැපකරු නිවාස ව්‍යාපෘතිය**

ජනසෙවණ කැපකරු නිවාස ව්‍යාපෘතියේ දෙවන අදියර යටතේ දිවයිනේ තෝරාගත් අනෙකුත් ප්‍රාදේශීය කොට්ඨාශද ආවරණය වන පරිදි තවත් නිවාස 12 ක් තමන්ටම කියා කිසිදිනක නිවසක් ඉදිකර ගත නොහැකි අසරණ දිළිඳු පවුල් වෙනුවෙන් සාදා භාරදීමට සමාගම බලාපොරොත්තුවේ. ආයෝජනය කිරීමට බලාපොරොත්තුවන මුදල රුපියල් මිලියන 18 කි.

## ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ පරිපාලන සමාගම 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශේෂ පත්‍රය

| | සටහන් | 2011 ජා.නි.ස.අ | 2011 සමූහය රු. ශත | 2010 සමූහය රු. ශත |
|---|---|---|---|---|
| **(අ) වත්කම්** | | | | |
| ජංගම නොවන වත්කම් | | | | |
| ස්ථාවර වත්කම් | | | | |
| ඉඩම් සහ ගොඩනැගිලි | (02) | 612,849,784.64 | 769,341,947.71 | 802,715,995.12 |
| මෝටර් රථ | (03) | 1,492,394.44 | 26,232,713.78 | 4,402,706.39 |
| ලී බඩු සහ සවිකිරීම් | (03) | 10,923,399.87 | 40,757,951.71 | 33,289,824.41 |
| උපකරණ | (03) | 21,425,205.11 | 23,732,741.55 | 136,616,686.87 |
| | | 646,690,784.06 | 860,065,354.75 | 977,025,212.79 |
| **II සංවර්ධන වත්කම්** | | | | |
| ඉඩම් අත්පත් කර ගැනීම | | 314,288,631.41 | 314,288,631.41 | 307,660,607.01 |
| නිවාස ණය වැඩ සටහන | (04-13) | 4,734,808,015.71 | 4,734,808,015.71 | 2,558,332,088.60 |
| ණය වැඩ සටහන ජා.නි.දෙ | | 1,554,885.05 | 1,554,885.05 | 1,554,885.05 |
| කුලී මිලදී ගැනීම් නිවාස වැඩසටහන - ජා.නි.ස.අ | | 288,880,409.58 | 288,880,409.58 | 310,046,808.47 |
| වාරික පදනම මත නිවාස විකිණීම | | 1,142,351,314.74 | 1,142,351,314.74 | 1,437,960,287.11 |
| වාරික පදනම මත ඉඩම් විකිණීම | | 10,177,268.60 | 10,177,268.60 | 14,018,733.10 |
| කුලී මිලදී ගැනීම් නිවාස ව්‍යාපෘතිය - ජා.නි.දෙ | | 93,687.00 | 93,687.00 | 100,419.00 |
| මාණ්ඩලික නිවාස වැඩ සටහන | | 185,087,437.00 | 185,087,437.00 | 189,303,798.00 |
| | | 6,677,241,649.09 | 6,677,241,649.09 | 4,818,977,626.34 |
| **III ආයෝජන - දිගුකාලීන** | (14- 1) | 180,682,280.35 | 105,415,417.13 | 248,765,542.47 |
| ජංගම වත්කම් | | | | |
| සෘජු ඉදිකිරීම් වැඩ සටහන | (15) | 102,548,224.55 | 102,548,224.55 | 210,347,933.57 |
| තොග | (16) | 68,630,167.03 | 211,190,063.43 | 168,398,767.09 |
| කොන්ත්‍රාත්කරුවන් සඳහා අත්තිකාරම් | | 85,177,522.50 | 85,177,522.50 | 82,893,424.93 |
| ලැබිය යුතු පොලිය | (17) | 12,685,072.93 | 12,685,072.93 | 15,710,832.99 |
| ණය ගැතියෝ | (18) | 2,921,341,158.88 | 2,967,500,279.41 | 3,172,383,609.31 |
| ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය | | - | - | 53,983,260.00 |
| තැන්පතු සහ අත්තිකාරම් | (19) | 634,313,906.43 | 634,313,906.43 | 410,818,938.99 |
| ආයෝජන - කෙටිකාලීන | (14-11) | 963,477,290.06 | 963,477,290.06 | 420,333,070.59 |
| මුදල් සහ බැංකු ශේෂ - ජා.නි.ස.අධිකාරිය | (20) | 128,589,890.25 | 145,763,629.56 | 58,744,439.14 |
| ජා.යන්ත්‍රෝ.ආයතනය | | - | - | 3,201,700.00 |
| | | 4,916,763,232.63 | 5,122,655,988.87 | 4,596,815,976.61 |
| **මුළු වත්කම්** | | **12,421,377,946.13** | **12,765,378,409.84** | **10,641,584,358.21** |
| **(ආ) යෙදවුම් සම්පත්** | | | | |
| ආරම්භක අනුදත් ප්‍රාග්ධනය | | **50,000,000.00** | **50,000,000.00** | **50,000,000.00** |
| | | 40,000,000.00 | 40,000,000.00 | 40,000,000.00 |
| ප්‍රාග්ධන සංචිත - විදේශ ආධාර | | 131,682,601.02 | 131,682,601.02 | 131,682,601.02 |
| - දේශීය ආධාර | (21) | 16,316,798,901.76 | 16,316,798,901.76 | 15,335,242,352.30 |
| | | 16,488,481,502.78 | 16,488,481,502.78 | 15,506,924,953.32 |
| ප්‍රත්‍යාගණන අතිරික්තය - ජා.ය.ආ. | | - | - | 227,558,781.00 |
| එකතුකළා/අඩුකළා ඉදිරියට ගෙන ආ ආදායම් වියදම් | | (11,066,427,171.19) | (10,965,978,227.25) | (11,132,057,507.66) |
| | | 5,422,054,331.59 | 5,522,503,275.53 | 4,602,426,226.66 |
| සුළු කොටස් හිමියන්ගේ අයිතිය | | - | 169,699,009.47 | 168,061,890.06 |
| ජංගම නොවන වගකීම් | | | | |
| පාරිතෝෂික අරමුදල | | 8,841,829.59 | 8,841,829.59 | 7,974,268.66 |
| ණය | (22) | 2,533,338,105.80 | 2,533,338,105.80 | 1,066,558,399.64 |
| | | 7,964,234,266.98 | 8,234,382,220.39 | 5,845,020,785.02 |
| **ජංගම වගකීම්** | | | | |
| ණය හිමියෝ | (23) | 1,389,396,310.24 | 1,457,280,470.66 | 1,422,086,099.20 |
| ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය | | - | - | 402,564,925.00 |
| ණය සඳහා ජංගම වගකීම් | (24) | 1,176,883,587.35 | 1,176,883,587.35 | 1,137,056,328.08 |
| තැන්පතු | (25) | 1,413,070,731.68 | 1,413,070,731.68 | 1,377,790,108.39 |
| වෙන් කිරීම් | (26) | 477,793,049.88 | 483,761,399.76 | 457,066,112.52 |
| | | 4,457,143,679.15 | 4,530,996,189.45 | 4,796,563,573.19 |
| **මුළු ප්‍රාග්ධනය සහ වගකීම** | | **12,421,377,946.13** | **12,765,378,409.84** | **10,641,584,358.21** |

මෙම මූල්‍ය වාර්තා සැකසීම සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.

| එස් ඒ ජයන්ත සමරවීර | ඒ ඩබ් දයානන්ද | ඊ ඒ ඩී එස් එදිරිසිංහ |
|---|---|---|
| සභාපති | උප සභාපති | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මුදල්) |

**ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සහ පරිපාලන සමාගම**
**2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම් වියදම් ගිණුම්**

| | | 2011 | | 2010 | |
|---|---|---|---|---|---|
| **(ඒ) ආදායම්** | **සටහන්** | **රු ශත** | **රු ශත** | **Rs. Cts.** | **Rs. Cts.** |
| නිවාස විකුණුම් ලාභ / අලාභ | | 5,661,305.06 | | 6,669,224.16 | |
| ඉඩම් විකුණුම් ලාභ / අලාභ | | 23,777,315.66 | | 10,491,012.96 | |
| කුලී ආදායම් | [27] | 59,679,790.76 | | 49,748,528.68 | |
| පොලී ආදායම් | [28] | 487,749,030.48 | | 341,896,239.52 | |
| වාහන කුලියට දීමෙන් ආදායම් | | 875,630.69 | | 1,121,353.87 | |
| යන්ත්‍ර සූත්‍ර කුලියට දීමෙන් ආදායම් | | 901,247.88 | | 461,875.30 | |
| දඩ සහ අධිභාරය | | 16,456,261.03 | | 8,257,110.10 | |
| වාහන විකුණුම් ලාභ | | 4,866,340.50 | | 1,332,500.00 | |
| බොල් හා අඩමාන ණය අධි වෙන්කිරීම | | 33,371,750.53 | | - | |
| සෙවණ මාධ්‍ය ආදායම් | | 5,261,192.69 | | 2,634,063.50 | |
| වක්‍ර මෙහෙයුම් අදායම් | [29] | 147,089,358.54 | | 32,979,540.85 | |
| ආපසු නොගෙවන තැන්පතු | [30] | 597,557.00 | | 118,450.00 | |
| | | | 786,286,780.82 | | 455,709,898.94 |
| **(බී) වක්‍ර සංවර්ධන වියදම්** | | | | | |
| අධ්‍යක්ෂ මණ්ඩල වියදම් | | 278,000.00 | | 57,000.00 | |
| පුද්ගල පඩිනඩි | [31] | 782,550,636.61 | | 719,879,604.67 | |
| ගමන් වියදම් | [32] | 19,258,749.82 | | 12,917,572.03 | |
| සැපයුම් | [33] | 63,181,067.83 | | 33,682,804.11 | |
| නඩත්තු වියදම් | [34] | 159,271,989.02 | | 59,518,941.74 | |
| ගිවිසුම්ගත සේවා | [35] | 65,771,831.48 | | 37,931,902.94 | |
| මුල්‍යමය වියදම් | [36] | 165,194,449.42 | | 203,231,497.27 | |
| වක්‍ර මෙහෙයුම් වියදම් | [37] | 7,945,681.77 | | 9,521,640.95 | |
| ස්ථාවර වත්කම් ක්ෂයවීම් | | 41,127,526.58 | | 45,699,643.90 | |
| | | | 1,304,579,932.53 | | 1,122,440,607.61 |
| (සී) වර්ෂය සඳහා අතිරික්ත ආදායම් / වියදම් | | | **(518,293,151.71)** | | **(666,730,708.67)** |
| (ඩී) ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය ලාභ /අලාභ | | | (7,128,067.00) | | (98,155,024.00) |
| (ඊ) ගැලපීම් - ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය | | | 689,365,454.00 | | - |
| (එෆ්) ඉදිරියට ගෙන ආ ශුද්ධ ආදායම් / වියදම් | | | (11,230,371,406.48) | | (10,465,485,673.81) |
| (ජී) ඉදිරියට ගෙන ගිය ශුද්ධ ආදායම් / වියදම් | | | **(11,066,427,171.19)** | | **(11,230,371,406.48)** |

**ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය**
**2011.01.31 දිනෙන් අවසන් මාසය සඳහා ලාභ අලාභ ගිණුම්**

| | අවසන් වූ කාලය | |
|---|---|---|
| | 2011 ජනවාරි 31 | 2010 දෙසැම්බර් 31 |
| | රු. | රු. |
| **පිරිවැටුම** | | |
| යන්ත්‍ර කුලියට දීමේ ආදායම | 7,379,087 | 91,294,463 |
| ක්‍රියාත්මක කල ව්‍යාපෘති ආදායම් | | |
| | **7,379,087** | **91,294,463** |
| **මෙහෙයුම් වියදම්** | | |
| වැඩ මුළු | 4,975,821 | 39,768,910 |
| ඩිපෝ වියදම් | 5,588,455 | 105,342,427 |
| ක්‍ෂයකිරීම් | 2,487,693 | 29,785,234 |
| **මුළු මෙහෙයුම් වියදම්** | **13,051,970** | **174,896,571** |
| අන්තර්සමාගම් හුවමාරුකිරීම | | (14,956,768) |
| | **13,051,970** | **159,939,803** |
| **ශුද්ධ ලාභය / අලාභය** | (5,672,883) | (68,645,340) |
| පරිපාලන වියදම් | 1,775,727 | 25,297,099 |
| මූල්‍යමය අයකිරීම් | 31,146 | 1,057,110 |
| අනෙකුත් ක්‍ෂයකිරීම් | 5,342 | 62,745 |
| මුළු වක්‍ර වියදම් | **1,812,216** | **26,416,954** |
| **මෙහෙයුම් ශුද්ධ ලාභය / අලාභය** | (7,485,099) | (95,062,293) |
| අනෙකුත් ආදායම් | (30,009) | 282,554 |
| ශුද්ධ ලාභය /අලාභය අමතර අයිතමයන් පෙර | **(7,515,108)** | **(94,779,739)** |
| ලාභය /අලාභය ස්ථාවර වත්කම් විකුණුම් | 387,041 | (3,375,285) |
| අමතර අයිතමයන්ට පසු වර්ෂයට අයත් ශුද්ධ ආදායම් /වියදම් | (7,128,067) | (98,155,024) |
| ශුද්ධ ලාභය /අලාභය ඉදිරියට ගෙනාවා | (682,237,392) | (584,082,368) |
| **ශුද්ධ ආදායම් / වියදම්** | **(689,365,459)** | **(682,237,392)** |

# ගිණුම් ප්‍රතිපත්ති

## සටහන 1

**2011.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැදගත් වූ ගිණුම් ප්‍රතිපත්ති.**

**1. පිළිගත් මූලික ගිණුම්**

**1.11 ගිණුම්**

පිළිගත් ගණකාධිකරණ මූලධර්මවලට සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ ගිණුම් ප්‍රමිතීන් අඛණ්ඩව අනුගමනය කරමින් ඓතිහාසික පිරිවැය පදනම මත ගිණුම් ප්‍රකාශ සකස් කර ඇත.

**1.12 ශේෂ පත්‍රය පිළියෙළ කිරිමෙන් පසු සිදුකල ගණුදෙනු**

ශේෂ පත්‍ර දිනයට පසු සිදුකල සියළුම ප්‍රමාණාත්මක ගණුදෙනු සැලකිල්ලට ගෙන තිබූ අතර මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය සංශෝධන සිදුකර තිබුණි.

**1.13 අඛණ්ඩ පැවැත්ම ප්‍රතිපත්තිය**

මූල්‍ය ප්‍රකාශන  අඛණ්ඩ පැවැත්ම ප්‍රතිපත්තිය මත පිළියෙළකර තිබූ අතර එමගින් සාමාන්‍යපරිදි කටයුතු කරගෙනයන අතරතුරේදි වත්කම් උපලබ්ධියෙන් බැරකම් පියවීමට අධිකාරියට හැකිවනු ඇත.

**2. වත්කම් සහ ඒවා අගයකිරීමේ පදනම**

**2.1 දේපල. යන්ත්‍ර සහ උපකරණ**

ස්ථාවර වත්කම් අදාල  පිරිවැයෙන් සමුච්චිත ක්‍ෂය අඩුකර දක්වා ඇත. මෙම වත්කම්  භාවිතයට සුදුසු තත්වයට ගෙන ඒමට දරන ලද වියදම් සමඟ මිලදී ගැනුම් පිරිවැය සඳහන් කර ඇත.

**2.2.1 ක්‍ෂය කිරිම්**

මිලදී ගත්, ඉදිකල හෝ අත්පත් කරගත් වර්ෂයේ සිට ක්‍ෂය කිරීම් කරනු ලැබේ.

**2.2.2 ක්‍ෂය ප්‍රතිපාදන පිරිවැය මත පහත සඳහන් අනුපාතයන් අනුව කරනු ලැබේ.**

(ක්‍ෂය කිරීම්  වාර්ෂික පදනම මත කරන බැවින් අර්ධ වාර්ෂික ගිණුම්වල ක්‍ෂය කිරීම් පෙන්වා නොමැත.

| | | ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | ජාතික යන්ත්‍රෝපකරණ ආයතනය |
|---|---|---|---|
| 2.2.2.1 | ඉඩම් සහ ගොඩනැගිලි | පිරිවැයමත 2.5% | පිරිවැයමත 2.5% |
| 2.2.2.2 | ලීබඩු, සවිකිරීම් සහ අර්ධ ස්ථිර ඉදිකිරීම් | පිරිවැයමත 20% | පිරිවැයමත 20% |
| 2.2.2.3 | යන්ත්‍ර සහ උපකරණ | පිරිවැයමත 20% | පිරිවැයමත 10% (නැවත අගයකිරීමෙන් පසු) |
| 2.2.2.4 | රථ වාහන | පිරිවැයමත 20% | පිරිවැයමත 20% |

ප්‍රධාන කාර්යාලයේ සහ දිස්ත්‍රික් කාර්යාලවල සම්පූර්ණයෙන් ක්‍ෂය වූ වාහන සඳහා නාමික අගයක් ලෙස රු. 1000/- ස්ථාවර මිලක් නියම කර ඇත.

**3. තොග**

3.1 අවසන් තොගය භෞතික සත්‍යාක්‍ෂණය මත පදනම් වී ඇති අතර ප්‍රථමයෙන් ගත් භාණ්ඩ ප්‍රථමයෙන් බැහැර කිරීමේ ක්‍රමය මත අගය කර ඇත.

3.2 නැතිවීම් හා අලාභහානි සත්‍ය පිරිවැය මත හෝ ආදේශිතයේ  අගය යන දෙකින් වැඩි අගය මත ගණනය කරනු ලැබේ.

| - ආයතන අධ්‍යක්ෂ | | 15,260,000.00 | | 15,260,000.00 |
| | | **16,316,798,901.76** | | **15,335,242,352.30** |

## සටහන (22) ණය

| | 2011 | | 2010 | |
|---|---|---|---|---|
| | රු. ශත | රු. ශත | රු. ශත | රු. ශත |
| භාණ්ඩාගාරය | - | | - | |
| භාණ්ඩාගාර ණය - ජා.නි.දෙ | 625,000.00 | 625,000.00 | 1,765,500.00 | 1,765,500.00 |
| පුනරුත්ථාපන අමාත්‍යාංශය | | 130,950,398.90 | | 130,950,398.90 |
| නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව | | - | | 42,743.99 |
| නිවාස දේපල උපරිම ඇපකරය | | 15,209,800.00 | | 15,315,600.00 |
| ජල්තර ව්‍යාපෘතිය සඳහා ඒ ඩී සී එප් ණය | | 721,748,118.96 | | 721,748,118.96 |
| ධීවර අමාත්‍යාංශයෙන් ලද ණය | | 89,141,173.84 | | 89,141,173.84 |
| ආසියානු සංවර්ධන බැංකු ණය තුපවෙල ව්‍යාපෘතිය | | 21,215,000.00 | | 23,336,500.00 |
| වතු නිවාස සහ සමාජ සුභ සාධක භාරය | | 18,460,613.30 | | 18,460,613.30 |
| දිරිපියස වැඩ සටහන යටතේ ණය | | 59,694,950.84 | | 65,797,750.65 |
| ජනසෙවනවැඩ සටහන යටතේ ණය I (12%) | | 751,442,883.96 | | |
| ජනසෙවනවැඩ සටහන යටතේ ණය II (10%) | | 724,850,166.00 | | |
| | | **2,533,338,105.80** | | **1,066,558,399.64** |

## සටහන (23) ණය හිමියෝ

| | 2011 | 2010 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| විවිධ ණය හිමියෝ (සටහන (23) උප 01) | 898,083,418.39 | 774,457,139.46 |
| වියදම් සඳහා ණය හිමියෝ | 12,875,201.33 | 21,176,488.43 |
| රඳවාගත් මුදල් - කොන්ත්‍රාත්කරුවෝ | 90,827,118.13 | 87,917,119.08 |
| රඳවාගත් මුදල් - සැපයුම්කරුවෝ | 351,177.30 | 351,177.30 |
| නොගෙවූ වියදම් (සටහන (23) උප 02) | 70,862,438.56 | 62,920,120.14 |
| ඉඩම් වන්දි | 191,728,508.91 | 234,420,998.56 |
| රඳවාගත් මුදල් - ජල්තර ව්‍යාපෘතිය | 97,239.80 | 97,239.80 |
| වෙනත් - අවලංගු වූ චෙක්පත් | - | 59,195.56 |
| ජාතික ජලසම්පාදන හා ජලප්‍රවාහන මණ්ඩලය | 35,249,722.31 | 35,249,722.31 |
| නිමකල කොන්ත්‍රාත් වැඩ සඳහා ණය හිමියෝ | 30,010,375.28 | 28,915,525.58 |
| ගොඩනැගිලි අධ්‍යක්ෂ | 46,359,687.44 | 46,359,687.44 |
| රීල් සමාගම | 10,937,500.00 | 10,937,500.00 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව | 103,008.25 | 103,008.25 |
| සභාධිපත්‍ය කළමණාකරණ අධිකාරිය | 1,910,914.54 | 2,262,134.00 |
| | **1,389,396,310.24** | **1,305,227,055.91** |

## සටහන (23) උප 01 විවිධ ණය හිමියෝ

| | 2011 | 2010 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| කුලී අත්තිකාරම් | 2,143,269.18 | 1,303,492.92 |
| ණය වාරික අත්තිකාරම් | 52,909,378.38 | 12,472,048.54 |
| වැඩිපුර ගෙවූ නිවාස වාරික | 12,077,001.49 | 11,598,495.84 |
| වෙනත් ආයතනවලින් ලැබෙන මුදල් | 101,118,671.34 | 92,555,120.31 |
| ඉඩම් විකුණුම් අත්තිකාරම් | 75,796,299.47 | 75,887,540.38 |
| මුද්දර ගාස්තු ලැබීම් | 4,452,411.50 | 4,649,435.10 |
| කුලී වැඩිපුර වැයවීම | 1,401,505.19 | 49,895.47 |
| ගෙවිය යුතු බදු | 20,857,472.13 | 21,296,348.07 |
| වතු නිවාස වැඩ සටහන - නිවාස අමාත්‍යාංශය | 621,301,607.96 | 589,239,564.19 |
| සෙවණ මාධ්‍ය ණය හිමියෝ | 3,574,199.40 | 4,163,167.58 |
| යතුරු පැදි කල්බදු වැඩ සටහන | 27,069.04 | 27,069.04 |
| රඳවාගත් බදු | 2,424,533.31 | 1,117,499.26 |
| | **898,083,418.39** | **814,359,676.70** |

## සටහන (23) උප 02 නොගෙවූ ණය හිමියෝ

| | 2011 | 2010 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| වැටුප් | 762,677.19 | 584,754.56 |
| ගමන් වියදම් | 90,645.93 | 144,141.60 |
| අතිකාල | 149,582.94 | 157,089.59 |
| නොතාරිස් ගාස්තු | 32,632,894.32 | 30,813,605.51 |
| මුද්දර ගාස්තු | 13,331,534.65 | 8,962,470.27 |
| ප්‍රසාද දීමනා | 35,750.08 | 76,166.00 |
| උපචිත වියදම් | 18,811,436.45 | 14,726,982.06 |
| උපචිත වියදම් - ජල්තර ව්‍යාපෘතිය | 2,516,626.86 | 2,940,626.86 |
| ගොඩනැගිලි රක්ෂණ ලැබීම් | - | 1,954,686.01 |
| උපචිත වියදම් - සෙවන මාධ්‍ය සේවය | 2,531,290.14 | 2,559,597.68 |
| | **70,862,438.56** | **62,920,120.14** |

## සටහන (24) ණය සඳහා ජංගම වගකීම්

| | 2011 | 2009 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| ජනාධිපති අරමුදලින් ලබාගත් ගෙවිය යුතු ණය | 195,000,000.00 | 195,000,000.00 |
| ජනාධිපති අරමුදලින් ලබාගත් ණය සඳහා ගෙවිය යුතු පොලිය | 228,156,164.00 | 198,906,164.00 |
| පුනරුත්ථාපන අධිකාරියෙන් ලබාගත් ණය සඳහා ගෙවිය යුතු පොලිය | 32,629,267.93 | 30,720,000.00 |
| භාණ්ඩාගාර ණය සඳහා ගෙවිය යුතු පොලිය | 132,677,116.69 | 132,567,320.44 |
| ණයකර පොලී ණය හිමියෝ | 1,354,356.33 | 1,354,356.33 |
| භාණ්ඩාගාර ණය වාරික | 369,592,929.13 | 368,452,429.13 |
| ගෙවියයුතු පොලී - සී එච් පී | 7,630,151.68 | 7,630,151.68 |
| පුනරුත්ථාපන අධිකාරියට ගෙවිය යුතු වාරිකය | 126,013,000.00 | 128,000,000.00 |
| දිරිපියස ගෙවිය යුතු පොලී | 6,720,826.08 | 3,320,287.19 |
| දිරිපියස ගෙවිය යුතු වාරික | 4,338,489.43 | 2,864,545.12 |
| නුපවෙල ණය සඳහා ගෙවිය යුතු වාරික | 21,215,000.00 | 19,093,500.00 |
| නුපවෙල ණය සඳහා ගෙවිය යුතු පොලී | 51,556,286.08 | 48,820,074.19 |
| ගෙවියයුතු පොලී - සී එච් පී | - | 327,500.00 |
| | **1,176,883,587.35** | **1,137,056,328.08** |

## සටහන (25) තැන්පතු

| | 2011 | | 2010 | |
|---|---|---|---|---|
| | රු. | ශත | රු. | ශත |
| ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ලද අත්තිකාරම් | 13,315,764.41 | | 13,315,764.41 | |
| ආපසු ගෙවිය යුතු තැන්පත් | 152,422,860.55 | | 155,050,339.28 | |
| අවතැන්වූවන් පිළිබඳ එක්සත් ජාතීන්ගේ මහකොමසාරිස් | - | | 749,470.65 | |
| නිවාස යෝජනා ක්‍රම නඩත්තු | 61,497,290.77 | | 61,802,859.92 | |
| නිවාස විකුණුම් තැන්පත් | 151,722,362.82 | | 135,667,657.33 | |
| ශිෂ්‍යත්ව වැඩ සටහන | 468,150.00 | | 478,150.00 | |
| ඉඩම් විකුණුම් තැන්පත් | 1,033,644,303.13 | | 1,010,725,866.80 | |
| | **1,413,070,731.68** | | **1,377,790,108.39** | |

## සටහන (25) උප ආපසු ගෙවන තැන්පතු

| | 2011 | | 2010 | |
|---|---|---|---|---|
| | රු. | ශත | රු. | ශත |
| ටෙන්ඩර් තැන්පත් | 4,294,826.87 | | 3,507,050.69 | |
| ආරක්ෂක තැන්පත් | 3,818,352.56 | | 3,351,308.89 | |
| විවිධ තැන්පත් | 38,112,666.98 | | 40,842,153.30 | |
| අත්කම් නිවාස | 55,336.05 | | 57,596.70 | |
| ආදර්ශ ගම්මාන | - | | 75,935.75 | |
| නාගරික නිවාස වැඩ සටහන | 48,248,049.59 | | 48,062,059.44 | |
| වානිජ ගොඩනැගිලි | 18,694,890.42 | | 19,740,281.59 | |
| සංවර්ධන කටයුතු සඳහා තැන්පතු | 30,561,542.43 | | 30,929,510.95 | |
| 25% උපදේශන සේවා සඳහා තැන්පතු | 3,275,745.79 | | 3,275,745.79 | |
| කුලී තැන්පතු | 2,065,238.63 | | 2,065,238.63 | |
| සැපයුම්කරුවන්ගෙන් 2 1/2 - ආපසු ගෙවීමේ තැන්පතු | 590,000.00 | | 590,000.00 | |
| සින්න කුලී තැන්පත් - ජා.නි.දෙ. | - | | 5,191.00 | |
| ආපසු ගෙවිය යුතු තැන්පතු - සී එච් ජී | 429,827.00 | | 415,827.00 | |
| කුලී පනත යටතේ තැන්පතු | 600,000.00 | | 600,000.00 | |
| නිවාස සමිති තැන්පත් - ජා.නි.දෙ | 1,147,998.75 | | 1,147,998.75 | |
| කුලී නියෝජිත තැන්පතු - නාගරික නිවාස | 528,385.48 | | 384,440.80 | |
| | **152,422,860.55** | | **155,050,339.28** | |

## සටහන (26) වෙන්කිරීම

| | 2011 | | 2010 | |
|---|---|---|---|---|
| | රු. | ශත | රු. | ශත |
| පාරිතෝෂික | 475,101,209.88 | | 446,898,873.08 | |
| විගණන ගාස්තු | 2,691,840.00 | | 2,991,459.00 | |
| ඉඩම් විකුණුම් මත උපලබ්ධි නොවූ ලාබ | - | | 94,816.85 | |
| නිවාස විකුණුම් මත උපලබ්ධි නොවූ ලාබ | - | | 754,357.84 | |
| | **477,793,049.88** | | **450,739,506.77** | |

# ආදායම් වියදම් ගිණුම් පිළිබඳ සටහන්

## සටහන (27) කුලී ආදායම්

| | 2011 | 2010 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| ජා.නි.දෙ නිවාස කුලී | 862,332.60 | 910,238.56 |
| පදිංචි නිවාස | 12,774,499.60 | 8,566,807.61 |
| රජයේ සේවක නිවාස | 3,375,550.48 | 1,868,175.48 |
| වානිජ ගොඩනැගිලි | 32,487,433.30 | 33,008,292.88 |
| බදු කුලී | 8,481,254.53 | 2,704,394.48 |
| සංචාරක බංගලා කුලී | 1,698,720.25 | 2,690,619.67 |
| | **59,679,790.76** | **49,748,528.68** |

## සටහන (28) පොලී ආදායම්

| | 2011 | 2010 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| ආපදා ණය | 5,024,024.20 | 3,792,060.76 |
| වාහන ණය | 6,806.16 | 11,060.01 |
| නිවාස විකුණුම් වාරික මත පොලී | 28,107,425.51 | 26,499,374.70 |
| ඉඩම් විකුණුම් වාරික මත පොලී | 3,251,316.09 | 3,026,075.54 |
| නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාවේ ණය පොලී | 7,911,715.27 | 14,176,464.62 |
| නිවාස දශ ලක්ෂයේ ණය පොලී | 30,170.57 | 3,780.05 |
| නිවාස පහලොස් ලක්ෂයේ ණය පොලී | 30,847.20 | 62,468.19 |
| නව නිවාස මුල්‍ය ක්‍රමය යටතේ ණය පොලී | 395,813.80 | 2,505,180.73 |
| භාණ්ඩාගාර බිල්පත් පොලී | 56,784,060.69 | 33,603,305.05 |
| දිරිපියස ණය මත පොලී | 4,373,751.09 | 4,800,899.37 |
| ගමනැගුම වැඩසටහන මත පොලී | 107,262,799.18 | 104,829,106.60 |
| ජනසෙවන වැඩසටහන මත පොලී I 12%(බැංකු) | 57,180,881.97 | - |
| භාණ්ඩාගාර අරමුදල සහ අභ්‍යන්තර උත්පාදන ණය පොලී 2011 | 63,867,825.75 | - |
| ජනසෙවන වැඩසටහන මත පොලී II 10% (බැංකු) | 29,419,213.54 | - |
| සේවක නිවාස ණය | 8,051,528.30 | 8,613,186.39 |
| ධීවර නිවාස ණය පොලී හා වතු නිවාස ණය පොලී | 7,018,238.97 | 9,844,052.68 |
| ණය වැඩසටහන් | 107,454,481.18 | 128,232,959.67 |
| අනෙකුත් පොලී | 1,578,131.01 | 1,896,265.16 |
| | **487,749,030.48** | **341,896,239.52** |

## සටහන (29) වකු මෙහෙයුම් ආදායම්

| | 2011 | 2010 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| විවිධ ආදායම් | - | 402,765.27 |
| නිවාස ණය සම්බන්ධව සේවා ගාස්තු | 20,430,850.66 | 2,747,798.64 |
| නිවාස පැවරුම් ගාස්තු | 10,283,514.09 | 6,755,836.09 |
| පරිපාලන ගාස්තු | 7,886,262.65 | 1,637,791.93 |
| ලියකියවිලි පොත්පත් සහ වෙනත් දෑ වියදම් | 2,339,166.76 | 765,875.22 |
| ප්‍රයෝජනයට ගත නොහැකි අයිතම් විකුණුම් | 46,337.38 | 496,680.20 |
| පරිශ්‍ර කුලියට දීම | 6,219,008.30 | 5,691,793.50 |
| නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවෙන් හා ඕවීඩීසී ආයතනයෙන් ලැබූ ලාභාංශ | 15,801,000.00 | 14,481,000.00 |
| ආධාර- සහාධිපත්‍ය දේපල ප්‍රතිසංස්කරණය | 84,026,418.70 | - |
| ලී බඩු කුලියටදීම | 56,800.00 | - |
| | **147,089,358.54** | **32,979,540.85** |

## සටහන (30) ආපසු නොගෙවන තැන්පතු

| | 2011 | 2010 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| ටෙන්ඩර් ගාස්තු | 597,557.00 | 118,450.00 |
| | **597,557.00** | **118,450.00** |

## සටහන (31) කාර්යය මණ්ඩල පඩිනඩි

| | 2011 | 2010 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| වැටුප් හා වේතන | 401,140,063.81 | 427,707,472.77 |
| අතිකාල | 27,220,115.89 | 21,353,529.43 |
| වෙනත් දීමනා | 21,123,323.01 | 8,166,046.91 |
| ජීවන වියදම් දීමනා | 126,154,643.18 | 121,154,704.59 |
| දිරි දීමනා | 19,181,909.38 | 10,847,131.62 |
| ප්‍රසාද දීමනා | 1,843,490.27 | 2,098,934.79 |
| සේවක අර්ථසාධක අරමුදලට දායකවීම | 47,568,531.99 | 51,052,657.37 |
| සේවක භාරකාර අරමුදලට දායකවීම | 12,040,687.95 | 12,659,924.07 |
| වන්දි | 2,529,974.32 | 706,975.00 |
| නිවාඩු දීමනා ගෙවීම් | 1,316,113.78 | 867,971.09 |
| පුහුණු හා ශිෂ්‍යත්ව | 350,665.00 | 695,013.24 |
| විවේක නිවාඩු සඳහා මුදල් ගෙවීම | 12,243,166.95 | 12,187,155.16 |
| සාමාජික ගාස්තු ප්‍රතිපූර්ණය | 74,684.00 | 20,491.00 |
| සේවක වෛද්‍ය යෝජනා ක්‍රමය | 6,505,607.79 | 7,873,233.50 |
| සංග්‍රහ වියදම් | 3,324,052.59 | 1,598,233.78 |
| වෛද්‍ය වාර්තා ගාස්තු | 36,971.00 | 15,875.00 |
| පාරිතෝෂික වෙන්කිරීම් | 99,745,609.20 | 40,770,205.35 |
| තොග සමීක්ෂණ මණ්ඩල දීමනා | 151,026.50 | 104,050.00 |
| | **782,550,636.61** | **719,879,604.67** |

## සටහන (32) ගමන් වියදම්

| | 2011 | 2010 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| ගමන් වියදම් - දේශීය | 18,076,523.27 | 12,532,476.27 |
| ගමන් වියදම් - විදේශීය | 1,182,226.55 | 385,095.76 |
| | **19,258,749.82** | **12,917,572.03** |

## සටහන (33) සැපයුම්

| | 2011 රු. ශත | 2010 රු. ශත |
|---|---|---|
| ලිපි ද්‍රව්‍ය හා කාර්යාල අවශ්‍යතා | 21,471,170.86 | 11,572,467.98 |
| මෝටර් වාහන සඳහා ඉන්ධන | 14,676,952.51 | 11,775,580.89 |
| ප්‍රවාහන හා යන්ත්‍ර උපකරණ කුලී | 1,424,195.70 | 475,662.10 |
| සෞඛ්‍ය සනීපාරක්ෂක හා වෙනත් සේවා | 925,944.72 | 918,316.08 |
| මුද්‍රණ ගාස්තු | 1,461,562.12 | 808,498.03 |
| පුවත්පත් සහ සඟරා | 795,716.87 | 768,792.99 |
| නිළඇඳුම් | 165,294.25 | 432,830.69 |
| සුභ සාධක සේවා මගින් තේ සැපයීම | 3,382,206.94 | 3,042,956.61 |
| සුභ සාධන | 339,513.88 | 33,221.00 |
| නාම පුවරු සහ විවෘත කිරීමේ උත්සව | 18,538,509.98 | 3,854,477.74 |
| | **63,181,067.83** | **33,682,804.11** |

## සටහන (34) නඩත්තු වියදම්

| | 2011 රු. ශත | 2010 රු. ශත |
|---|---|---|
| ගොඩනැගිලි සහ ව්‍යුහ | 24,909,961.35 | 16,711,758.83 |
| යන්ත්‍ර උපකරණ සහ කාර්යාල උපකරණ | 4,722,255.82 | 6,068,540.90 |
| මෝටර් රථ | 16,512,597.24 | 11,803,084.37 |
| ලී බඩු | 207,756.00 | 117,376.62 |
| නිවාස යෝජනා ක්‍රම | 24,612,087.58 | 21,969,420.68 |
| සංචාරක බංගලා වියදම් | 4,280,912.33 | 2,848,760.34 |
| සාධිපත්‍ය නවීකරන | 84,026,418.70 | |
| | **159,271,989.02** | **59,518,941.74** |

## සටහන (35) ගිවිසුම්ගත සේවා

| | රු. ශත | රු. ශත |
|---|---|---|
| ටෙන්ඩර් ලියකියවිලි ගාස්තු | 32,100.00 | 33,296.48 |
| මෝටර් රථ කුලී | 3,802,145.86 | 876,290.00 |
| දුරකථන | 7,314,488.37 | 6,312,151.72 |
| විදුලිය හා ජලය | 12,797,006.59 | 11,221,542.02 |
| කාර්යාල ගොඩනැගිලි කුලී | 1,852,343.12 | 2,127,833.96 |
| වරිපනම් | 8,620,264.60 | 5,628,563.37 |
| ප්‍රචාරනය | 3,510,880.90 | 49,233.00 |
| නීති ගාස්තු | 5,600,324.09 | 931,602.82 |
| තැපැල් ගාස්තු | 7,617,444.32 | 5,931,267.96 |
| රක්ෂණය | 2,527,406.45 | 2,507,463.62 |
| බලපත්‍ර ගාස්තු. | 490,200.00 | 405,158.00 |
| තොරතුරු හා ප්‍රචාරක | 11,607,227.18 | 1,907,499.99 |
| | **65,771,831.48** | **37,931,902.94** |

## සටහන (36) මූල්‍ය වියදම්

| | 2011 | 2010 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| විගණන ගාස්තු | 500,000.00 | 1,114,077.29 |
| බැංකු ගාස්තු | 2,221,632.13 | 871,475.68 |
| මුද්දර ගාස්තු | 182,952.30 | 241,909.22 |
| වෙනත් | - | 689,796.59 |
| කුලී නිවැසියන්ට සහන | 5,443,731.24 | 8,723,845.97 |
| ජනාධිපති අරමුදල් පොලී | 29,250,000.00 | 29,250,000.00 |
| භාණ්ඩාගාර ණය පොලී | 109,796.25 | 204,981.25 |
| කොමිස් ගෙවීම් - ණය එකතු කිරීම් | 51,843,873.72 | 36,878,092.25 |
| කොමිස් ගෙවීම් - කුලී එකතු කිරීම් | 4,177,037.43 | 3,044,371.76 |
| එකවර මුදල් ගෙවීම සඳහා ණය හැකියාව වට්ටම් | 8,252.42 | 39,472.19 |
| බොල් සහ අඩමාන ණය | | 98,840,722.79 |
| දඩ හා අධිභාර | 10,522.34 | 27,875.43 |
| පොලී ගෙවීම - කොමර්ෂල් බැංකුවේ දිරිපියස ණය සඳහා | 5,719,427.66 | 6,251,766.81 |
| උපහාර බැංකු ණය පොලී ගෙවීම | 39,157,645.17 | - |
| පොලී ගෙවීම - වෙනත් ණය | 4,696,250.06 | 4,916,287.90 |
| මැනුම් / තක්සේරු වියදම් | 2,704,341.92 | 3,722,742.54 |
| වෙනත් වන්දි | 80,000.00 | - |
| ඩබ් එච් ටී | 2,744,441.89 | - |
| එන් බී ටී | 580,689.48 | 753,870.38 |
| එෆ් එස් එල් | 394,658.05 | 274,792.40 |
| ආර්ථික සේවා ගාස්තු | 4,597,242.79 | 1,371,637.41 |
| හර බදු | 516,006.72 | 851,349.74 |
| වැට් | 9,975,002.85 | 4,834,285.29 |
| නිවාස දේපල උපරීම සමාලෝචන මණ්ඩල වියදම් | 268,195.00 | 316,294.38 |
| දේපල උපරීම තක්සේරු මණ්ඩල වියදම් | 12,750.00 | 11,850.00 |
| | **165,194,449.42** | **203,231,497.27** |

## සටහන (37) වක්‍ර මෙහෙයුම් වියදම්

| | 2011 | 2010 |
|---|---|---|
| | රු. ශත | රු. ශත |
| දිස්ත්‍රික් නිවාස කමිටු වියදම් | 1,373,398.44 | 987,591.00 |
| ප්‍රදර්ශන වියදම් | 6,053,844.33 | 6,793,965.82 |
| සේවා | 219,143.00 | 1,199,022.39 |
| අනවසර පදිංචි කරුවන් ඉවත් කිරීම | 62,116.00 | 181,640.00 |
| නිවාස 100 වැඩ සටහන සඳහා යටිතල පහසුකම් | 237,180.00 | 359,421.74 |
| | **7,945,681.77** | **9,521,640.95** |

## **හිමිකාරත්වය වෙනස්වීමේ ප්‍රකාශය - 2011.12.31 දිනට**

රු.මි

| විස්තරය | ප්‍රාග්ධනය | ප්‍රාග්ධන සංචිත | අයභාර සංචිත | රඳවාගත් ඉපැයීම් | එකතුව |
|---|---|---|---|---|---|
| 2011.01.01 දිනට ශේෂය | 40.000 | 15,466.925 | 227.559 | (11,132.058) | 4,602.426 |
| **එකතු කලා** | | | | | |
| වර්ෂය තුල වෙනස්වීම් | | 981.557 | (227.559) | 166.079 | 920.077 |
| | | | | | - |
| 2011.12.31 දිනට ශේෂය | 40.000 | 16,448.482 | - | (10,965.979) | 5,522.503 |

## ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
## 2011 දෙසැම්බර් 31 දිනට මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය</u>** රු.මි.

| | | |
|---|---|---|
| **ආදායම් බදුවලට පෙර ශුද්ධ ලාභය / අලාභය** | | |
| ජා.නි.ස.අධිකාරිය | (518.293) | |
| ජා.ය.ආයතනය | (7.128) | |
| ඕ.වී.ඩී.සී.සමාගම | 13.292 | (512.129) |
| **ගැලපීම්** | | |
| ක්‍ෂය වෙන්කිරීම් | | |
| ජා.නි.ස.අධිකාරිය | 41.128 | |
| ජා.ය.ආයතනය | 2.751 | |
| ඕ.වී.ඩී.සී.සමාගම | 7.974 | 51.853 |
| | | (460.28) |
| **අඩුවීම්** | | |
| ජාතික යන්ත්‍රෝපකරණ ආයතනයේ ගැලපීම් | 689.37 | |
| ආයෝජන ආදායම් | (64.70) | |
| ලාභාංශ ලැබීම් | (15.80) | |
| ස්ථාවර වත්කම් විකුණුම් ලාභය | (11.38) | |
| | | 597.49 |
| මෙහෙයුම්වලින් ලද ලාභය කාරක ප්‍රාග්ධනයට පෙර | | 137.22 |
| **කාරක ප්‍රාග්ධනයේ වෙනස්වීම්** | | |
| වැඩිවීම්/අඩුවීම් කෙරීගෙන යන වැඩ | 65.01 | |
| වැඩිවීම්/ අඩුවීම් අනෙකුත් ලැබීම් | (507.03) | |
| වැඩිවීම්/ අඩුවීම් ගෙවිය යුතු වියදම් | (292.26) | |
| වැඩිවීම්/ අඩුවීම් වෙන්කිරීම සඳහා | 26.70 | (707.59) |
| **මෙහෙයුම් කටයුතුවලින් මුදල් ඉපැයීම්** | | (570.38) |
| **ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය** | | |
| දිගුකාලීන ආයෝජන | 143.35 | |
| සුළු කොටස් හිමියන් | 1.64 | |
| දේපල පිරියත හා උපකරණ මිලදී ගැනීම් | (64.37) | |
| වැඩිවීම/අඩුවීම සංවර්ධන වත්කම් | (1858.26) | |
| දේපල පිරියත උපකරණ විකිණීමෙන් ලද මුදල් | 140.85 | |
| පොලී ලැබීම් | 64.70 | |
| ලාභාංශ ලැබීම් | 15.80 | |
| පාරිතෝෂික අරමුදල | 0.87 | (1555.43) |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය | | (2125.80) |
| **ආයෝජන ක්‍රියාකාරකම් සඳහා යෙදූ මුදල්** | | |
| ආධාර හා අනෙකුත් ලැබීම් | 742.84 | |
| ණය | 1466.78 | 2209.62 |
| මුදල් සහ මුදල්වලට සමාන ආදේශකයන්ගේ ශුද්ධ වැඩිවීම | | 83.82 |
| 2011.01.01 දිනට මුදල් සහ මුදල්වලට සමාන ආදේශකයන් | | 61.95 |
| 2011.12.31 දිනට මුදල් සහ මුදල්වලට සමාන ආදේශකයන් | | 145.76 |

ටීඑච්/සී/එන්එච්ඩීඒ / 2011/ එෆ්ඒ 2012 දෙසැම්බර් මස 26 දින

සභාපති
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය

**ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සහ එහි පරිපාලිතයේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සහ එහි පරිපාලිතයේ 2011 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1979 අංක 17 දරන නිවාස සංවර්ධන අධිකාරි පනතේ 29.1 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 13 (7) (ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අධිකාරියේ සභාපති වෙත 2012 අගෝස්තු 23 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යයැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනයන් හඳුන්වාදීම හා ක්‍රියාත්මක කිරීම කළමනාකරණයේ වගකීමවේ.

1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීමවලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත්වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම අධිකාරියේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අධිකාරියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරනලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.
මාගේ තත්ත්වාගණනය කල විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි

1.4 **තත්ත්වාගණනය කල විගණන මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මතපදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ

විගණකාධිපති වාර්තාව

## 2 මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කල මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2011 දෙසැම්බර් 31 දිනට ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ සහ එහි පරිපාලිතයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතයවේ.

### 2.1.1 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පරිපාලිත සමාගම වූ සීමාසහිත ඕෂන්වීව් ඩිවලොප්මන්ට් සමාගමේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විගණනය නොකරන ලද මූල්‍ය ප්‍රකාශන පදනම් කරගෙන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශය පිළියෙල කර තිබූ අතර පරිපාලිත සමාගමේ ශුද්ධ වත්කම් ප්‍රමාණය අධිකාරියේ ශුද්ධ වත්කම්වලින් 5% ක් පමණ වී තිබුණි.

(ආ) ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ මුළු කොටස් ප්‍රාග්ධනයෙන් 49% ක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය සතු වුවත් බැංකුවේ කටයුතුවලට ප්‍රමාණවත් බලපෑමක් කිරීමට අධිකාරියට නොහැකිවීම හේතුවෙන් බැංකුවේ අවසන් මූල්‍ය ප්‍රකාශන අධිකාරියේ ගිණුම් සමඟ ඒකාබද්ධ කර නොතිබුණි.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ප්‍රමිති අංක 16 ට අනුව අධිකාරිය සමාලෝචිත වර්ෂය අවසානයට රු.මි.475.10 ක් පාරිතෝෂික වෙනුවෙන් ප්‍රතිපාදන සලසා තිබුණද ප්‍රමිතිය ප්‍රකාරව අනාගතයේදී සිදුවන පාරිතෝෂික ගෙවීම් අවස්ථාවලදී ඒ සඳහා යොදාගැනීමට හැකිවන පරිදි රු.මි.8.841 ක් පමණක් බාහිරව ආයෝජනය කර තිබූ බැවින් මුළු බැරකම් ආවරණය වන ලෙස ආයෝජනයක් කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගිණුම් සටහන් අංක 10 ට අනුව වන්දි ගෙවීමෙන් තොරව සහ නිවාස අරමුණක් වෙනුවෙන් ඉඩම් අත්පත් කරගන්නා විට එම ඉඩමෙහි වෙළඳපොල අගය සහ ඒ වෙනුවෙන් දරන ලද වියදම් ඉඩම් අත්පත් කර ගැනීමේ සංචිත අරමුදලකට මාරු කල යුතු වුවත්, එවැනි සංචිත අරමුදලක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්‍ෂණය විය.

(I) බොහෝ නිවාස යෝජනා ක්‍රමවල තවදුරටත් ඉතිරිවී තිබුණ ඉඩම් කැබලි හා නිවාස යෝජනා ක්‍රම සඳහා ලබාගෙන තිබුණු /පවරාගෙන තිබුණු ඉඩම් හෙක්ටයාර් 943 ක් පමණ තක්සේරු කර ගිණුම් ගතකර නොතිබුණි.

(ii) නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ කොටස් ආයෝජනය මත ලද ප්‍රසාද කොටස්වල නාමික අගය වූ රු 276,500,000 ක් 2002 වර්ෂයේ සිට ගිණුම් ගතකර නොතිබුණි.

(iii) GTZ ව්‍යාපෘතිය යටතේ ලැබී තිබුණු මෝටර් සයිකල් 05 ක හා ඩබල් කැබ් රථයක වටිනාකම ඇස්තමේන්තු කර ගිණුමවලට ගෙන නොතිබුණි.

(iv) වැඩ අවසන් වූ ව්‍යාපෘති 02 කට අදාලව ලැබී තිබුණු රු.මි.43.51 ක මුදල් තවදුරටත් කෙරීගෙන යන වැඩ ගිණුමේ ඉදිරියට ගෙන ගෙන ගොස් තිබුණි.

(v) උතුරු නැගෙනහිර දිස්ත්‍රික් කාර්යාල දෙකෙහි නැති වී ඇති මොටර් සයිකල් 08 ක් හා ජීප් රථයක වටිනාකම පිළිවෙලින් රු.400,000 ක් හා රු.112,864 ක් සඳහා සිදුවූ හානිය වෙනුවෙන් ප්‍රමාණවත් ප්‍රතිපාදනයක් කර නොතිබුණි.

(vi) නිවාස ඉදිකිරීම් පිරිවැය දැරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් සහ පශු සම්පත් මණ්ඩලයෙන් ලැබී තිබුණ රු.මි.10.84 ක මුදල් අදාල කාර්යය අවසන් කර වස 05 ක් ඉක්මවා තිබියදීත් ගිණුම්වල අවශ්‍ය ගැලපීම් නොකර තැන්පතු යටතේ දක්වා තිබුණි.

(vii) සමාලෝචිත වසර තුල රු.මි.2479.59 ක් වූ නිවාස ණය සඳහා අඩුවෙන් කරන ලද බොල් හා අඩමාන ණය වෙන්කිරීම් වටිනාකම රු.මි. 53.74 ක් විය.

2.2.4 **අනුචිත හෙළිදරව් කිරීම්**

සමාලෝචිත වසර තුල මරදාන 797 වත්ත හතරවන අදියරට අදාලව ඉදිකිරීම් අවසන් නිවාසවල නිවාසලාභීන් පදිංචිකර කොන්ත්‍රාත්කරුට රඳවුම් මුදල් නිදහස් කර තිබුණද, රු. 2,886,906 ක ගෙවිය යුතු වියදමක් කෙරීගෙන යන වැඩ ගිණුමේ දක්වා තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් භාරගන්නා ලද වෙනත් ව්‍යාපෘතීන් අතරමගදී දමාගොස් ඇති බැවින් එම ව්‍යාපෘතිවලට අත්තිකාරම් ලෙස ලබාදුන් මුදල් හිලව් කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය යටතේ දක්වා ඇති බව අධිකාරියේ සාමාන්‍යාධිකාරවරයා මා වෙත දන්වා තිබුණි.

2.2.5 **පැහැදිලිනොකල වෙනස්කම්**

සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියෙන් නිවාස සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු අත්තිකාරම් ලෙස නිවාස සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල රු. 8,863 ක් ලෙස දක්වා තිබුණ ද සභාධිපත්‍ය කළමනාකරණ අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ලෙස දක්වා තිබුනේ රු.1,229,974 කි. මේ අනුව රු.1,221,111 ක වෙනසක් නිරීක්ෂණය විය.

2.2.6 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) නාගරික සංවර්ධන අධිකාරිය සහ පරිසර අධිකාරිය මඟින් ලැබිය යුතු ලෙස අධිකාරියේ ගිණුම්වල දක්වා ඇති ණයගැති ශේෂ රු.මිලියන 54.67 ක නිවැරදිතාවය සම්බන්ධයෙන් අදාල ආයතන සමඟ එකඟතාවයකට පත් වී නොතිබුණු අතර නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශයෙන් ලැබිය යුතු රු මිලියන 64.71 ක ණය ශේෂ ප්‍රතිපූර්ණය කිරීමට නොහැකි බව දන්වා තිබුණි. මේ හේතුවෙන් එම ණය මුදල නැවත අයකර ගැනීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුන අතර ඒ සඳහා ප්‍රමාණවත් බොල් ණය ප්‍රතිපාදනයක් කර නොතිබුණි.

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට විවිධ ණය ගැති ශේෂය රු මිලියන 1,623.69 ක් වූ අතර ඒ තුල වර්ෂ 03 ඉක්ම වූ රු.මිලියන 1,356,49 ක් වූ ණයගැති ශේෂ අයකර ගැනීමට අධිකාරිය විසින් ඵලදායී ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි.

(ඇ) 2011 වර්ෂයේදී රු.මිලියන 31.22 ක අඩමාන ණය අධිවෙන්කිරීක් තිබුණු අතර අඩමාන ණය වෙන් කිරීමේ දී ණයගැති වයස් විශ්ලේෂණය සහ ණය අයකර ගැනීමේ හැකියාව පිළිබඳ නිසි අවධානයක් යොමුකර නොමැති බවද නිරීක්ෂණය විය.

2.2.7 **මතභේදයට තුඩුදෙන ගණුදෙනු**
පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජල්තර ව්‍යාපෘතිය යටතේ සාදා නිම කරන ලද රු මිලියන 562.48 ක් වටිනා නිවාස 395 ක් නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ගිවිසුමක් අත්සන් කිරීමකින් තොරව භාර දී තිබුණු අතර මෙම ගණුදෙනුවට අදාල කරුණු පැහැදිලි කරද නොතිබුණි. එමෙන්ම මෙයට අදාල ලාභය වන රු මිලියන 215.89 ක් අධිකාරියේ ගිණුම්වලට ගලපා නොතිබුණි.

(ආ) මට්ටක්කුලිය, කාකදූපත,සීබ්‍රීස් නිවාස යෝජනා ක්‍රමයේ පොදු කටයුතු සඳහා වෙන්කර තිබූ අංක 51 දරන ඉඩම ව්‍යාපාරික කටයුත්තක් සඳහා විකුණා තිබූ අතර එය අධිකාරියේ අරමුණු සමඟ එකඟ නොවුණි.

3. **මූල්‍ය සමාලෝචනය**

3. 1 **මූල්‍ය ප්‍රතිඵල**

මූල්‍ය ප්‍රකාශ අනුව, සමාලෝචිත වර්ෂයේ අධිකාරියේ කටයුතු සහ පරිපාලිත සමාගමේ මූල්‍ය ප්‍රතිඵල ඉකුත් වර්ෂ හතරක් සමඟ සසඳා පහත දැක්වේ.

| ආයතනය | 2011<br>රු මිලියන | 2010<br>රු මිලියන | 2009<br>රු මිලියන | 2008<br>රු මිලියන | 2007<br>රු මිලියන |
|---|---|---|---|---|---|
| අධිකාරියේ මෙහෙයුම් කටයුතුවල ඌනතාවය | (518.29) | (666.73) | (502.66) | (646.74) | (784.75) |
| ඕෂන්වීව් ඩිවලොප්මන්ට් සමාගමේ ලාභය | 11.01 | 9.62 | 12.47 | 15.70 | 26.68 |

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

පසුගිය වර්ෂ 05 තුල අධිකාරිය දිගින් දිගටම විශාල ලෙස පාඩු ලැබීම හේතුවෙන් ශුද්ධ වත්කම් 11% කින් හීන වී තිබු අතර මෙම තත්ත්වය මත අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම අවදානමකට ලක්වී ඇති බව නිරීක්ෂණය විය.

**3.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය**

2010 වර්ෂයේ දී අධිකාරියේ ජංගම අනුපාතය හා ක්ෂණික වත්කම් අනුපාතය පිළිවෙලින් 1: 099 ක් හා 1:1.02ක් වු අතර සමාලෝචිත වර්ෂයේදී එය පිළිවෙලින් 1:0.90 ක් හා 1:0.92 ක් විය. සම්මත අනුපාතය පිළිවෙලින් 2:1 හා 1:1 විය යුතුයී

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්ය සාධනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

අ) ක්‍රියාකාරී සැලසුමට අනුව වසර තුල ඉදිකිරීමට සැලසුම් කරන ලද භෞතික නිවාස ගණන 55,587 ක් වුවද සත්‍ය ඉදිකිරීම් ගණන 14,278 පමණක් වූ බැවින් ඉදිකිරීම් ප්‍රගතිය 26% ක් පමණ වී තිබුණි. කෙසේවුවද 2011 නොවැම්බර් 29 දින අනුමත සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව ඉදිකිරීම් ප්‍රගතිය 46% ක් විය.

ආ) ක්‍රියාකාරී සැලැස්මට අනුව නිවාස ඒකක 3,800 ක් ඉදිකිරීමට සැලසුම් කර තිබුණද සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට එය ඇතුලත් කර නොතිබුණි.

ඇ) "සහශ්‍ර ලංකා" (ආයෝජන ව්‍යාපෘති, රාජ්‍ය පෞද්ගලික දායකත්ව නිවාස) ව්‍යාපෘති යටතේ රු.මි.3,235 ක් වටිනා නිවාස ඒකක 1270 ක් ඉදිකිරීමට සැලසුම් කල ද කිසිදු ඉදිකිරීම් කටයුත්තක් සමාලෝචිත වසර තුල ආරම්භ කර නොතිබුණු අතර 2012 අගොස්තු 31 දිනට ව්‍යාපෘති 03 ක ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති බවට අධිකාරියේ සමානායාධිකාරිවරයා මා වෙත දන්වා තිබුණි.

**4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත කළමනාකරණ අකාර්යක්ෂමතා නිරීක්ෂණය විය.

(අ) පසුගිය විගණකාධිපති වාර්තා මඟින් පෙන්වා දි ඇති පරිදි ඩාර්ලි පාරේ පිහිටි අක්කර 01 යි පර්චස් 26.5 කින් යුත් ඉඩම පෞද්ගලික අංශයේ සහභාගිත්වයෙන් වූ ඒකාබද්ධ ව්‍යාපෘතිය සඳහා යහපත් කළමනාකර පරිචයක් අනුගමනය කර නොතිබීම හේතුවෙන් රු.මි.1,000 ක පමණ ඇස්තමේන්තුගත අලාභයක් අනාවරණය වී තිබුණි. මේ සම්බන්ධයෙන් කැබිනට් මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ නීති උපදේශකයකු හා සම්බන්ධව කරන ලද සාකච්ඡාවකට අනුව රජයේ ඉඩම්වල සින්නක්කර හිමිකම පැවරිමනොකල යුතු වුවත් අදාල සමාගමට අධිකාරිය විසින් සින්නක්කර ඔප්පු ලබා දී ඇති බැවින් මෙම දේපළ නැවත ගැනීමේ පූර්වක්‍රය අයිතිය ලබාදීමටත්, උගස බලපවත්නා කාලය තුලදී දේපළේ අදාල ඔප්පු ලංකාවේ බැංකුවක ඇපකර භාරකරු ලෙස තැන්පත් කිරීමටත් නිර්දේශ කල බවට අධිකාරියේ සාමාන්‍යාධිකාරවරයා මා වෙත දන්වා තිබුණි.

(ආ) නිවාස යෝජනා ඉදිකිරීමට ප්‍රථම අදාල පලාත් පාලන ආයතන මඟින් නිවාස සැලසුම් අනුමත කරවා ගත යුතු වුවද, එලෙස කටයුතු නොකර නිවාස ඉදිකිරීම් කර තිබීම නිසා සමාලෝචිත වසර අවසානය වනවිට, නිවාස යෝජනා ක්‍රම 141 ක නිවාස 3509 කට අදාල අනුකූලතා සහතික ලබාගැනීමේ ගැටළු පැන නැගී තිබුණි. මින් නිවාස ඒකක 3357 කට පමණක් සැලසුම් අනුමැතිය සඳහා කැබිනට් පත්‍රිකාවක් සකස්කර 2011 අගෝස්තු 12 දින අනුමැතිය සඳහා යවා තිබුණද සමාලෝචිත වසර අවසාන වනවිටත් අනුමැතිය ලැබී නොතිබුණි. මෙම තත්ත්ව මත නිවාස යෝජනා ක්‍රමයන්ට අදාල නිවාස, නිවාස හිමියන්ට පැවරීමක් සිදු කර කළමනාකරණ සංස්ථා පිහිටුවීමට නොහැකි වී තිබුණු බැවින් එම නිවාස යෝජනා ක්‍රමවල නඩත්තු කටයුතු තවදුරටත් අධිකාරිය මඟින් සිදුකර තිබුණි. ඒ වෙනුවෙන් රු.මිලියන 24.61 ක් නඩත්තු වියදම් සඳහා සහ රු.මිලියන 84.03 ක් අළුත්වැඩියා කටයුතු සඳහා සමාලෝචිත වසර තුල වැය කර තිබුණි.

(ඇ) දිවයිනේ දිස්ත්‍රික් 19 ක අධිකාරිය සතු දේපලවල අනවසර පදිංචිකරුවන් විසින් කරන ලද ඉදිකිරීම් සහිත ඉඩම් අක්කර 229.4 ක් සමාලෝචිත වසර අවසානයට හඳුනා ගෙන තිබූ අතර එම ප්‍රමාණයෙන් පර්චස් 10 ට වැඩි ප්‍රමාණයක් භුක්ති විඳින ඉඩම් ප්‍රමාණය අක්කර 187.7 ක් විය. පර්චස් 10 ට අඩු නියමානුකූල කල හැකි ඉඩම් ප්‍රමාණය අක්කර 22.6 ක්වූ අතර අක්කර 19.1 ක් වගා කටයුතු සඳහාද භාවිතා කර තිබුණි. මේ සම්බන්ධයෙන් සාමාන්‍යාධිකාරිවරයාගේ 1998 දෙසැම්බර් 17 දිනැති 99/2 චක්‍රලේඛය ප්‍රකාරව නියමානුකූල කලහැකි අනවසර පදිංචිකරුවන් නියමානුකූල කිරීමටත්, අනෙකුත් අනවසරලාභීන් නියමානුකූල කිරීමේ වැඩ පිළිවෙලක් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇති බවටත් අධිකාරියේ සාමාන්‍යාධිකාරවරයා මා වෙත දන්වා එවා තිබුණී

(ඈ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පවුල් 526 ක් සඳහා සූර්යබල පද්ධති ලබාගැනීම සඳහා1989-1994 වසරවලදී ලබාදී තිබූ ණය මුදලේ ශේෂය 2011 දෙසැම්බර් 31 දිනට රු.4,428,206 ක් වූ අතර සමාලෝචිත වර්ෂය තුලදී කිසිදු මුදලක් අයවී නොතිබුණි. මෙම ණය අයකර ගැනීම සඳහා නිශ්චිත වැඩ පිළිවෙලක්ද ක්‍රියාත්මක කර නොතිබුණි.

(ඉ) අධිකාරිය සතු ලිබර්ටි ප්ලාසා සංචාරක බංගලාව පුද්ගලික ආයතනයකට විකිණීමේදී රජයේ තක්සේරුකරුගේ වටිනාකම ලබාගෙන නොතිබුණු අතර අධිකාරියේ තක්සේරුකරුගේ තක්සේරුව පමණක් ලබාගෙන තිබුණි. නමුත් මෙම දේපළවලට පසුව ලබාගත් රජයේ තක්සේරුකරුගේ තක්සේරුව රු 11,.520,000 ක් වුවද, පුද්ගලික ආයතනයක් විසින් ගෙවූ මුදල රු.9,000,000 ක් විය. මේ සම්බන්ධයෙන් 2011 ඔක්තෝබර් 14 දිනයන්හි පැවැත්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාකච්ඡාවට ලක්වූ අතර එම කාරක සභා රැස්වීම් නියෝගයට අනුව මාස 03 ක් ඇතුලත වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දන්වා තිබුණද 2012 මැයි 31 දින වන විටත් එම නියෝගයට අනුව කටයුතු කර නොතිබුණි

(ඊ) නාරාහේන්පිට කිරිමණ්ඩල මාවතේ පිහිටි අධිකාරිය සතු ඉඩම රජයේ තක්සේරුවකින් තොරව රු.මි.75 කට එකෝ නිවාස ව්‍යාපෘතියකට 2003 වර්ෂයේදි විකුණා තිබුණි. මේ සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් ලැබී නොතිබුණු අතර රජයේ ප්‍රධාන තක්සේරුකරුගේ 2007පෙබරවාරි 10 දිනැති තක්සේරු වටිනාකම රු.මි.121.5 ක් විය. මේ සම්බන්ධයෙන් 2011 ඔක්තෝබර් 14 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා විසින් සවිස්තරාත්මක වාර්තාවක් ඉදිරිපත් කිරීමට නියෝග කර තිබුණ ද 2012 මැයි 31 දින වනවිටත් එලෙස කටයුතු කර නොතිබුණි.

(උ) මහනුවර මහ නගර සභාව සතු ඉඩමක අධිකාරිය විසින් ඉදිකර තිබූ නිවාස 32 කින් සමන්විත මහයියාව නිවාස ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 20 ක ඉදිකිරීම් පිරිවැයක් දරාතිබුණද ඊට අදාල මුදල් මහනුවර මහ නගර සභාවෙන් සමාලෝචිත වසර අවසාන වනවිටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් මෙහෙයුම් අකාර්යක්ෂමතා නිරීක්ෂණය විය.

(අ) අධිකාරියට අයත් හෝමාගම ජල්තර සහ දියවන්නා ගාර්ඩින්ස් යන නිවාස යෝජනා ක්‍රමවල නිවාස 03 ක් නිවාස බැහැර කිරීමේ ක්‍රමවේදයෙන් බැහැරව කිසිදු ගිවිසුමකින් තොරව පුද්ගලයින් තිදෙනෙකු වෙත කිසිදු අත්තිකාරම් මුදලක් ලබාගැනීමෙන් තොරව පදිංචිය සඳහා නිදහස් කර තිබුණි.

(ආ) මහනුවර දිස්ත්‍රික් කාර්යාලය විසින ගලහ නිවාස යෝජනා ක්‍රමය සඳහා 1998 වර්ෂයේ සිට 2001 වර්ෂය දක්වා රු.මිලියන 2.67 ක් වියදම් කර නිවාස 16 ක් ඉදිකර තිබු අතර සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් එම නිවාසවල වැඩ අවසන් කර නොතිබුණි.

(ඇ) වතු නිවාස වැඩ සටහන සඳහා ජාතිය ගොඩනැගීමේ සහ වතු යටිතල පහසුකම් අමාත්‍යාංශයෙන් 2008 වසර තුල ලද රු.මිලියන 1.355 ක මුදලක්, මිල්ලකන්ද සහ ප්‍රොසෙස්ටර් යන වතු ව්‍යාපෘති සඳහා වැවිලි මානව සංවර්ධන භාරය වෙත මුදාහැර ඇති නමුත් අදාල ව්‍යාපෘති ක්‍රියාත්මක වී නොතිබුණු අතර රු.599,000 ක් තවදුරටත් අයවීමට තිබුණි.

(ඈ) නිවාස අරමුණු සඳහා රාජ්‍ය හා පෞද්ගලික අංශයෙන් පවරාගත් / පවරා ගැනීමට තිබුණු ඉඩම් දලවශයෙන් හෙක්ටයාර් 5,931 ක් පමණ වූ අතර සමාලෝචිත වසර අවසාන වන විටත් මෙම ඉඩම්වලට අදාල ඉඩම් ලේඛණය යාවත්කාලීන කර නොතිබුණි. බොහෝ ඉඩම් ප්‍රමාණයක අනවසර පදිංචිවීම් ඇති බවට ද නිරීක්ෂණය විය. උතුර හා නැගෙනහිර පලාත්වල පැවති යුධ වාතාවරණය හේතුවෙන් ඉඩම් නිශ්චිතව හඳුනාගැනීමට නොහැකි වී ඇති බැවින් එම තොරතුරු මෙම වාර්තාවේ ඇතුලත් වී නොමැති බව සාමාන්‍යාධිකාරවරයා දැනුම් දී ඇත.

(ඉ) 1979 - 2010 කාල පරිච්ඡේදය තුල පවරාගත් ඉඩම්වලට අදාල වන්දි මුදල් පරිපාලනමය ප්‍රමාදයන් මත කාලීනව ගෙවීමට කටයුතු නොකිරීම හේතුවෙන් පෞද්ගලික ඉඩම් වෙනුවෙන් 2011 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වන්දි වටිනාකම රු.මිලියන 93.12 ක් වූ අතර ඒ වෙනුවෙන් රු.මිලියන 65.16 ක පොලී මුදලක් ගෙවීමටද අධිකාරියට සිදුවී තිබුණි. එමෙන්ම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව මඟින් පවරා ගත් ඉඩම් වෙනුවෙන් රු.මිලියන 33.60 ක් තවදුරටත් ගෙවිය යුතුව තිබුණි

(ඊ) බොහොමයක් පවරාගත් ඉඩම්වල පවරාගත් දිනට වසර ගණනාවකට පසුව එළඹෙන වසරකට අදාලව ගණනය කරන ලද තක්සේරුව ගෙවීමට සිදුවීම මත අධිකාරියට විශාල අලාභයක් සිදුවී ඇති අතර එම තක්සේරු මුදල ගෙවීමට ද නොහැකි වී තිබුණි.

උදාහරණ :

| ඉඩමේ නම | පවරාගත් වසර | තක්සේරු කල වසර | තක්සේරු වටිනාකම රු |
|---|---|---|---|
| කුරක්කනේ වත්ත | 1995 | 1999 | 2,000,000 |
| ස්වශක්තිගම | 1981 | 1999 | 1.850,000 |

(උ) 2003,2004 සහ 2005 වර්ෂවලට අධිකාරිය විසින් වැඩිපුර ගෙවන ලද රු. 14,381,122 ක වැට් බදු මුදල් නැවත අයකර ගැනීමට හෝ හිලව් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඌ) 2011 ජූනි 03 දිනැති දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ ලිපියට අනුව 2009 සහ 2010 වර්ෂයට අදාල හිඟ වටුප් බදු මුදල රු.24,775,876 ක් හා ඊට අදාල දඩ මුදල රු.3,251,381 ක් වූ අතර එම හිඟ බදු 2012 ජූනි 15 දින දක්වා ද නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

**4.4 නිවාස ණය පාලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසානයට ගිණුම් අනුව නිවාස ණයවැඩ සටහනේ රු මිලියන 2,479.58 ක ණයගැති ශේෂයක් හා හා රු මිලියන 4,734.80 ක ප්‍රාග්ධන ශේෂයක් පැවති අතර, ඊට අනුරූපී ව ඉකුත් වර්ෂය අවසානයට රු මිලියන 2,647.34 ක හා රු මිලියන 2,558.3 ක ශේෂ පැවතිණි.

(ආ) අධිකාරිය විසින් අයවැයගත අයකිරීම් ප්‍රමාණය තීරණය කිරීමේ දී සැලකිල්ලට භාජනය කර ඇත්තේ මුළු ණයගැති ශේෂයෙන් 50.78% ක් වන ණයගැති සංඛ්‍යාව බැවින් එය ණය කළමනාකරණයේ දුර්වලතාවයක් ලෙස නිරීක්ෂණය විය.

**4.5 ආර්ථික නොවූ ගණුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරිය ආශ්‍රිත සමාගමක රු.මිලියන 5 ක් ආයෝජනය කර වර්ෂ 10 ක් ගතවී තිබුණ නමුත් එම ආයෝජන වලින් ලාභාංශ නිකුත් නොකිරීම නිසා කිසිදු ප්‍රතිලාභයක් අධිකාරියට ලැබී නොතිබුණි.

(ආ) ජනාධිපති අරමුදලින් 1991 වර්ෂයේදී රු.මි.250 ක ණය මුදලක් වාර්ෂිකව 15% ක පොලියක් සහිතව ආපසු ගෙවීමට එකඟවී ලබාගෙන තිබුණි. ඊට අදාල වාරික සහ පොලී නිසියාකාරව ගෙවා නොතිබූ අතර සමාලෝචිත වසර අවසානය දක්වා ගෙවා ඇති ප්‍රාග්ධන ශේෂය රු.මිලියන 55 ක් පමණක් විය. ඒ අනුව 2011 දෙසැම්බර් 31 දිනට ණය මුදල සඳහා රු.මිලියන 195 ක ප්‍රාග්ධන ශේෂයක් ගෙවිය යුතුව තිබූ අතර ගෙවිය යුතු ණය පොලිය රු.මිලියන 228.16 ක් විය. එබැවින් ජනාධිපති අරමුදල විසින් ලබාගෙන ඇති ණය සඳහා ඉතා ඉහල පොලී ප්‍රතිශතයක් ගෙවන නමුත් එම පොලී ප්‍රතිශතය අඩුකර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

(ඇ) නාගරික සංවර්ධන අධිකාරියට අයත් ඉඩමක ඔරුගොඩවත්ත ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම සඳහා රු.මිලියන 39.9 ක් 2005 වසරේදී අධිකාරිය විසින් වියදම් කිරීමෙන් පසුව ඉදිකිරීම් කටයුතු අතහැර දමා තිබුණ අතර මෙම ඉඩම 2006 මාර්තු මස වන විට රීල් එස්ටේට් පුද්ගලික සමාගම විසින් නිවාස සංකීර්ණය ඉදිකිරීමට අවශ්‍ය මූලික කටයුතු කර තිබුණ ද මේ වන විට එම ව්‍යාපෘතියේ කටයුතුද අත්හැර දමා තිබුණි. මෙම සංකීර්ණය සඳහා අධිකාරිය විසින් දරන ලද ඉහත මුදල ආපසු ලබාගැනීම සඳහා අදාල සමාගම නාගරික සංවර්ධන අධිකාරිය සමඟ සාකච්ඡා කර එකඟතාවයකට පැමිණ ඇතත් සමාලෝචිත වසර අවසානය වන විටත් නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම මුදල් ගෙවා නොතිබුණි.

(ඈ) අධිකාරිය විසින් සමාලෝචිත වසර තුල කුලී ආදායම් වශයෙන් රු.මිලියන 45.34 ක් උපයාගෙන තිබුණ අතර නිවාස යෝජනා ක්‍රම කළමනාකරණ සංස්ථාවලට නොපැවරීම හේතුවෙන් එම ආදායමෙන් රු.මිලියන 24.61 ක් නඩත්තු වියදම් ලෙස දරා තිබුණි

(ඉ) කොටසක් ඉදිකර විවිධ හේතූන් මත අතහැර දමා තිබුණු නිවාස ක්‍රම 02 ක වියදම වූ රු.මිලියන 43 ක් කෙරී ගෙන යන වැඩ ලෙස ගිණුම් ගතකර තිබුණි.

(ඊ) ගාල්ල දිස්ත්‍රික් කාර්යාලය සඳහා ගොඩනැගිලි ඉදිකිරීම් වියදම් ලෙස රු.1,106,176 ක මුදලක් කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි. නමුත් එම දිස්ත්‍රික් කාර්යාලයේ ඉදිකිරීම් අතර මග නවතා දමා තිබුණි.

**4.6. හඳුනා ගන්නා ලද පාඩු**

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) යාපනය දිස්ත්‍රික් කාර්යාලය විසින් සමුපකාර ණය දෙන සමිති නිවාස ණය ක්‍රමය (ටීසීසීඑස්) යටතේ ලබාදුන් රු. 5,965,000 ක් වටිනා නිවාස ණය 1,468 ක ලිපිගොනු අස්ථානගතවීම හේතුවෙන් එම ණය මුදල් අයකර ගැනීමට අධිකාරියට නොහැකි වී තිබුණි.

මේ සම්බන්ධයෙන් අධිකාරිය ප්‍රමාණවත් නීතිමය පියවර ද ගෙන නොතිබුණි. ලිපිගොනු අස්ථානගත වී ඇති බැවින් නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකි වී ඇති බව සාමාන්‍යාධිකාරිවරයා දැනුම් දී ඇත.

(ආ) නිවාස සංවර්ධන අධිකාරි ගොඩනැගිල්ලේ මහල් කිහිපයක් නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට කුලියට දී ඇති අතර 2007 මාර්තු 02 දිනට පිළියෙල කර තිබූ බදු කුලී තක්සේරුව අනුව වූ රේටයන් කිසිම හේතුවක් නොදක්වා 2008 ජනවාරි 01 දින පිළියෙල කර තිබූ තක්සේරුව මඟින් අඩුකිරීම නිසා සමාලෝචිත වසර අවසානයට රු.18,083,200 ක සමුච්චිත බදු කුලී ආදායමක් අහිමි වී තිබුණි.

(ඇ) අවිස්සාවේල්ල මාණික්කවත්ත නිවාස ව්‍යාපෘතිය සඳහා 2007 වසර අවසන් වන විට රු මි. 76.07 ක් වියදම් කර තිබුණ අතර වැඩ අවසන් නොකල නිවාස 75 ක ඉදිකිරීම් සම්පූර්ණ කර, විකිණීම සඳහා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට භාර දී තිබුණි. මේ සඳහා ගිවිසුමකට එළඹ නොතිබුණ අතර සමාලෝචිත වසර අවසානවන විට මූල්‍ය සංස්ථා බැංකුව විසින් රු.මි. 43.925 ක් ගෙවා තිබුණි. එබැවින් මෙම නිවාස ව්‍යාපෘතියෙන් රු.මි.32.14 ක පාඩුවක් නිරීක්ෂණය විය.

**4.7 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පෙර විකුණුම් පදනම යටතේ නිවාස විකිණීමේ දී නිවාස සැලසුම් කරන අවස්ථාවේදීම විකිණීම ආරම්භ කලයුතු අතර ඊට ප්‍රමාණවත් පරිදි මුදල් නිවාස ගැණුම්කරුගෙන් අයකර ගත යුතු නමුත් 117 වත්ත, ඇල්විටිගල මාවත (IV අදියර) නිවාස 08 හි සැලසුම් අවස්ථාවේ දී නිවාස ඉල්ලුම්කරුවන්ගෙන් අධිකාරිය වෙත ලැබුණු මුදල නිවාස වටිනාකමින් 1% ටත් වඩා අඩු අගයක් විය. විදේශ අමාත්‍යාංශයට භාර දී තිබූ නිවාස 04 ක් සඳහා රු.මිලියන 4.97 ක් ලැබීමට නියමිතව තිබූ අතර රු.මිලියන 15.2 ක් වටිනා නිවාස 02 ක් රු. 50,000 ක් හා රු.1,000,000 ක් අත්තිකාරම් මුදල් ලබාගෙන වෙන්කර තිබූ නමුත් ගිවිසුම්වලට එළඹ නොතිබුණ අතර වසර 02 කට වැඩි කාලයක් තිස්සේ ඉතිරි මුදල් අයකර ගැනීමකින් තොරව පැවතුණි.

(ආ) සහස්‍ර ලංකා නිවාස ව්‍යාපෘතිය මඟින් රු.මිලියන 100 ක ඇස්තමේන්තුවකට යටත්ව නිවාස 770 ක් ඉදිකිරීම සඳහා සැලසුම් කර තිබුණ ද මින් නිවාස 04 ක් ඉදිකිරීමට යෝජිත එක් නිවාස ව්‍යාපෘතියක් හා 2007 වර්ෂයේ ඉදිකිරීම් ආරම්භ කර කොන්ත්‍රාත්කරු විසින් අතහැර දමාගිය යක්කල සියනෑ උයනේ අඩක් නිමකල නිවාස 05 ක් නැවත සකස් කිරීමට පමණක් කටයුතු කර තිබුණි. සමාලෝචිත වසර අවසාන වන විට එහි භෞතික ප්‍රගතිය 5% - 35% ත් අතර විය.

(ඇ) අධිකාරිය සතුව පවතින සහාධිපත්‍ය දේපළ අළුත් වැඩියා කිරීම සඳහා ඉදිරිපත් කරන ලද රු.මිලියන 225 ඇස්තමේන්තුවක් යටතේ රු.මිලියන 230 ක් සමාලෝචිත වසර තුල භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු අතර මින් රු.මිලියන 76.54 ක් සමාලෝචිත වර්ෂයේදී වැයකර තිබුණි. මෙම ව්‍යාපෘතිය යටතේ මාළිගාවත්ත නිවාස ව්‍යාපෘතියේ නවීකරණ කටයුතු 2011 අප්‍රේල් 05 දින ආරම්භ කර 2012 අප්‍රේල් 12 දින නිම කිරීමට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත කොන්ත්‍රාත්තුව භාර දී තිබුණ ද 2012 ජූනි 15 විගණන දින වන විටත් අදාල නවීකරණ කටයුතු අවසන් කර නොතිබුණි.

4.8 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් මණ්ඩලයේ සම්පත්

අංක පීඊඩී/12 දරන හා 2003 ජූනි 2 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.4 ඡේදයේ විධානයන්ට පටහැනිව සමාලෝචිත වර්ෂය අවසානයට වෙනත් ආයතන වෙත මුදාහරින ලද නිලධාරීන් / සේවකයින් 14 දෙනෙක් වෙත ගෙවා තිබුණ වැටුප රු.මි.3.42 ක් විය. රේබීය අමාත්‍යාංශය වෙත වාහන 07 ක්ද රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට වාහන 05 ක් ද ලබා දී තිබුණි.

4.9 කාර්‍යය මණ්ඩල පරිපාලනය

2011 දෙසැම්බර් 31 දිනට

| තනතුරු නාමය | අනුමත කාර්ය මණ්ඩලය | තථ්‍ය කාර්ය මණ්ඩලය | අතිරික්ත සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ විධායක | 17 | 07 | - | 10 |
| මධ්‍ය මට්ටමේ කළමනාකරණ | 97 | 67 | - | 30 |
| කණිෂ්ඨ මට්ටමේ කළමනාකරණ | 143 | 94 | - | 49 |
| කළමනාකරණ සහකාර | 913 | 1271 | 358 | - |
| ප්‍රාථමික | 206 | 409 | 203 | - |
| එකතුව | 1376 | 1848 | 561 | 89 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අධිකාරියේ මානව සම්පත් සැලැස්මට අනුව අනුමත කාර්ය මණ්ඩලය 2493 ක් ලෙස සඳහන් වුවද කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 2010 ජූලි 01 දින අනුමත කර තිබූ කාර්ය මණ්ඩලය 1376 ක් විය.

(ආ) 2011 දෙසැම්බර් 31 දිනට සත්‍ය කාර්ය මණ්ඩලය 1848 ක් වූ බැවින් අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා සේවකයින් 561 ක් සිටින බවට නිරීක්ෂණය විය. තවද, මෙම අතිරික්ත කාර්‍යය මණ්ඩලය තුල කොන්ත්‍රාත් හා දෛනික දීමනා ගෙවීමේ පදනම මත බඳවාගත් නිලධාරීන් 86 ක් සහ 2012 වසරේ මැයි 31 දින දක්වා බඳවාගත් නිලධාරීන් 161 ක් ද ඇතුලත්ව තිබූ අතර එම මුළු සේවකයන් සඳහා රු.16,730,328 ක් මූලික වැටුප් වශයෙන් අධිකාරිය විසින් ගෙවා තිබුණි.

(ඇ) අංක PED/12 දරන 2003 ජූනි 03 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 වගන්තියට පටහැනිව නිලධාරීන් 18 දෙනෙකු මාස 03 ඉක්මවා මාස 01 සිට වසර 09 දක්වා කාලයක් වැඩ බැලීමේ තනතුරුවල රඳවා තිබුණි.

5. ගිණුම්කටයුතු භාවය සහ යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

අධිකාරිය විසින් 2011-2015කාල පරිච්ඡේදය සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙල කරතිබුණද 2007 දෙසැම්බර් 18 දිනැති PED/47 දරණ චක්‍රලේඛයෙන් සංශෝධිත 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරණ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය අනුව ;

(i) සංයුක්ත සැලැස්මෙහි කාර්යයන් ක්‍රියාකාරී සැලැස්ම හා අයවැය ලේඛනය අතර සම්බන්ධතාවයන් ගොඩනැගෙන ආකාරය දක්වා නොතිබුණි.

(ii) පසුගිය වර්ෂ 03 මෙහෙයුම් කටයුතු සමාලෝචනය කර ඉදිරිපත් කිරීමක් සිදුකොට නොතිබුණි.

(iii) ඒ ඒ වර්ෂ අවසානයට සංයුක්ත සැලැස්මේ කාර්‍යයන් ඉටු කිරීම පිළිබඳ ප්‍රගතිය හා ක්‍රියාත්මක නොවුණු හා මන්දගාමී අංශ පිළිබඳ ඇගයීම් කර ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාවක් පිළියෙල කර නොතිබුණු අතර අධ්‍යක්ෂ මණ්ඩලයේ අවධානයටද ලක් කර නොතිබුණි.

5.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(I) ඇතැම් දිස්ත්‍රික් කාර්යාල වර්ෂ කිහිපයක් තුල විගණනයට භාජනය කර නොතිබුණි.

(ii) වාර්ෂික විගණන වැඩ සටහන තුල ඇතුලත් කාර්ය භාරයන් තුල කාර්‍යය සාධන විගණනයට ප්‍රමාණවත් අවධානයක් යොමුව නොතිබුණි.

**5.3 අයවැය ලේඛනමය පාලනය**

අධිකාරිය විසින් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව පිළිවෙලින් රු මිලියන 723.96 ක් හා රු.මිලියන 1172.78 ක තථ්‍ය ආදායම හා වියදම සහ රු.මිලියන 929.55 හා රු.මිලියන 1,192.71 ක අයවැයගත සංඛ්‍යා සමඟ සැසඳීමේ දී ආදායම රු.මිලියන 205.59 කින් හා වියදම රු.මිලියන 19.93 ක වෙනස්කම් නිරීක්ෂණය විය. මේ අනුව අයවැය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගත් බවක් නිරීක්ෂණය නොවීය.

**6. පද්ධති හා පාලන**

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු පිලිබඳව වරින්වර අධිකාරියේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) ණය ලබාදීම
(ආ) කුවිතාන්සි පොත්
(ඇ) ගබඩා
(ඈ) කොන්ත්‍රාත්
(ඉ) අත්තිකාරම්
(ඊ) සේවක මණ්ඩල
(උ) බැංකු මුදල්
(ඌ) වැටුප් බදු ගණනය

එච් ජේ එස් සමරවීර
විගණකාධිපති